## මාසික මහ සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2025.10.08 |
| වේලාව | :- | පෙ.ව. 10.00 |

### සහභාගිත්වය

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
23. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
24. පී.ජී.මල්ලිකා මැතිතුමිය
25. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
26. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
27. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
28. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
29. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
30. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
31. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
32. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
33. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
34. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
35. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
36. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
37. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

### නිලධාරී සහභාගිත්වය

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

### ආගම සිහිකිරීම

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ). I) 2025.09.02 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරීම.**

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.09.02 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.09.02 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

සංශෝධන

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාව පටන් ගැනිමෙන් පසු මම බිම ඉඳගත්තා ඒ ගැන සඳහනක් නැත. හරි හෝ වැරදි වේවා! ඒක වැරදි වෙන්න පුළුවන්. හරි දෙයක් වෙන්නත් පුළුවන්. මම හිතුවා මේ සභාවේදී ප්‍රකාශයක් කරයි කියලා. වාර්තාවේ නැත.ගරු සභාපතිතුමා නැති වෙනකොට ඔබතුමා ඒකට ප්‍රකාශයක් කරන්න ඕන.අපි ඔක්කොම කියලා යනවා. හැබැයි ගත්ත ක්‍රියාමාර්ගයක් සඳහන් වෙලා නැත.ඒ එක්කම මට කියන්නට තිබෙනවා.
පිටු අංක 03 හි සඳහන් මම දෙවැනි පිටුව හා තුන්වැනි පිටුව සම්බන්ධ කරන විට සම්බන්ධතාවයක් නැති බව සඳහන් කළා.හැබැයි ඒකට සභාපතිතුමා පිළිතුරක් දුන්නේ නැත.සභා ලේකම් නොවේ සභා වාර්තා ඉදිරිපත් කරන්න සභාපතිතුමා ඒ හින්දා ඒකට සභාපතිතුමා කිසිම ප්‍රකාශයක් කරේ නැත.යනුවෙන් පවසන ලදි.

පිටු අංක 10 හි සඳහන් මාර්ගය නඩුවක් සම්බන්ධයෙන් කතා කළා. මම එතැනදී මතක් කළා සභාවට කරුණාරත්න දිසානායක මාවත ඒකෙ තිබෙන්නේ නඩුව ලෙස එය රත්නායක දිසානායක මාවත යනුවෙන් සඳහන් වී ඇත.එය කරුණාරත්න දිසානායක මාවත ලෙස නිවැරදි විය යුතුය. කරුණාරත්න දිසානායක මාවතේ කැලුම් කියන පුද්ගලයා නඩුව දමලා තිබෙනවා.එම නඩුව දැන් නතර වෙලා තිබෙන්නේ.ඊළඟට අපට නඩුව දැම්මා රාජපක්ෂ නෝනා ඒකත් මම කීවා. මේකෙ තිබෙන විදිහට කොටදෙණිය දුම්රිය ස්ථානයට යන තැන නඩුව දමා ඇත.ලෙස සටහන් වී ඇත.එය කොටදෙණිය දුම්රිය ස්ථානය නොව රඹුක්කන දුම්රිය ස්ථානය ලෙස නිවැරදි විය යුතුය. මම පැවසුවේ.තෝමස් සිල්වා මාවත පටු වෙලා තිබෙනවා.අග කොටස පාර හදලා සිල්වා මාවතේ පාර සකස් කිරීමට සභාවේ ඉඩනුත් ලබා දී තිබෙනවා යනුවෙන් ප්‍රකාශ කළා.කැන්ඩි ස්ටෝර්ස් මුදලාලි එයා එක්ක මම කතා කළා කීවා. එම මුදලාලි බැම්ම බැඳලා දෙනවා නම් බැම්ම කඩලා ඉඩ දෙනවා කීවා.එහෙම තමා මම එදා කීවේ. මේකේ සටහන් වී තිබෙන්නේ රත්නායක දිසානායක මාවත කොටදෙණිය දුම්රිය ස්ථානයට යන තැන නඩු දමා ඇත.බැම්ම කඩලා දෙන්නම් කියලා කැන්ඩි ස්ටෝර්ස් එකේ මුදලාලි පැවසුවා හැබැයි නඩුවත් තිබෙනවා වැඩක් වෙලා නැති බවත්, ඒක නිසා සභාව මැදිහත් වෙලා මේ නඩුවේ තිබෙන ඒවා ඉවත් කර ගැනිමට කටයුතු කරමු. යනුවෙන් සංශෝධන යටතේ පැවසූ බවට ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

වාර්තාවේ 38 - 39 - 40 යන එකට ඔබතුමාගේ අවධානය යොමු කිරීමට කැමතියි.ගරු සභාපතිතුමනි, 38 හි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමාර ධර්මසේන මතිතුමා විසින් යොමුව අංක 817 කියලා සටහන් වෙලා තිබෙනවා. ඒකේ දි ගෙවීමක්,වැය ශීර්ෂයක් නැත. 817 ට නොව 838 ගෙවීමක් තිබෙනවා. ඒකෙදි අවසායේ සාකච්ඡා වුණ කරුණු අනුව අවසානයේ තීරණය වෙලා තිබෙනවා.ගරු සභාපතිතුමනි,40 වැනි පිටුවේ අදාළ යෝජනාව ඒකමතිකව සම්මත විය කියලා. ඒකෙදි සාකච්ඡා වුණ දේවල් එතැන සඳහන් වෙන්න ඕනේ.ඒ ගෙවීම සංග්‍රහ වියදමකි.මෙතැනට එන්නට ඕන අදාළ යෝජනාව 838 ගෙවීමට එකඟ විය යුතුයි. මේකේ අපි පැවසූ දේවල් හා ගෙවීමට අදාළ එකයි ඔක්කොම තමයි මේකේ දී අදාළ යෝජනාව ඒකමතිකව සම්මත වෙලා තිබෙනවා කියන්නේ. එතකොට අපි පාරට විරුද්ධව කතා කළා.අපි ගෙවීමට විරුද්ධ නැත.එතැන 40 පිටුවේ සඳහන් වෙලා තිබෙන්නේ.අදාළ යෝජනාව ඒකමතිකව සම්මත වුණා කියලා.යනුවෙන් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අර කාරණයට එකඟ නැති බවට ද ප්‍රකාශ කරන්නේ.යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ඔබතුමාගේ අවධානය යොමු කරන්න ලෙස ඉල්ලා සිටිමට කැමතියි. 45 පිටුවෙහි මගේ යෝජනාව සභා ගත කරන වෙලාවේ විනාඩි කිහිපයක් නිශ්ශබ්දතාවයෙන් පසු වුණා. එම යෝජනා ස්ථිර කරපු ලයනල් මන්ත්‍රීවරයාගේ නම සඳහන් වී නැත.මේ වාර්තාව කතා කරලා අවසානයේ තීරණය වෙලා තිබෙනවා අදාළ යෝජනාව ඒකමතිකව සම්මත වුණා කියලා.යෝජනාව ස්ථිර වුණේ නැත්නම් සභාව ඒකමතිකව සම්මත වෙන්නේ නොහැකිය.එකේදි මම සඳහන් කරා ඡන්දයක් විමසමු කියලා ඒක සඳහන් වී නැත.අදාළ යෝජනාවට විරුද්ධත්වය පළකළ මන්ත්‍රීවරු සියලුම දෙනා නිහඬව සිටියා.ඉන්පසු තමයි ලයනල් මන්ත්‍රීතුමා ස්ථිර කළ බව සඳහන් කළා එතුමා එතකොට වාර්තාවේ සඳහන් වෙලා තිබෙන්නේ ස්ථිර නොවුණ එකක් ඒකමතිකව සභාසම්මත වුණා කියලා. එතකොට තීරණය සඳහා ගරු ආණ්ඩුකාර තුමියට දන්නා යවලා තිබෙන බව ද සංශෝධන යටතේ ඉදිරිපත් කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පිටු අංක 45 - 46 එම යෝජනාව ඒකමතිකව සභාසම්මත නොවීය කියලා තිබෙන්නේ බව පවසන ලදි.ලයනල් මන්ත්‍රීතුමා ස්ථිර කළා.ඒක නිවැරදි කර ගනිමු.ඒ අවස්ථාවේ කලබලේට සිදු වුණ නිසා යැයි පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 20 හි සඳහන් ඔබතුමාගේ කතාවේ දී ප්‍රකාශ කර තිබෙනවා පනතේ විදිහට තිබෙනවා දෙවන පාර්ශවයකට නඩත්තු කිරීමට දීමට නොහැකි බව,මට මතක විදිහට පාවිච්චි කළේ තෙවන පාර්ශවය විදිහට ඔබතුමා සඳහන් කළේ. එය එසේ නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ඉදිරිපත් කරන ලදි.

පිටු අංක 25 මේකේ වරද කාගේද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදී. ඊට පසුව ඔබතුමා මට පිළිතුරක් සපයනවා මහජනතාවට ප්‍රාදේශීය සභාවක් විදිහට වැඩ කිරීම මට මතක විදිහට ඔබතුමා ලබා දුන් පිළිතුර මේකේ නොවේ.ඒකෙදි මම ඉහත කාරණයට ඔබතුමාගෙන් ප්‍රශ්න කරනවා. මේකේ වරද කාගේද යනුවෙන්. එතකොට ඔබතුමා දෙන පිළිතුර මේක නොවේ.ඔබතුමා පිළිතුරු දුන්නේ මේකේ වරද කාගේද කියන එකේ ප්‍රශ්නයට වැඩිය අර අමාත්‍යාංශයට ගිහින් කතා කරපු එකයි. තවද මේ ගැන ප්‍රශ්න කරනවා ඔබතුමාගෙන් 82 අපේ ප්‍රේමදාස ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ යටතේ තිබුණු බවත් සඳහන් කරනවා. ඒ ගැන සඳහන් වී නැත. පිළිතුර හැබැයි ඔබතුමා දෙන පිළිතුරු නොවෙයි මේකේ තිබෙන්නේ.යනුවෙන් සංශෝධන යටතේ පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොතනද? ඒ ප්‍රශ්නය පටන් ගත්තේ යනුවෙන් ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 25 හි සඳහන් මගේ ප්‍රකාශයේ සිට යට ඉඳන් බැලූ විට හතරේ ඔබතුමාගේ පිළිතුර හතරවෙනියාට තිබෙන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාරණය මොකක්ද?යනුවෙන් ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

කාරණය තමයි C.T.B.ස්ටෑන්ඩ් එකේ අයිතිය සම්බන්ධව කතා කරගෙන යන විට බව පවසන ලදි.

පිටු අංක 41 හි සඳහන් අපේ ඉන්දික සමන් කුමාර මැතිතුමා ඉදිරිපත් කරපු යෝජනාව,ඒක අනුමත වුණා කියලා තමා සලකන්නේ.ඒ වුණාට ඒක අනුමත කිරිමට නොහැකිය.අපේ සභාවට අදාළ නොවන කාරණයක් නිසා අපි ඒක සංශෝධන සහිතව ඉදිරිපත් කරමු කියන තැනට ගියා. නමුත් අදාළ

යෝජනාව ඒකමතිකව සම්මත වුණා කියන කාරණය තමා තියෙන්නේ.ඒ නිසා එම යෝජනාව සංශෝධන සහිතව ඉදිරිපත් වුණා යනුවෙන් නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජල ප්‍රශ්නය නේද?යනුවෙන් ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ඒකට සංශෝධන සහිතව ඉදිරිපත් කරමු. කියන කතාව තමා මම ඉදිරිපත් කළේ. එය මෙහි සඳහන් වී නැත.මම සංශෝධන ඉදිරිපත් කරනවා කියලා තිබුණට යෝජනාව ස්ථිර වුණාට පසුව ඒක සඳහන් වෙලා නැත.

පිටු අංක 44 හි සඳහන් රුක්මන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර වෙලා.එය ස්ථිර නොවුණා කියලා පැවසුවාට පසුව මම ස්ථිර වුණා කියලා පැවසුවා.ඒ ගැන සඳහන් වෙලා නැත. 44 පිටුවේ හි මගේ ප්‍රකාශය යටතේ යට ඉඳන් තුන්වැනි ඡේදයේ මම රුක්මන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට විරුද්ධයි කියලා පැවසුවා.විරුද්ධ වීමට හේතු මේ වන විටත් ඒ ටික නම් සඳහන් වෙලා තිබෙනවා.රු 679.00 ක් ඔබතුම ඔබතුමියන්ලා අරගෙන තිබෙන බවට නම් සමඟ ඉදිරිපත් කළා ඒ ගැන සඳහන් වෙලා නොමැත.

1. S.M.ගාමිණී සමරකෝන් මැතිතුමා - රු.679.00
2. H.S.K.කුමාර මැතිතුමා - රු.679.00
3. P.G.S.සමන් කුමාරි මැතිතුමා - රු.679.00
4. G.G.උපාලි රෝහණ මැතිතුමා - රු.679.00
5. M.R.I.සමන් කුමාර මැතිතුමා - රු.679.00
6. V.R.E.N.වීර බණ්ඩාර මැතිතුමා - රු.679.00

එය නම් සමඟ නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ පවසන ලදි.රුක්මන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට මම විරුද්ධ වුණා ඒ ගැන සඳහන් වී නැති බව ද පවසන ලදි.

පිටු අංක 48 හි මේවා මුද්‍රණ දෝෂ වෙන්න ඇති.මගේ යෝජනාවට අදාළව මම කතා කරගෙන යද්දි ඒ වගේම අපට පුළුවන් මේක ඩිජිටල් කරණයට සමගාමීව දුරකථන සකසන්න කියන එක තමා මම කීවේ.ඊළඟට Smart Phone එක App එකක් නිර්මාණය කරලා තියෙනවා.මේකේ කරලා කියන තැනට තිතක් යොදා එතැනින් අවසන් කර තිබෙනවා.එතකොට මම කියන කතාව සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා.ගැළපෙන්නේ නැත.නැවතීමේ තිත අවශ්‍ය නැති බවත්,එයන් පැවසූ දේ විකෘති වී ඇති බවත්,පවසන ලදී. එම නිසා තිත අයින් කරන නිවැරදි කරන ලෙස සංශෝධනය යටතේ ඉදිරිපත් කරන ලදී.

පිටු අංක 53 මගේ ප්‍රකාශයේ සමීර එකේ කොන්ක්‍රීට් එක අරගෙන කරනවා කියලා සඳහන් වී තිබෙනවා.එහි කොන්ක්‍රීට් එක ගැන සඳහන් නොකළ බවත් එහි කොන්ක්‍රීට් යන වචන ඉවත් කළ යුතු බව පවසන ලදි.ඒ වගේම සමරකෝන් මන්ත්‍රීතුමාගේ සහෝදරයෙක්ට කියලා වැඩිහිටි සමිතිය මගින් කියලා තිබෙනවා. එතනදී මම අදහස දුන්නේ සහෝදරයෙක් සිටින වැඩිහිටි සමිතියට කියලා. එය ද එලෙස නිවැරදි විය යුතුයි.ඒ වගේම එම ප්‍රකාශයේම අංක 54 පිටුවේ පාලම ඉදිකිරීමට පසුගිය කාලයේ ක්‍රියාත්මක වුණා. එය එසේ නොව පාලම් ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා කියන එක තමා පැවසුවේ.විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන සුළු කාරණා වුණාට නැවතීමේ තිත වැනි දේවල් මහලොකු වැරදි දේවල් නොවේ.නමුත් අපි කරන ප්‍රකාශයන් වල අදහස සම්පූර්ණයෙන් වෙනස් වෙනවා. ඒ ගැන ඔබතුමා හා ලේකම්තුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

පසුගිය සභා වාරයේදී මම පැවසූ ප්‍රකාශ වල මුද්‍රණ දෝෂ දෙකක් තිබෙනවා.පහසු වීමට පවසන්නේ නම් පිටු අංක 31 හි උඩ සිට බැලුවොත් 12 Line එකේ තිබෙන්නේ.රටේ අනාගත සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් යනුවෙන් සටහන් වී ඇත.එය ආහාර සුරක්ෂිතතාවය ලෙස නිවැරදි විය යුතුයි.එහිම 18 Line එක සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අයිතිය පළාත් සභාවට තිබෙනවා.ලෙස සටහන් වී ඇත.එය ප්‍රාදේශීය සභාවට තිබෙනවා යනුවෙන් නිවැරදි විය යුතු බවට සංශෝධනය යටතේ පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
පිටු අංක 18 හි හතරවෙනි පේලියේ සඳහන් සතිපොළෙහි තිබෙන අඩුපාඩු හදලා ඊට පසුව ඒකෙ ප්‍රශ්න තිබෙනවා.යනුවෙන් සටහන් වී ඇත.එය එසේ නොවන බවත්,2026 ට නැවත ටෙන්ඩර් කැඳවීමකට යනවාද? ටෙන්ඩර් කිරීමට ගන්නවද? යන එක තීරණය කිරීමට තමා අදහස් වුණේ. යනුවෙන් නිවැරදි විය යුතු බව පවසන ලදි. පිටු අංක 55 හි ඔබතුමා යනුවෙන් සඳහන් කළේ.උපාලි මන්ත්‍රීතුමා ඔබතුමා කියලා නොව ඊට පෙර මන්ත්‍රීතුමා ලෙස අදහස් වන බවත්,එහි උපාලි මන්ත්‍රීතුමා ලෙස නිවැරදි විය යුතු බව සංශෝධන යටතේ පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
තව දුරටත් සංශෝධන නොමැති බැවින් 2025.09.02 දින පැවති මාසික මහ සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.එම වාර්තාව සංශෝධයන්ට යටත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.ඒ අනුව 2025.09.02 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

**(II).2025.09.23 දින පැවති විශේෂ මාසික මහා සභා වාර්තාව සම්මත කිරිම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
2025.09.23 දින පැවැත්වූ විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරිම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.09.23 දින පැවැත්වූ විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි. 2025.09.23 දින පැවැත්වූ විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව අඩුපාඩු නොමැති බව පෙනියන බැවින් එම වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.ඒ අනුව 2025.09.23 දින පැවැත්වූ විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වුණ බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
01.2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ විදි විධාන ප්‍රකාරව සභිකවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ පළාත් පලාන කොමසාරිස් කාර්යාලයට යැවීම සඳහා ඔබ වෙත ලබා දී ඇති ආකෘතිය ප්‍රකාරව ඔබගේ වත්කම් බැරකම් ප්‍රකාශ 2025.10.10 දිනට පෙර ලේකම්තුමා වෙත ලබාදීමට කටයුතු කරන මෙන් දන්වමි.
වත්කම් බැරකම් ප්‍රකාශය සම්පූර්ණය කිරීම සඳහා උපදෙස් මාලාවක් වෙබ් අංක ciaboc.gov.lk මඟින් ලබාගත හැකි බව ද මෙම වත්කම් බැරකම් පිළිබඳ උපදෙස් මාලාව කාර්යාලය වෙත යොමු කර තිබෙන බව දන්වන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
දැන් මේ ආණ්ඩුව පත් වුණාට පසුව වත්කම් වැඩි වෙන්නේ නැති බවත්, අඩු වෙන්නෙත් නැති බව පවසන ලදි.නමුත් අද තමා දුන්නේ.අද දීලා 2025.10.10 පෙර දෙන්න කියනවා. යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
වත්කම් බැරකම් ටික පුරවා 2025.10.10 දිනට පෙර ලේකම්තුමාට ලැබීමට සලස්වන මෙන් ගරු සභාපතිතුමා දන්වන ලදි.

02. ඊළඟට ආරාධනා පත්‍රයක් තිබෙනවා. දැලිවෙල ශ්‍රී ශීවලී පෙර පාසලේ සිඳිති සිඟිති දූ දරුවන්ගේ අත්කම් දැක්ම 2025.10.16 වන දින පෙ.ව.9.45 පෙර පාසල් භූමියේදී ආරම්භ වන බවත්, සීවලී පෙර

පාසලේ දූ දරුවන් හා ගුරුතුමියන්ලා විසින් ඔබතුමාට/ ඔබතුමියට ගෞරවයෙන් ආරාධනා කර ඇති බව දන්වන ලදි.

03. ඊළඟට අපි පළාත් පාලන සතියට 2025.09.15 සිට 2025.09.21 දක්වා පළාත් පාලන සතිය පැවති බවට දැනුම් දෙන ලදි.එම සතිය පුරාවට විවිධ වැඩසටහන් කළ බවත්,එහි දළ විස්තරයක් ඔබතුමන්ලාගේ/ ඔබතුමියන්ලාගේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

**2025.09.15 දින**

මෙම භූමියේදී නිල වශයෙන් පළාත් පාලන සතිය පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත රණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදි.ඒ අනුව පත්තම්පිටිය වසමේ ජංගම සේවාවක් ආරම්භ කර බවත්, එහි විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| සහභාගි වූ මහජන නියෝජිතයින් සංඛ්‍යාව | -03 |
| නිලධාරීන්ගේ සහභාගිත්වය | -27 |
| ජනතා සහභාගිත්වය | - 44 |
| වරිපනම් ආදායම | -රු8915.00 |
| ව්‍යාපාර බදු | -රු8400.00 |
| වෙළඳ බලපත්‍ර අයදුම් පත් ලබාදීම | -25 |
| පුස්තකාල සාමාජිකත්වය | -04 |
| වීදි පහන් අලුත් වැඩියාව | -17 |

වැනි සේවාවන් වර්ෂාව මධ්‍යයේ සිදු කළ බවත්,එම දිනයේම ඉඹුල්ගස්දෙණිය වසමේ වෛද්‍ය සායනයක් පැවැත්වූ බව සඳහන් කරන ලදි.එහිදී සිදු කළ සේවාවන් පහත සඳහන් වේ.

| | |
|---|---|
| රෝහලෙන් සහභාගි වුණ නිලධාරීන් සංඛ්‍යාව | -26 |
| මහජනතාවගේ සහභාගිත්වය | -09 ද |

අපගෙන් සේවය ලබා ගත් බවත්, සඳහන් කරන ලදි.

මොලගොඩ ආක්ෂි සායනයක් පැවැත් වූ අතර එහි විස්තරද සඳහන් කරන ලදි.

| | |
|---|---|
| මහජන නියෝජිතයින්ගේ සහභාගිත්වය | -03 |
| නිලධාරීන් | -05 |
| ජනතා සහභාගිත්වය | -110 ක් ද ඇස් පරීක්ෂා කරලා ඇස් කණ්නාඩි ලබා |

දිමේ කටයුතු සිදු කරන ලදි.

**2025.09.16 දින**

මෙම දිනය පරිසර හා රුක් රෝපණ දිනයයි. අපි කසල කළමනාකරණය පිළිබඳව පාසල් විසි එකක දරුවන් දැනුවත් කිරිමේ සටහනක් සිදු කරනු ලැබුවා.කොට්ඨාස 21 ක කේන්ද්‍ර කර ගනිමින් ඊළඟට එම පාසල් 21 ක සහභාගි කර රුක් රෝපණය කිරීම සිදු කළා. එයට අදාළව චිත්‍ර තරගයක් පවත්වා ත්‍යාග පිරිනැමීම සිදු කරන ලදි.අපි ඒ දවස සඳහා පැළ 177 ක් ලබා දී තිබෙනවා.ඒ වගේම චිත්‍ර තරගාවලියේ ස්ථාන පහක් සඳහා ත්‍යාග සහ සහතික පත්‍ර ලබා දීම සිදු කරන ලදි.එම ත්‍යාග සඳහා දායකත්වය ලබා දුන්නේ මන්ත්‍රී මණ්ඩලය කොට්ඨාශ අනුව බෙදී ගෙන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදි.

**2025.09.17 දින**

මෙම දිනය සෞඛ්‍යා සනීපාරක්ෂක දිනයයි. ඒ සඳහා අපි සතිපොළ භූමිය ශුද්ධ කිරිම සිදු කළා. කාර්යාල මහජන නියෝජිතයින් හා නිලධාරි මණ්ඩලයේ සහභාගීත්වයෙන් ඒ සඳහා

| | |
|---|---|
| නිලධාරීන්ගේ සහභාගිත්වය | -40 |
| මහජනතා සහභාගිත්වය | -17 |

මහජන නියෝජිතයින්ගේ සහභාගිත්වය -07 සහභාගි වීය.

එදිනම නාරම්බැද්ද වසමේ බටහිර වෛද්‍ය සහනයක් පවත්වන ලදි.ඒ සඳහා

| | |
|---|---|
| මහජන නියෝජිතයින්ගේ සහභාගිත්වය | -02 |
| නිලධාරීන්ගේ සහභාගිත්වය | -17 |

මහජනතා සහභාගිත්වය -62 ප්‍රතිකාර ලබා ගත් අතර,

එදිනම කණුගොල්ල වසමේ වෛද්‍ය සහනයක් ද පවත්වනු ලැබුවා.එහිදී
මහජන නියෝජිතයින් -03
නිලධාරීන් -11
ස්වේච්ඡා සංවිධානයෙන් -05
මහජනතාව -109
ප්‍රතිකාර ලබාගෙන තිබෙන බව සඳහන් කරන ලදි.
ඊළඟට කොම්පෝස්ට් අංගනය පිරිසිදු කිරීම හා පැළ රෝපණයක් කිරීම.
මහජන නියෝජිතයින් -03
නිලධාරීන් -18
ස්වේච්ඡා සංවිධාන -02
මහජනතාවගේ සහභාගිත්වය -47
සහභාගි වුණ බව සඳහන් කරන ලදි.

**2025.09.18 දින**
ආදායම් ප්‍රවර්ධනය දිනයයි.මොළගොඩ ජංගම සේවයක් පැවැත් වූ බව සඳහන් කරන ලදි.ඒ පිළිබඳ විස්තර ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදි.මහජන නියෝජිතයින් තුනක් ද,නිලධාරි සහභාගිත්වය 32 ක් ද,මහජනතා සහභාගිත්වය 62 ක් ලෙස දක්වන ලදි.එහිදී වරිපනම් ආදායම් බදු එකතුව රු90,352.00 ක්ද, ව්‍යාපාර බදු රු.6,000.00 ක්ද ,කඩ කුලී,වෙළඳ බල පත්‍ර පහක් සහ අධික වර්ෂාව මැද වීදි පහන් හතරක් අලුත්වැඩියා කළ බව සඳහන් කරන ලදි.

**2025.09.19 දින**
මෙම දිනය සාහිත්‍ය හා පුස්තකාල දිනයයි.පුස්තකාල භාවිතයේ වැදගත්කම පිළිබඳව පාසල් දෙකක් දැනුවත් කළා.දැලිවල මහා විද්‍යාලය එයට මහජන නියෝජිතයින් තුන්දෙනෙක් ද,නිලධාරීන් තුනක් ද සිසුන් හතළිස් දෙනෙක් සහභාගි විය.හේවාදිවෙල මහා විද්‍යාලය සඳහා මහජන නියෝජිතයින් දෙදෙනෙක්, නිලධාරීන් තුනක් සහ සිසුන් හා දෙමවුපියන් හතළිස් දෙදෙනෙක් සහභාගි විය. සවස මේ පරිශ්‍රයේ පාසල් දෙකක් අතර විවාද තරඟයක් පැවැත්වූ බව සඳහන් කරන ලදි.

**2025.09.20 දින**
මහජන උපයෝගීතා දිනය.ඒකෙ දී බතඹුරය ක්‍රීඩාංගනය හා කිරිවල්ලාපිටිය සුසාන භූමියේ පිරිසිදු කටයුතු සිදු කළ බව සඳහන් කරන ලදි.

**2025.09.21 දින**
මෙම දිනය පළාත් පාලන සතියේ සමාප්ති උළෙලයි. එදින රාජ්‍ය ආයතන,වෙළඳ ප්‍රජාව ,මහජන සහභාගිත්වයෙන් ක්‍රිකට් තරඟාවලියක් පැවැත් විය.එහි සහභාගිත්වය 200 ක් බවට සඳහන් වී තිබෙනවා. අපි ඊළඟට ශරීර සුවතා වැඩසටහනක් කළා. එහි මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ හා නිලධාරීන් අසූවක් සහභාගී විය.සවස සහතික පත්‍ර හා කුසලාන ප්‍රදාන කර කටයුතු නිමා කරන ලදි. මෙය තමා පළාත් පාලන සතියේ ප්‍රගතිය.ගරු මන්ත්‍රීතුමන්ලාගේ /තුමියන්ලාගේ දැනගැනීම සඳහා මෙය ප්‍රකාශ කළ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා
- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා කිසිවක් ලැබී නොමැති බවත්,සියලුම මන්ත්‍රීතුමන්ලා /තුමියන්ලා පැමිණ සිටින බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

(ඈ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම.
- ❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,සංදේශ සඳහා මම මේ ලිපිය සභාගත කිරීමට අදහස් කරමි.විදුහල්පති බැද්දවල ප්‍රාථමික විද්‍යාලය ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රුක්මන් මැතිතුමා මඟින් ගරු සභාපතිතුමා, ප්‍රාදේශීය

සභාව රඹුක්කන.සභාපතිතුමනි,අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධවයි.උක්ත කරුණු පිළිබඳව ඔබතුමාගේ යොමු අංක RPS/01/15/01/50 ලිපිය හා බැඳේ. ඒ අනුව අනතුරුදායක ගස් ඉවත් කිරීමට අදාළ ඉඩම් හිමියා දැනුවත් කරත් ඔහු මේ වන තෙක් මේ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දන්වා සිටීමි.අපි විද්‍යාලයේ කුඩා දරුවන් ඉගෙනුම ලබන පාසලකි.දරුවන්ගේ ආරක්ෂාව සඳහා මෙම ගස් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.මෙයට විදුහල්පති.ඒත් ගරු සභාපතිතුමනි, පොඩි හැඳින්වීමක් මා කිරීමට බලාපොරොත්තු වෙනවා.ඔබතුමාත් උත්සවයකට ගියාට පසුව දකින්නට ඇති මේකේ ලොකු කරදගහක් සහ කොස් ගස් කීපයක් තිබෙනවා. දෙමාපියන් සහ මාගේ සහෝදරයාත් එකතු වී නොමිලේ කැපීමට කටයුතු කළා. පුද්ගලයාත් එකඟව මේ විශාල කරද ගහ කැපිමට සභාපතිතුමනි,අතු කඩා වැටී තිබුණ නිසා ගහට නගින්නට බැරි නිසා ඒ පුද්ගලයාගේ එකඟතාවය මත ගහට ගිනි තැබුවා.ගහේ සියල්ලම පිච්චිලා ලණුව දැමීමට නොහැකි නිසා පසුවදා කපන්නට ගියා. පසුව කපන්නට එපා කියලා කිවුවා.දැනට මෙම ගස තැම්බිලා තියෙන්නේ. කොයි වෙලාවෙ කඩා ගෙන වැටෙයිද කියන එක ගැන අවධානමක් තිබෙනවා.මොකද කුඩා දරුවන් පන්සියයක් පමණ ඉගෙන ගන්න පාසලක් මේක කඩාගෙන වැටුනොත් යම්කිසි දෙමව්පියකුගේ දරුවෙකුට අගතියක් වුනොත් ඒක සභාවක් හැටියට වගකියන්න වෙනවා.මොකද අපි නියෝග යවලා තිබෙන්නේ.ඔබතුමාට ඒකෙදි කැලලක් ඇතිවෙනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කර ඒ ගස් සියල්ලම ඉවත් කළ යුතුව තිබෙනවා.ඒ සඳහා දෙමව්පියන් මුදලක් ලබා නොගනියි.ඒකට අවසරය හා ආරක්ෂාව දෙනවා නම් ඒ විද්‍යාලයේ දෙමව්පියන් එම ගස් බිම හෙලන්නට කටයුතු කරයි කියන එක ප්‍රකාශ කරමින් මම නවතිනවා ස්තුතියි!යනුවෙන් ප්‍රකාශ කරමින් සංදේශය ඉදිරිපත් කිරිම හා හැදින්විම අවසන් කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මට මතකයි මේ ඉඩමට කවුරු හරි හවුල්කාරයෙක් සිටින බව එතුමා අපට ලිපියක් එවලා තිබුණා.මේක පිළිතුරක් විදිහට ඔහු බොහොම විහිළු සහගත උත්තරයක් එවලා තිබුණ බව පවසන ලදි.ඒකට අපි පිළිතුරක් යැව්වා. ඒකෙන් පස්සේ මම මොකක් මොනවද කියන එක ගැන අවබෝධයක් නැත.අපි හෙට දවසේ ක්‍රියාත්මක වෙමු.පාසලට යාමට ඔබතුමා සහභාගී වෙන්න.කවුරු හරි මෙයාගෙ අයියෙක් හරි මල්ලියෙක් හරි තමයි ලියුම වෙලා තිබුනේ. අයිතිය මෙයාගේ කියලා තමයි තිබුණේ. මොනවාත් වුණත් අපි මහජනතාව සහභාගි කරවාගෙන අපි හෙට මේ වැඩේට යොමු වෙමු.ඔබතුමාත් පැමිණෙන්න අපි හෙට ක්‍රියාත්මක වෙමු. යනුවෙන් ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න

යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න නොමැති බවට ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදි.

(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මම යෝජනා දෙකක් ඉදිරිපත් කළා. ඒ යෝජනා න්‍යායපත්‍රයට ඇතුල් කර නොමැත. මගේ පළමු යෝජනාවේ තිබුණේ කුරියම්පළ දුම්රිය හරස් මාර්ගයට විදුලි සංඥා දෙකක් සවිකර කරන්න ගරු ප්‍රවාහන හා මහාමාර්ග ඇමතිතුමාට දන්නවා යැවීමට යෝජනා කරමි ලෙසටය. නමුත් මේ න්‍යාය පත්‍රයේ එම යෝජනාව හා දෙවන යෝජනාව නැත. එසේ වීමට හේතු විමසන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රථමයෙන් සමාව ඉල්ලා සිටිනවා ඔබතුමා මතු කළ කාරණය පිළිබඳව. සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කිරීමට අවශ්‍ය නොමැති නිසා ඔබතුමාගේ යෝජනාව ප්‍රවාහන අමාත්‍යාංශයට යොමු කර ඇත. ඊළඟට ඔබතුමා 2026 ට යෝජනා කිහිපයක් දීලා තිබුණේ. ඒම යෝජනා 2026 යෝජනා වලට ඉදිරිපත් කර ඇති බව පවසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

2026 අයවැය යෝජනාවට කුරියම්පළ පාර යොමු කර ඇත. මෙය සභාවට අයත් පාරකි. එහි පවතින දුම්රිය ගේට්ටුව තල්ලු කර වැසීමට නොහැක. වාහනයක් දුම්රියේ වැදී අනතුරකට ලක් වුවහොත් රඹුක්කන අපි තමා කරලා නැහැ කියලා කියන්නේ. රඹුක්කන ප්‍රදේශයට අයත් නිසා තමයි මම මේ යෝජනාව යොමු කළ බව පවසන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්යබහුලත්වය හා කාලය මදි වීම නිසා ඔබතුමාගේ යෝජනාව පිළිබඳව දැනුවත් කිරීමට නොහැකි වූ බව පවසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මගේ යෝජනාවටත් මොකද වුණේ. එක යෝජනාවක් තිබෙනවා, දෙවැනි යෝජනාව නැත. සියලුම මන්ත්‍රීවරුන් සඳහා අදාළවන යෝජනාවක් වේ. එය ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීම සඳහා ඒ යෝජනාව ඉදිරිපත් කළේ. එතුමා ප්‍රධාන බලවතා නිසා බව පවසන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමාගේ එම යෝජනාව අපි සභාවට ඇවිත් සභාව පටන් ගත්ත දවසේ සිට ඒ ගැන කතා කර ඇත. නමුත් අපට රීතියෙන් පැහැදිලි කරලා තිබෙනවා එය සිදු කරන ආකාරය පිළිබඳව. ගිය වතාවේ රුක්මන් මන්ත්‍රීතුමා යෝජනාවක් කරලා, ඒ පිළිබඳව අපි එහිදී එකඟතාවයකට පැමිණියේ, සියලුම මන්ත්‍රීවරුන් ලිඛිතව මට දැනුම් දුන්නොත්, මට ඒ ටික ආණ්ඩුකාර තුමිය වෙත ඉදිරිපත් කිරීමට පුළුවන් බව පවසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මම ඒ නිසා තමයි යෝජනාව ඉදිරිපත් කළේ. "අකමැති අය විරුද්ධව කතා කරයි, කැමති අය කැමති විදිහට කතා කරයි" යනුවෙන් පවසන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි ගිය වාරයේ තීන්දුවක් ගත්තා ඒ යෝජනාව සම්බන්ධයෙන්. සෑම මන්ත්‍රීතුමෙක්ම/ තුමියක්ම ලිඛිතව මා වෙත දැන්වීමෙන් පසුව එම ඉල්ලීම් ලබා දීමට කටයුතු සිදු කරන බවට යෝජනාව සම්මත කර ගත්තොත් යනුවෙන් පවසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාවට යෝජනාවක් ඉදිරිපත් කරන්නේ සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත ගන්න, කැමති වුණා නම් අනුමත වුණා නම් ඒක ජනාධිපතිතුමාට යවන්න කියලා ඉදිරිපත් කරන්න. අපි සියලු දෙනාටම ආර්ථික වශයෙන් අමාරුකම් තිබෙනවා. මහජන සේවය සඳහා යෙදෙන කොට වියපැහැදම් කිරීමට සිදුවෙනවා. අපට වියදම් අඩු කරලා තියෙන්නේ. පසුගිය කාල සීමාව තුල අපට දීමනාව ලෙස රුපියල් 23,000ක් ලැබුණ නමුත් දැන් දෙනු ලබන්නේ රුපියල් 15,000කි. රුපියල් 8,000ක් ලබා නොදේ. ඒකට තමා අපි ජනාධිපතිතුමා දැනුවත් කරන්න කියලා යෝජනාවක් සභාවට ඉදිරිපත් කළේ. ඒක සභාවේ සියලු මන්ත්‍රීවරුන්ගේ අනුමැතිය මත තමා සම්මත වෙන්නේ. නමුත් මේක සභාපතිතුමා න්‍යාය පත්‍රයේ යෝජනාවලට ඇතුලත් කර නොමැති බව පවසන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මම හිතන්නේ ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමෙක්, ඔබතුමා මේ සම්බන්ධව දැනුවත්. සභාවට අදාල නීති රීති දන්නවා. රීතිවල එම මුදල ලබාගතයුතු ආකාරය අපිට පැහැදිලි කරලා තිබෙනවා. එසේ තිබියදී නැවත පැවසීමට අවශ්‍යතාවයක් නොමැති බව පවසන ලදී. තවද ඔබතුමාට අපි ගරු කරනවා ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමෙක්,අනවශ්‍ය ප්‍රශ්න ඇති කරන්නේ නැතිව කරුණාකර අසුන් ගන්නා ලෙස පවසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

හිතුවක්කාර කටයුතු කරන්නේ ඇයි? ඔබතුමා බලය පාවිච්චි කරලා මන්ත්‍රීවරයෙකු යෝජනාවක් ගෙනාවා ම ඒ යෝජනාව දාන්නේ නැත්නම් ඒ පිළිබඳව අපට ලිඛිතව දැනුම් දෙන ලෙස පනතේ ඇති බව ප්‍රකාශ කරන ලද. කිසිම දැනුම් දීමක් සිදු කරන්නේ නැතුව හිතුවක්කාර පාලනයක් ගෙනයන්නේ ඇයි ද ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

යෝජනාවක් පිළිබඳව යම් දැනුම්දීමක් න්‍යායපත්‍රයට ඇතුළත් කිරීමට පෙර සභාපතිවරයා වෙත එය ඉදිරිපත් කළ යුතු අතර එය නීති විරෝධී බව ඔහුගේ මතය වේ නම් එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු යැයි ඔහු විසින්ම නියම කර ඒ දැන්වීම කළ සභිකයාට ඒ බව දැනුම් දීමට සැලැස්විය යුතුයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

හරි සභාව පටන් ගන්න. මේ යෝජනාව දෙන්න කලින් කිව්වේ ඒක මම අතින් වුණ අතපසුවීමක් සමාවෙන්න කියලා. ඒ නිසා පැහැදිලි කිරීම් කරන්නේ යැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා

සභාපතිතුමා එදා දෙවෙනිදා එකේදී මේ පණත යටතේ පටහැනි නම් ඉල්ලීමක් කරන්න කියලා ඔබතුමා දාලා තිබුණා. මගේ අනතුරුදායක ගහකට යෝජනාවක් දැම්මා ඒ යෝජනාවත් න්‍යාය පත්‍රයේ අද නෑ ඒකට හේතුව දන්නේ නෑ. ඇත්තටම ඊට කලින් ජයවීර මන්ත්‍රීතුමා අනතුරුදායක ගස් කිහිපයක් සම්බන්ධ යෝජනා ඉදිරිපත් කර ඇත.ඒවාද ඉදිරිපත් කර නැත. මගේ යෝජනාවත් යෝජනා පත්‍රයට ඇතුළත් කර නොමැත ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නෑ මම කීවේ මන්ත්‍රීතුමන්ලාට/තුමියන්ට ලිඛිතව ලිපි ලබාදෙන්න. අපි සභාවේ මහජන නියෝජිතයෝ විදිහට අපිට මෙතන සභාවේ පූර්ව එකඟතාවයෙන් කළ යුතු වැඩ තියෙනවා. ඔබතුමාගේ ගහේ ප්‍රශ්නය සභාවට දාලා ඉන්නේ නැතිව ඒ යෝජනාව අපට ලැබුණු සැනින් අපේ විෂය භාර නිලධාරියාව දැනුවත් කර එය ක්‍රියාවට නැංවුවා. මොකද සභාවට යෝජනාවක් ඉදිරිපත් කළොත් මාසයක් ඉන්න වෙනවා ඒ යෝජනාව ක්‍රියාවට නැංවීමට. මගේ අතින් අතපසුවීමක් සිද්ධ වුණා. ඒක මම පිළිගන්නවා. මොකද මේ කාර්ය බහුලත්වය නිසා. ඊළඟ වතාවේ එසේ නොවීමට මම වග බලා ගන්නවා. ඔබතුමන්ලාගේ යෝජනා අන්තිම දවස් කිහිපයේ මාහට ලැබුණ නිසා පිළිතුරු ලිපියක් ලිවීමට කාලයක් නොමැත. තරහකට හෝ බලය අයුතු ලෙස යෙදවීමක් නොවෙයි සිද්ධ වුණේ යැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙතුමා ඉදිරිපත් කරපු යෝජනාව ආණ්ඩුකාරතුමියට හා ජනාධිපතිතුමාට යවනවා නම් එය වඩාත් හොඳ යැයි මම යෝජනා කරන අතර මොකද පෞද්ගලිකව ඉල්ලීම් කරනවට වඩා අපි සභාවක් විදිහට ඉල්ලීම් කිරීම. ගිය සභාව වාරයේදීත් කතා වුණා මෙය යෝජනාවක් විදිහට ඉදිරිපත් කරන්න කියලා යැයි එතුමා ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සභා වාර්තාවේ තිබෙනවා. මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර කළායින් පසුයි ගැටළුකාරි තත්වයක් පැන නැගුණේ.අපි තීන්දුවක් ගත්තා සියලුම මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා මට ලිපියකින් දැනුම් දීමෙන් පසු අපිට මේ රුපියල් 8,000 දීමනාව ගන්න අවශ්‍යයි කියලා. මොකද ඊට පස්සේ මම ඒ ලිපි සියල්ල එකතුකර ලිපියක් සකස් කිරීමට අවශ්‍යයි. සභාපති හැටියට මම රීතියට යටත්. ඔබතුමන්ගේ යෝජනාව ඉදිරි වාර්තාවට දමන්නට කටයුතු සිදු කරන බව එතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙතුමා කියලා තිබුණේ ඒක ආයුර්වේදයට දෙන්න කියලා. මම ඒකට එකඟ වුණේ නෑ යැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා ඔබතුමාගේ තීරණය ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය ලබා ගැනීමට ඉල්ලීම් ලිපියක් ගරු ජනාධිපතිතුමාට ලබාදීමට තීරණය විය. නමුත් මෙය පනතට පටහැනියි.අපි පෞද්ගලිකව තනි තනියම ඉල්ලීම් ලිපියක් එනවාට වඩා මහා සභාවට යොමු කර මහා සභාවේදී ඒ මාතෘකාව කතාකර මහා සභාවේදී අනුමත වූ යෝජනාවක් තමා ආණ්ඩුකාර තුමියට ඉදිරිපත් කළ යුතු

වන්නේ. අපි අතින් අතපසුවීමක් සිදුවන්නට ඇති. නමුත් අපි මෙය ඉදිරියට කරගෙන යමු යැයි ප්‍රකාශ කරන ලදී.

**(ඊ).01. ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

(i)1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ එකසේ 134 (3) විධි විධානයට යටත් පහත උපලේඛනයන් සඳහා දේපළවල හිමිකම පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට තහවුරු කර ඇති බැවින් ඒකී දේපළ වර්තමාන හිමිකාරිත්වය වෙත සංශෝධනය කිරීම සඳහා සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

දේපළ හිමිකරු සංශෝධනය වුණේ කොහොමද සභාපතිතුමා. අයදුම් පතක් ලබා දීලද නැත්නම් මිල ගණන් අනුමත වෙලාද යැයි පවසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුම**

අක්කර බදු එක් රැස් කිරීමට මෙම ඉඩමට යනකොට එම ඉඩම විකුණලා ඔප්පු අංකත් ඔක්කොම සඳහන් වෙලා තියෙනවා ප්‍රශ්නයක් නෑ නේද විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය:-

උපලේපනයේ සඳහන් දේපළ වර්තමාන හිමිකාරීත්වය වෙත සංශෝධනය කිරීම අනුමත විය.

(ii) කිසියම් දේපලක් මත අක්කර බද්දක පැනවීම සඳහා 1997 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) විධි විධානයට අනුව උපරිම සීමාව හෙක්ටයාර් 1 ප්‍රමාණය ඉක්මවිය යුතු වේ. එහෙත් ඇමුණුම -02 හි උප ලේඛනයේ සඳහන් දේපළ ව්‍යවස්ථාපිත නීතියෙන් අනුමත කර ඇති උපරිම සීමාව ඒකි උපලේඛනයේ ඒ ඒ දේපළවලට අදාළ විස්තර කර ඇති පරිදි ඉක්මවීමක් සිදු කර නොමැති බැවින් එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙමගින් ප්‍රකාශ වන්නේ ද අක්කර බදු සම්බන්ධවමයි. පනතට අනුව අක්කබදු එකතු කරනු ලබන්නේ හෙක්ටයාර් ප්‍රමාණය මතයි. මෙම ඇමුණුම් දෙකට අදාලව එහි නම් සඳහන් තුන්දෙනාගේ අක්කර බදු අය කරගැනීම දැන් සිදුකරගත නොහැකිය. ඒයට හේතුව එම ඉඩම් කැබලි කර විකුණා සහ දරුවන්ට පවරාදී ඇත. එම නිසා ඒවා ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය:-

එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීමට අනුමත කිරීමට තීරණය විය.

(iii) පොදු වෙළඳපල II අදියරේ අංක 20 කාමරය බදු ගත් මොහොමඩ් ෂාෆි විසින් අවිධිමත් ආකාරයෙන් වෙළඳාම් කටයුතු සිදු කිරිම හේතු කොට ගෙන මෙම පරිශ්‍රය 2023 වර්ෂයේ මුදා තබන ලදි.

ඒහෙයින් ඔහු විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව ඉන් පසු මාසයකට පමණ කාලයකට ඔහුට වෙළඳාම් කිරීමට මෙම පරිශ්‍රය සභාව විසින් නැවතත් ඔහු වෙත ලබා දෙන ලදි.
මේ වන විටත් ඔහුගේ අවිධිමත් වෙළඳ කටයුතු හේතුවෙන් මෙම පරිශ්‍රය මුද්‍රා තැබීමට කටයුතු සිදු වෙමින් පවතින අවස්ථාවේ ඔහු විසින් ඉල්ලීමක් සිදු කර ඇත. මේ වන විට නව

තක්සේරුවක් වසර 3 කට කාලයකට තක්සේරු වාර්තාවක් අප වෙත ලබා දී ඇති අතර ඒම වාර්තාව ක්‍රියාත්මක කරන්නේද ? ඔහුගේ ඉල්ලීම සලකා බලා මෙම පරිශ්‍රය මුද්‍රා තබන්නේද ? යන්න පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙහි ඉතිහාසය අනුව 2017 වර්ෂයේදී පළමු ගිවිසුම් ප්‍රකාරව ටෙන්ඩර් කැඳවා කඩයක් විදිහට බදු දී තිබේ. මෙම කඩය පඩිපෙළ ඇතුලට වන්න දමා ස්ථානගත කර තිබෙන්නේ නමුත් පඩිපෙරට ඉදිරිපස ද ඔහු බඩු යොදාගෙන ඇත. ඒ අනුව අපි වාචිකව ඔහුට දෙතුන් වරක්ම අවවාද කළා. එයට අනුගත නොවූ නිසා ලිඛිතව දැනුම් දීමක් සිදු කරන ලදී. එයට පිළිතුරක් ලෙස දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කර ඇත. මෙම ලිපි ගොනුවෙන් තමා මම තොරතුරු සොයාගෙන තිබෙන්නේ. ඔබලා නගරවැසියන් විදිහට සාකච්ඡා කර සභාවට තීන්දුවක් ලබාදීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස මම යෝජනා කරමි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි, ලේකම්තුමනි සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මෙතැනදී අපි සභාවක් විදිහට විධිමත් තීරණයක් ගත යුතුව තිබෙනවා. මොකද මේක අපේ පොදු වෙළඳපොලේ ඉහළ ගොඩනැගිල්ලට යාමට තිබෙන පාර සහ අනෙක මේ ගොඩනැගිල්ලේ සියලුම විදුලි පද්ධති ස්ථානගත කර ඇත්තේ මෙම කඩ කාමරය තුළ. යම්කිසි හදිසි ගිනි ගැනීමක් සිදුවුවහොත් අපට කිසිම ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැක. විශේෂයෙන්ම පොල්තෙල් ලිස්සන ස්වභාවයක් ගන්නා බැවින් උඩට යෑමට අපහසුතාවයක් පවතී. අලෙවියට ඇති බඩු පදික වේදිකාවේ දමා ඇති බැවින් මගීන්ට එහා මෙහා යාමට අපහසුතාවයක් පවතී. ඒ නිසා සභාවක් විදිහට අපි හරි තීරණයක් ගමු. ඔහු මෙතන වෙළඳාම් කිරීම සුදුසු නොවන බව මගේ යෝජනාව බව පවසන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්. දසනායක මැතිතුමා**

තුන්වන යෝජනාව සම්බන්ධයෙන්,රුක්මන් මන්ත්‍රීතුමාගේ අදහසට මම එකඟ වෙනවා. සභාව විසින් තැන්පත් මුදලක් 2023 අවුරුද්දේ අය කරගෙන තිබෙනවා.එම නිසා ඔහුට කඩ කාමරයක් දෙනවද? එහෙම නැතිනම් තැන්පත් මුදල ආපසු දෙනවද? තැන්පතු මුදල රඳවා ගන්නවද ? යන්න පිළිබඳව යෝජනා කර ගත්තොත් හොඳ බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

අදහස හොඳයි.නමුත් මේකෙදි දේපල බදු දීම මොන ආකාරයට සිදු කර තිබෙද යන්න කියන එක ගැන සොයා බැලීමට සිදු වෙනවා.අපේ දේපලක් යම්කිසි පුද්ගලයෙකුට බදුදිම සඳහා ගිවිසුම් හා කොන්දේසි තිබෙනවා.එම නිසා මොහුට දෙන විටද ඒ ගිවිසුම් හා කොන්දේසි අනුව දිම සිදු කළ යුතුය.එසේ නොමැති නම් කවුරුහරි නිලධාරියෙක් මේ කොන්දේසි උල්ලංඝනය කර ඔහුට කඩ කාමරය දීලා තිබෙන්නේ. එසේ සිදු කළ නොහැකි බැවින් මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය.එසේ සිදු කර ඔහුට ඒ මුදල් නිදහස් කරනවාද?යන්න තීරණය කළයුතුය. එසේ නොමැති නම් අයථා ලෙස මුදල් ලබා ගත් ඒ නිලධාරියා තමා මේකට වගකිව යුතු වන්නේ.මෙය ටෙන්ඩර් පටිපාටියකින් තොරව හිතවත්කමට දුන්නාද කොහොමද දුන්න කියන එක අපි නොදන්න නිසා යනුවෙන් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්. දසනායක මැතිතුමා**

මෙහි ඉතිහාසය අපි නොදන්නවා නොවේ.ගියේ කොහොමද කියලා සොයා බැලීමට නීතිය අනුකූලව කටයුතු කිරීමට ගියොත් හිටපු ලේකම්තුමිය තමා මේකට වගකිය යුත්තේ. දැන් විශ්‍රාම ගිහින්ද දන්නේ නැත.මේක ඒ කාලේ පෞද්ගලික තමා සිදු වුණේ.ටෙන්ඩර් පටිපාටියකට ගියේ නැත.මේක දේශපාලනයට ගියේ.අපේ හිටපු මහ ඇමතිතුමා මෙම ෂාෆිගෙන් මුදලක් අරගෙන තිබෙන නිසා අපේ මහ ඇමතිතුමා,ලේකම්තුමිය සමඟ කතා කරලා පඩිපෙළ අස්සේන් කඩයක් දමා ගැනීමට ඉඩ දෙනවා.

ඉන්පසුව File එකක් හදලා නීත්‍යානුකූලව වැඩ සිදු කළ බවටත්,මේකට මුදලක් ප්‍රාදේශීය සභාවෙන් තැන්පත් කර තිබෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් අපි මොකක්ද ගන්නා ක්‍රියාමාර්ගය කියන එක ගැටලුවකි. ඉවත් කිරීමට පෙර එයාට වෙන්නේ මොකක්ද කියන එක ගැනත් හිතන්න පුළුවන්න නම් සාධාරණයි කියන එක මම ප්‍රකාශ කරනවා.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඔය මුදල් ගන්නකොට අපි දැනගෙන ඉන්න ඕනේ, මහා සභාවට ඉදිරිපත් කර මුදල් ලබාගන්න. ඔබතුමා කියන විදිහට ලක්ෂ දෙකහමාරක් දුන්නා. අත යට තිබෙන දෙයක් නොවේ. සභාවේ දෙයක්ය. සභාවෙන් අය කර ගන්නට ඕන. අපටත් බලපානවා. ඔබතුමා කියපු දේ අපි පිළිගන්නවා. දේශපාලනය කරලා කරලා අපිත් නරක මිනිසුන් ගෙනත් ඔවුන් රජ කරවලා මේ ජරාව කාලකාලා මේ සභාවත් කැවම ඔවුන් සල්ලි ගත්තා නම් බේරගන්න කියමු. ඒවට සල්ලි අපි දෙන්න ඕන නෑ. ඔවුන්ව පරද්දන්න සහය දුන්නේ අපි. නමුත් පැරදුනේ නෑ. අයථා ලෙස මුදල් සොයාගත්තා. ඒක තමයි ඇත්ත කතාව ලෙස පවසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.දසනායක මැතිතුමා**

මේක මහ සභාව තීරණය කළ යුතුය.අපිට උවමනා නැත ෂාෆිට රුපියල් ලක්ෂ 2 ½ ක් දෙන්න.මේක අදාළ නිලධාරින්ගෙන් අය කරනවා නම් අපි එකටත් කැමති බව පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ජී.එස්.කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ලේකම්තුමනි,සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,පොදු වෙළඳපොළ දෙවන ආදියරයේ අංක 22 කඩ කාමරය සම්බන්ධව මොහොමඩ් ෂාෆි මහතාගේ වැඩපිළිවෙල ගැන අපේ සභාව 2023 වර්ෂයේ මෙම කඩයට මුද්‍රා තබා තිබේ. නමුත් ඉන් පසුව නැවත ඔහු මොන ඉල්ලීමක් මත මේ ඉල්ලීමක් කළාද? මෙම සභාව ඒ සඳහා ලබා දුන් ප්‍රතිචාරය කුමක්ද යන්න මන්ත්‍රීතුමන්ලා වන අපි දැනුවත් වෙන්න ඕනේ. විශේෂයෙන්ම කියනවා නම් එයා නැවත ඉල්ලීමක් කර ඇත්තේ කුමන කාලපරිච්ඡේදයක් සඳහා ද කියලා ඇති,මොනවා හරි ගෙවීමක් කරලා තියෙනවද? ඔහු හෘදයාබාධ,ඇස් පෙනීමේ දුර්වල පුද්ගලයෙක් ද?ඔහු ව්‍යාපාරය සිදුකරන්නේ අසනීප තත්වය නිසා විය යුතුය. එම නිසා අපි යම්කිසි දෙයක් ඒ අයගේ ජීවන අරගලය කරගෙන යාමට සලසා දීම සුදුසුය. සමහර විට මාස තුන ,හයට ඉල්ලීමක් කරලා ඇති. එහෙම වුණොත් අපි එයාට එම කාල පරිච්ඡේදය ලබාදිය යුතුයි. එහෙම නැත්නම් අපි යම්කිසි වැඩපිළිවෙලක් සාම විනිසුරුවරයෙකු හරහා සිදු කරනවා නම් හොඳයි. 2023 මුද්‍රා කරන එකක් නැවත සභාව දෙනවා නම් මොනවා හරි තේරුමක් තියෙන්න ඕනේ. ඒක සාමාන්‍යයෙන් මන්ත්‍රීලා වන අපි දැනගන්න ඕන.අපි එහි අභ්‍යන්තරය කොහොමද කියලා දන්නේ නැත. ඒ හින්දා මේ සම්බන්ධව යම් වැඩිපිළිවෙලක් සිදු කරනවා නම් හොඳයි කියන එක මගේ අදහස් කරන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාපතිතුමනි,පොඩි කාලේ සිට හැදී වැඩුණු ප්‍රදේශය තමා මෙය මම ළඟින්ම ආශ්‍රය කළා අන්වර්ව ඊළඟට මේ නගරයේ සිටින සහෝදරයෝ සහෝදරියෝ නමුත් අපිට බෑ මේ හොරුත් එක්ක එකතු වෙලා මේ කටයුතු කරල තියෙන්නේ.හොරුන්ට මේ සල්ලි දීලා තියෙන්නේ.සභාවේ හිටපු අපි දන්නෙත් නැත. බොරුවට සුදු හුණු ගාන්න ඕන නැත.මම කියන්නේ බලය තියෙන කාලේ එකතුවෙලා වැඩ කරලා දැන් බලය නැති නිසා මොකද කියන්නේ? වැරැද්ද වැරැද්ද විදියට දකින්න ඕනේ. අපිත් මේ සභාව තුළ වර්ෂ 1991 සිට ඉන්නවා. නමුත් අපි දැකලා නැත.එයාට මෙම කඩේ දෙන්න සභාව අනුමත කරලා කටයුතු සිදු කළා කියලා.ගරු සභාපතිතුමනි, ගරු රුක්මන් මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකඟයි.අපි හරියට කරගෙන ගියොත් කාටවත් අපිට අත දික් කරන්න නොහැකිය. අපි වැරදි විදියට ගත්ත තීන්දු තීරණ නිසා තමයි මෙහෙම දේවල් වෙලා තියෙන්නේ.ඒ නිසා අර මන්ත්‍රීතුමා කතා කරලා කීවා.මහ ඇමති මහීපාල හේරත් මැතිතුමා මේකට අත ගහලා තියෙන්නේ.මට අද ජන්මාන්ත වෛරයක් තියෙන්නේ.ගෙනැල්ල රජ කරවලා පුටුවේ තියලා අපිට ජනතාව දුන්න තැන අපිට දුන්නේ නැත.

අන්තිමේට නැත්තටම නැති වුණා.මට දුන්න පුටුවත් මට දුන්නේ නැත. හිටපු අයට නිදහසේ කරන්න දුන්නෙත් නැත. ඒ නිසා මමත් රුක්මන් මන්ත්‍රීතුමාගේ කතාවට එකඟ බව පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ලයනල් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් යොමු කළා 2023 අවිධිමත් ව්‍යාපාර නිසා ඉවත් කරන්න කියාලා තියෙනවා. ඊළඟට තව එකක් ඒ ෂාහි මහත්තයා නැවත ඉල්ලීමක් කරලා තියෙනවා.ලිඛිතව ඒකට අනුව නැවත කඩේ විවෘත කර තිබෙනවා.එය විධිමත්ව ද අවධිමත්ව ද කියලා අපහටත් වැටහෙනවා. මෙතනදී අපට සභාවක් විදිහට තීන්දුවක් ගන්න වෙනවා. ඉහත කරුණු සැලකිල්ලට ගෙන ඇත්තටම අපි පරණ දේශපාලන වෛරයක් පිරිමහන්න අවශ්‍ය නැත.මොකද අපේ දේශපාලන සංස්කෘතියේ ඒකට ඉඩක් නැති බව පවසන ලදි.අපි බලන්න ඕනේ කවුරුත් එක විදිහට,නමුත් මෙයාට ජීවත් වෙන්න ජීවන වෘත්තියක් කරගෙන යාමට ඉල්ලීමක් කරන්නේ.උපසභාපතිතුමා කරපු යෝජනාව වගේ එකකට. සභාව භාරගත්තට පස්සේ වෙළඳ සංකීර්ණය දෙපස ඇති මාර්ගය විවෘත කිරීමට උත්සාහ කළා. ඒකට හේතුව තමා මේ මාළු කඩ සහ මස් කඩ ප්‍රශ්නය සහ ඇතුළේ අවිධිමත් වෙළඳාමට හේතුවක් තමා එම ගොඩනැගිල්ල ඇතුලට මිනිසුන් නොයාම.ඒකට මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ කතා කළ පසු අපට අවසර ලැබුණා.වෙළඳ සංකීර්ණය මැදින් මාර්ගය විවෘත කිරීමට.එතකොට ඒ සඳහා සභාවේ යෝජනා සම්මතයක් ද පවතී. ඒ සඳහා අවශ්‍ය වැඩකටයුතු කළ පසුව මැදින් මාර්ගය ගියාට පසුව මං හිතන්නේ උපසභාපතිමා මතුකළ කාරණාව අනුව ෂාහි මහතාට අපට වෙන කඩකාමරයක් දීමට හැකියාව ලැබෙන බවත්,එතුමාත් ඒකට කැමති වෙයි.එතකොට අර අවිධිමත් වෙළඳාම නැතිවේ.දැනටත් විධිමත් තියෙන කඩත් එළියේ දමා වෙළඳාම කරන්නේ.ඒ වගේ සාධනීය යෝජනාවකට ගියොත් මං හිතන්නේ සාධාරණ වෙයි. ද්වේශ සහගත පළිගැනීමකට නොයන එක හොඳයි.එහෙම නේද මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා ෂාහි නැවත මගෙන් ඉල්ලීමක් කළා.කඩකාමරය ගැන.මගේ තීන්දුව තමා එයාට කඩෙන් යන්න කියන එක. නැවත ලිපිගොනුව පරීක්ෂා කළාම එයාගේ ඉතිහාසයක් තිබෙන කරුණු නිසා තමයි සභාවට මම යෝජනාව ගෙනාවේ. අපි සභාවේ යෝජනාවක් විදියට මෙහෙම කරමු. එහෙනම් දැනට මේ කඩෙන් ඉවත් වෙන්න දවස් හතක් හරි කීයක් හරි දෙමු. එකපාරටම අයින් වෙන්න නොහැකි නිසා ඊට පිටුපසින් තිබෙන කඩවල අයිතිකාරයින් සිටිනවානේ.ඒවා ගබඩා වශයෙන් තබාගෙන සිටින අය සමඟ සාකච්ඡා කර ෂාහිට අවස්ථාවක් සලසා දෙමු. ඒකට අවශ්‍ය කටයුතු සලසා ගන්නා ලෙස ලිපියකින් දැනුම් දෙමු. එහෙම හොඳ බව පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා

උපසභාපතිතුමාගේ යෝජනාවට අපි විරුද්ධ නැත.උපසභාපතිතුමා සඳහන් කළේ අපේ වෙළඳපොළ පිටුපස ඇති කඩයක් ලබාදෙමු යනුවෙන් ඒකට අපි විරුද්ධ නැත.නමුත් ලබාදෙන ආකාරය පිළිබඳත්, සභාවේ ක්‍රමවේදයට අනුව ටෙන්ඩර් කරල ද ගැසට් කරල ද යන ක්‍රමවේදය අවශ්‍යයි. ටෙන්ඩර් මුදලට ලබා ගන්නේ නැත්නම් ඔහුට සභාවේ අවම ලංසුවට එය මිලදී ගැනීමටත්,සභාවේ කොන්දේසි හා ගිවිසුම් ප්‍රකාරව යන්න ඕනේ බවත්,පවසන ලදි.ඒකට අපි විරුද්ධ නැති බවත්,උප සභාපතිතුමාගේ යෝජනාවට විරුද්ධ නැති බවත් පවසන ලදි.සභාවක් විදියට සභාවේ නීතිය හා කෙටුම්පත් උල්ලංඝනය කරගෙන ඉදිරියට යන්නට නොහැකි බවත්, සභාවක් විදිහට අපට ඒක හොඳ නැති බවත් පවසන ලදි.පිටුපසින් කඩයක් දෙනවා නම් අපි අවුරුද්දෙන් අවුරුද්දට තක්සේරු කර අව මුදලකට සභාවේ කොන්දේසි වලට එකඟව ඒ ගිවිසුම් ප්‍රකාරව ලබා දෙන්න.මෙක අපේ තැනක් වක්‍රව කොහොමහරි ගිහින් තිබෙන්නේ. නමුත් අපට ඒක රකින්න අවශ්‍යතාවයක් නැත.ඔවුන්ව රකින්න ඕන ඔවුන් අපිත් සමග ගිවිසුම් ගතව ඇත්නම් පමණි. නමුත් සානුකම්පිතව උපසභාපතිතුමා පැවසුවා වගේ යම්කිසි පුද්ගලයෙක් ජීවත්වන එක හොඳයි. අපි ඒකට විරුද්ධ නැති බවත්,උපසභාපතිතුමාගේ යෝජනාවට එකඟයි. සභාවේ තියෙන ගිවිසුම් ප්‍රකාරව ඒ සඳහා අවම ලංසුවට ටෙන්ඩර් ක්‍රමයට කැඳ වුවහොත් ලබා දෙන්න ලෙසට පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

කඩයක් සොයා දෙන එක අපේ වැඩක් නෙවෙයි. ප්‍රාදේශිය සභාව කියන්නේ ව්‍යවස්ථාපිත ආයතනයක්. රජයේ නීතිරීතිවලට අපි කටයුතු කරන්න ඕන.මේ කඩය කරන්න ඕන ක්‍රමයක් තිබෙනවා. අපි හිතමු ෂාෆි නම් පුද්ගලයා ඉතා අන්ත අසරණයි කියලා හැබැයි ඒ අන්ත අසරණ භාවය රජයේ නීති උල්ලංඝනය කළහොත් ඒ සඳහා නීතිමය කටයුතු කළ විට අපිට එයින් ගැලවීමට නොහැකිය.එවිට අපි ඊටත් වඩා අසරණ වෙනවා.නීති ප්‍රකාරව අපි දින හතක් එය ප්‍රමාණවත් නැතිනම් මාසයක් හෝ මාස දෙකක කාලයක් හෝ දොළහයි තිස් එක වන විට ඔහුට ඉවත්වීමට කාලයක් දෙමු.එවිට ඔහුට මාස තුනක් ප්‍රමාණවත් කාලයක් පවතී.ප්‍රියන්ත මන්ත්‍රීතුමා පැවසූ කාරණයට යම් සාධාරණයක් ඉටු වෙනවා. දෙසැම්බර් 31 වන විට ඔහුට ඉවත්විමට කටයුතු කරන ලෙසත්,අපේ කඩ කාමරයක් හෝ වෙනත් තැනක් සොයා ගන්නට කියා ඉල්ලීමක් කරමු. ඒ යෝජනාවට සියලු දෙනාම එකඟයි නේද? මොකද ඇත්තටම මම මෙවැනි යෝජනා වලට බෙදීමක් ගන්න කැමති නැත. අපි සියල්ලෝම කැමතිනම් කරමු.නැතිනම් මගේ තීන්දුව මම ක්‍රියාත්මක කරනවා කියන තැන මම සිටින බව පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා

සභාපතිතුමා,ඔබතුමාගේ තීරණාත්මක කතාවෙන් පස්සේ සභිකයන්ට කතා කිරීමට දීමෙන් වළකින්න කියන එක ප්‍රකාශ කරනවා.මොකද ඔබතුමාගේ මේ ප්‍රකාශයේ නීත්‍යානුකූල භාවය නැතිවෙනවා. අපි සියලු දෙනා මන්ත්‍රීතුමන්ලා සභාපතිතුමාගේ අවසාන කතාවෙන් පස්සේ කිසිදු මන්ත්‍රිවරයෙකුට එම විෂය සම්බන්ධව කතා කිරීමට අයිතියක් නැත.සභාපතිතුමා ඒ යෝජනාවට තීරණයක් ගත්තනේ කුමක්ද සිදු කරන්නේ කියලා එතකොට එය සභාපතිතුමාගේ අවසාන තීරණයයි. සභාවේ අවසාන තීරණය තමා එතුමා ප්‍රකාශයට පත් කළේ. ඉන්පසු කතා කිරීමේ අයිතියක් නැත.සභාපතිතුමා පැහැදිලිවම ප්‍රකාශ කළා දෙසැම්බර් 31 වන විට ඉවත්වීමට කල්දෙමු කියලා. එතැනින් පස්සේ කරනවාද නැද්ද කියලා අහන්න ඔබතුමාටවත්, මටවත් අයිතියක් නැති බව පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

දෙසැම්බර් 31 වෙනකනම් කල් දෙමු. සැමගේ නිහඬතාවය නිසා මා හට තීන්දුවක් ගැනීමට සිදුවේ.මොකද ඔබතුමා මම ප්‍රකාශ කළේ මේ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය:- 2025 දෙසැම්බර් 31දින වන විට කඩ කාමරයෙන් ඉවත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර ගන්නා ලෙස දන්වා ලිපියකින් දැනුම් දීමට තීරණය විය.

(iv) දෙල්දෙනිය ශ්‍රී සිවලී පෙර පාසලේ සෙල්ලම් මිදුල අලුත්වැඩියා කිරීම , පවතින සෙල්ලම් උපකරණ සිටුවා ඇති තැන් සේදී යාම නිසා භාවිතා කිරීමට අපහසු තත්වයක පවතී. මෙම උපකරණ නැවත අලුත්වැඩියා කිරීමේ තත්වයක ද පවතී. තීරණය ගැනිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ශ්‍රී සීවලී පෙර පාසලේ සභා දේපළක් වන්නේ ගොඩනැගිල්ල පමණි. 50" 30" කැල්ලක් පමණි අපට අයිතියි.ඒ කියන්නේ ගොඩනැගිල්ලේ දිගයි පළලයි.භූමිය සභා දේපලක් නොවේ. ඉතිහාසය අනුව දැනට සිටින පෙර පාසල් ගුරුතුමියද පෙර පාසල් ගොස් තිබෙන්නේ එම පාසලටමයි.දැලිවල පන්සලේ තමා මෙම පෙර පාසල පවත්වාගෙන යනු ලබන්නේ.සෙල්ලම් මිදුලක් තිබෙනවා.එහි උපකරණ සවි කර තිබෙනවා.පළාත් සභාවේ මුදල් යොදවලා තිබෙනවා.මේ වන විට මෙම සෙල්ලම් මිදුල අනතුරුදායක තත්ත්වයක පවතී.සෝදා පාළුවෙලා කොන්ක්‍රීට් කැලි උඩට මතුවෙලා පොඩි දරුවන්ට දුවලා පැනලා සෙල්ලම් කිරීමට කිරීමේදී වැටීමේ අවදානමක් පවතී. ඊට ඉහළින් ගලායන ජල පහරක්

නිසා වැසි කාලයට ජලයෙන් යට වීමේ තත්ත්වයකට මුහුණ දෙයි.කීපවිටක්ම මාහට ඉල්ලීම් පැමිණියා නමුත් එය අපේ දේපලක් නොවන නිසා පන්සලේ ස්වාමීන් වහන්සේගෙන් අවසර ලබා ගන්නා ලෙස දැන්වූ බව පවසන ලදි.එතුමා එම කොටස සෙල්ලම් මිදුලක් ලෙස යොදාගැනිමට අකැමැත්තක් නොමැති බවට ප්‍රාදේශිය සභා අනුමැතියට ලිපියකින් දැනුම් දෙන ලදි. මම දැන් සභාවට යෝජනා කරන්නේ එම උපකරණ ටික සහා අරමුදලෙන් වියදම් දැරීමට සිදුවන නිසා එම උපකරණ අලුත්වැඩියා කිරීමට සහා අනුමැතියට ඉදිරිපත් කිරිම.සභා දේපලක් ලෙස පවතින්නේ එම ගොඩනැගිල්ල පමණක් බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පන්සලේ ගොඩනැගිල්ලේ පෙර පාසල කරගෙන යන විට පන්සලේ කැමැත්ත ප්‍රකාශ කළා.අපට වෙනම සකස් කර ගැනිමට.හැබැයි බිම අපට අයිති නැත.සභාව මැදිහත් වෙලා පෙර පාසලේ අනෙක් කටයුතු සිදු කළේ.එම නිසා මම කියනවා කාලයක් තිස්සේ කරගෙන පැමිණි පෙර පාසල නිසා එම පෙර පාසලට අයිති සෙල්ලම් මිදුල සකස් කිරීම සඳහා මෙම සභාවෙන් වියදම් කරලා එම කටයුත්ත සිදු කරමු. අපට පෙර පාසල් සම්බන්ධ යම් වියදමක් සිදුකිරීම කල හැකිය.ඒ නිසා මෙම ආගමික ස්ථානයක් ඒ සම්බන්ධව විරුද්ධත්වයක් නැතිනම් ස්වාමීන් වහන්සේ කැමැත්ත ප්‍රකාශ කරනවා නම් අපි රඹුක්කන ප්‍රාදේශීය සභාවේ වියදමින් එම පෙර පාසලේ සෙල්ලම් මිදුල සකස් කරමු.කියන යෝජනාව ස්ථිර කරන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි, මෙම පෙර පාසලේ සෙල්ලම් මිදුල සම්බන්ධව අපේ පනත අනුව සභා දේපළ සඳහා පමණයි වියදම් කිරීමට හැකියාව ඇත්තේ. නමුත් මෙම යෝජනාව ඔබතුමා පැවසූ පරිදි මෙය කළ යුතුව තිබෙනවා.මම හිතනවා ඉදිරියේදී අපට ගැටලු ඇති නොවන ආකාරයට කටයුතු කරමු.මෙම යෝජනාව ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව මෙම පෙර පාසල් මිදුල සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ජේ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාවට විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අප ගන්නා තීන්දු මත තමා ළමයින්ගේ ක්‍රියාකාරකම්වල ගුණාගුණ මැනීම සිදු වන්නේ. එම යෝජනාවට අපි කවුරුත් එකඟයි.රුක්මන් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත් මෙම කටයුතු සිදු කරමු.යනුවෙන් පවසන ලදි.

ආදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව සිදු කිරිමට තීරණය විය.

(v) 2022 හා 2023 වර්ෂ වල ප්‍රදර්ශනය වී තිබුණද 2024 වර්ෂය වන විට ඉවත් කර ගෙන අදාළ ප්‍රදර්ශනකරුවන් හඳුනාගත නොහැකි වූ දැන්වීම් පුවරු ගාස්තු රු116,025.00 හා 2023 හා 2024 වර්ෂයන්හි සත්‍ය වශයෙන්ම ඉවත් කර තිබූ හෙයින් ලැබිය යුතු මුදලක් ලෙස ලේඛනගතව ඇති දැන්වීම් පුවරු ගාස්තු රු374,625.00 ක් හා අතුරු ව්‍යවස්ථානුකූලව වෙළඳසැලේ නාමය ඇතුළත් දැන්වීම් පුවරු මෙම දැන්වීම් පුවරු ගාස්තු සඳහා

නීත්‍යානුකූලව අදාළ නොවුනද එවැනි දැන්වීම් පුවරු වලින් අය විය යුතු ගාස්තුවක් ලෙස රු126,750.00 ක ගාස්තු මුදලද අය විය හිඟ මුදලක් ලෙස ලේඛනගතව ඇතත් එම මුදල් අය කර ගත නොහැකි මුදල් වේ.ඒ අනුව ඉහත පරිදි ලේඛනගතව අය කර ගත යුතු සම්පූර්ණ මුදල රු 617,400.00 ක් වේ. මෙම මුදල අය කර ගත නොහැකි මුදලක් බැවින් සියලු කරුණු ගරු ආණ්ඩුකාර තුමියගේ අනුමැතිය ඇතිව කපා හැරීමද කල යුතුය.එබැවින් ලේඛනගතව ඇතත් අයකරගත නොහැකිව ඇති රු.617,400.00 ක මුදල කපා හැර ලේඛනගත ශේෂයන් නිවැරදි කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පනතේ 192 වගන්තිය අනුව රු1000.00 ට යටත්ව මුදල් අය කර ගත යුතුයි. නමුත් අතුරු ව්‍යවස්ථාවක තිබෙන්නේ වර්ග අඩියකට ගාස්තුවක් අය කරන්න කියලා තිබෙන්නේ.ඔය දෙක පටලවාගෙන තමා මේ ලේඛනගත කරලා තියෙන්නේ. 2022/ 2023 කාලය තියෙන්නේ කොරෝනා වසංගත පැවති කාලයයි. මෙම දැන්වීම් පුවරු සවිකිරීම හඳුනාගැනීමට නොහැකි වී ඇත.ඒ අදාළ පුද්ගලයන් සොයා ගැනීම නොහැකි වී තිබේ. නමුත් මේ ලේඛනයේ මෙය දිගින් දිගටම සටහන් වෙලා තිබෙන්නේ. මොකද අපේ ලේඛනය ලොකු ඉලක්කමක් තිබෙනවා.අයකර නොගත් මුදල් ලෙස,මෙය ප්‍රායෝගික නැත. කම්ටුවක් යොදා බැලුවා නඩු මාර්ගයකට ද යාමට නොහැක.සභාවට අහිමි වූ මුදලක් නොවෙයි. පුරුද්දට ලේඛනගත වෙලා ඉදිරියට ආපු දෝෂ නිසා තමා ලේඛනගත වී තිබෙන්නේ.ලේඛනයෙන් ඉවත් කර ගැනීමට තමා යෝජනා කරන්නේ යන බව පැහැදිලි කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

වරිපනම් බදු අය කරගන්න මන්ත්‍රීවරු සිටිනවා.මට පරිපනම් බදු ගෙවීම කිසිම අපහසුවක් නැත.පාර රේජිස්ටර් නැත.පාරට කොන්ක්‍රීට් එකක් දාගන්න මුදල් වෙන් කර නැත. මේක රෙජිස්ටර් නැති නිසා කරන්න නොහැකි බව පවසනවා.මේ තත්ත්වයත් එක්ක මම සභාවට යෝජනාවක් ගෙනාවා සභාපතිතුමනි,වාද විවාද කළා පලක් වුනේ නැත. රැකියාවක් නැත. දැන් ගෙවන්න විදිහක් නැත.මගේ නැති බැරිකම කීවාට වැඩක් නැති බව පවසන ලදි.වරිපනම් බදු අය කරනවා නම් පහසුකම් සපයා තමා අය කිරීම් කරන්න ඕනේ.අපි මේ නගරයේ වරිපනම් අය කරනවා නම් අඩුම තරමේ ඉස්සරහ තියෙන විදුලි බල්බයවත් ක්‍රියාත්මක වෙන්න ඕනේ.මම ඒකට විරුද්ධ වුණා.සභාවට දැම්මා සභාවෙන් ඉඩ දුන්නෙත් නැත.මම කීවා මම ගෙවන්නෙම නෑ කියලා.දැන් මේක ලේඛගත වී තිබෙනවා. නිලධාරි මගේ නිවසට ගිහින් මගේ බිරිඳට කරදර කරනවා.මන්ත්‍රීතුමා කෑ ගැහුවට ලේඛනයේ තියෙනවා.ගෙවන්න වෙනවා කියලා. මම ඔබතුමාගෙන් පරීක්ෂණයක් ඉල්ලනවා.ඔබතුමාටත් කීවා ලේකම්තුමාත් බලන්න අපේ ගෙදරට යන්න තියෙන පාරේ ගෙවල් වලින් අය කරන්නේ නැත. කොනේ තියෙන මගේ ගෙදරින් අය කරනවා.මොකද මේ අපෙන් පලි ගන්න.ඒකයි මම කියන්නේ අපෙන් පලිගන්නවා නම් අපි මොකද කරන්නේ නොගෙවා ඉන්න ඕනේ.හැබැයි එහෙම ඉන්නත් නොහැකියි.මෙහි නිලධාරීන් ගෙදරට ගිහින් බඩු ටික උස්සගෙන එයි.එහෙම තත්ත්වයක් තියෙන්නේ.ඒ නිසා මම හිතන්නේ මේ කටයුත්තේදී කපා හැරීම් කියන්න නොහැකිය.එහෙනම් මගෙත් කපා හරින්න තිබුණා. මගේ කපා හැරියේ නැත.ඉල්ලීම් කළා යෝජනා කළා සභාවේ කතා කළා ඒත් කපා ඇරියේ නැත.දැන් කොහොමද මේක කපා හරින්නේ? ඒක ඒ විදිහටම තිබුන දේ. අපේ නොගෙව්වා වගේම කපා හරිනවාට අපි කැමති නැති බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

ඇත්තටම එම මුදල් අය වුණාද කියලා අපි දන්නේ නැති නිසා විධිමත් පරීක්ෂණයක් කරලා තීරණයක් ගනිමු යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

සභාපතිතුමනි,යම්කිසි වැඩපිළිවෙළකට හා මෙහි කොන්දේසි වලට අනුව මේ අය සාමාන්‍ය යම් ප්‍රදර්ශනයක් පවත්වාගෙන යාමට යම් මුදලක් සභාවට ගෙවලා ඇති බව පවසන ලදි.එම මුදල වගේම එම පුද්ගලයින්ගේ හැඳුනුම්පත් අංකය දුරකථන අංගයේ සියලුම දේවල් අරගෙන බව සඳහන් කරන ලදි. නමුත් මේ පුද්ගලයින් නැතැයි කියන එක අපි විසින්ම මගහැරීමක් කරන්නේ. එම නිසා මම විශේෂයෙන්ම කියනවා එම මුදල් සම්පූර්ණයෙන්ම අය කරගන්න කියලා. එම මුදල් අය කර ගැනීම සුදුසුයි. මොකද අපි සභාවක් විදියට යම් වැඩපිළිවෙලකට හා එහි කොන්දේසි අනුව තමයි. මේ කටයුතු කරන්නේ.එහෙම නම් එය අතර මැදදී අත් හැරලා යන්න නොහැකිය.ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා මෙම මුදල සම්පූර්ණයෙන්ම අය කර ගැනීම සුදුසු බව,මම ජීවත්වන ප්‍රදේශයේ ඔබතුමන්ලා දන්නවා වරිපනම් බදු අපෙන් අය කර ගන්නේ නගරයේ පවතින හුරීමළුව වසම නිසා නමුත් අප ප්‍රදේශය තවම හරියාකාරව විදුලි බල්බයක්වත් පත්තු වෙන්නේ නැත. මම ගරු සභාපතිතුමාට පැහැදිලි කළා.නමුත් ඒක තවමත් ඒ වගේමයි.අපේ ගෙදරට යන පාරෙත් විදුලි බල්බ දැල්වෙන්නේ නැත.ඒ වගේ මේකෙත් හොඳ දේවල් තිබෙනවා.ඒ නිසා මේකත් හොඳ විදිහකට හිතලා කරන්න කියලා මම ආයාචනා කරන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි,මම හිතන්නේ 2022/2023 වර්ෂවල නාමපුවරු අය කිරීමේ මුදල වශයෙන් රු617,400.00 තිබෙනවා. සභාපතිතුමනි මේකෙදි අපි පනත අනුවත්,අතුරු ව්‍යවස්ථාව අනුවත් මේක සඳහන් වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි,මේකෙදි අපට මේ මුදල අය කර ගැනීමේ නීතිය අනුකූල භාවයකුත් මං දන්නා පරිදි නැත.නඩු මහකට ගියොත් මෙම මුදල සභාවක් විදිහට අපි පරදිනවා.ඒ වගේම නාමපුවරු මම හිතන්නේ මේ අවුරුද්දෙත් නාමපුවරුව තිබේ. අදාල වෙළඳ හිමියොත් නැ ගොඩනැගිල්ල විතරයි. නාමපුවරුව තිබුණට වෙළඳ ව්‍යාපාරය නැත. කඩය වහලා දාන්න පුළුවන් නැතිනම් වෙනත් කෙනෙකු කරගෙන යන්නත් පුළුවන් ඔබතුමාගේ යෝජනාවේ සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යවන්න එතුමියට යොමු කිරීමෙන් පසුව එන පිළිතුරට අපි විසඳුමක් දෙමු.ඔබතුමියගේ යෝජනාවේ මේක පැහැදිලිවම තිබෙනවානේ ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය යටත්ව මෙය කපා හරිමුයි කියලා. මොකද මේක ලේඛනගතව කරගෙන අවුරුද්දෙන් අවුරුද්දට යනවට වඩා හා නීතිමය පැත්තට ගියත් අපට මේක අය කරගැනිමට නොහැකිය.ප්‍රසිද්ධ ආයතනයක් වුණාට මන්ත්‍රීතුමනි මේ සම්බන්ධව ව්‍යවස්ථාවේ විග්‍රහ කරලා තියෙනවා අතුරු ව්‍යවස්ථාවකදී රු1000.00 ක් ඉක්මවා යා නොහැකි බව නමුත් සභාව මේක ආදායම් පැත්තෙන් ගණන් බලනකොට මේක අය කරලා තිබෙන්නේ වර්ග අඩි ගණනකට එතකොට වර්ග අඩි ගාණනට යනකොට රු1000.00 ඉක්මවා ගොස් තිබේ. නමුත් අතුරු ව්‍යවස්ථාවේ තිබෙන්නේ රු1000.00 නොඉක්මවා අය කරගන්න කියලා.ඒ නිසා මේක ඉදිරියට යාම අපහසුයි බැවින් ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබීමෙන් පසුව ඒ අනුව කටයුතු කරමු යැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මේ යෝජනාව අනුව මෙහි සඳහන් කරලා තිබෙන්නේ මේක කපා හරිමුයි කියලා. ප්‍රශ්නෙ තියෙන්නෙ දැන් අපට හිතාගන්න නොහැකිය.මේක අයින් කරනවද කියලා. නමුත් මෙහි සිටිනවා තාක්ෂණික නිලධාරීන් ,ආදායම් පරීක්ෂවරු ඒ අයත් වාර්තා දීලා තිබෙනවා.මේ වාර්තාවේ දිනේ සම්බන්ධ වෙලා නැත.ඒ නිසා අපට කියන්න නොහැකිය.මේක 2024 පරීක්ෂා කළාද කියන එක මේ දිනය සම්බන්ධව අපට හරි නිගමනයකට එන්න පුළුවන්නම් ඇත්තටම අපට මේක ඉවත් කරන එක ගැටළුවක් නොවේ. හොඳම එක මේක ලේඛනයෙන් ඉවත් කරන එක නමුත් ඉවත් කරද්දි මේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ අපි සියලුදෙනාටම ගැටලුව ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයට මෙහි දී ඇති තහවුරුව ලබා ගැනිමත්, එහි දිනය ගැටලු සහගතයි බව ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මේ වගේ ප්‍රශ්න වලදි උපසභාපතිතුමා ප්‍රකාශ කලා වගේ අපි නැවත නැවත එල්ලීගෙන යන්න ඕන නැත.මෙයා විගණන පරීක්ෂාවේදී විගණනයට ලක්වුණ කරුණක්ය.2022 සිට ඉදිරියට එන එකක් විගණනයට ලක් නොවී තිබිය නොහැක.විගණනයේදීත් අපට ප්‍රකාශ කළේ මේක ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු සිද්ධ කරගන්න කියන එක.මේ තියෙන්නේ ආදායම් පරීක්ෂණගේ වාර්තාය.ඒ කියන්නේ ඒ ගැන වාර්තා කරල තිබෙනවා කියන එක,මේකෙ දිනේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ ආදායම් පරීක්ෂක මහත්වරුන්ට ප්‍රකාශ කරමු. මේකට දින සහිතව පැහැදිලි වාර්තාවක් එක්කම අපි මේක ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යවමු. අපට විගණනයේදීත් කියනවා නම් ආදායම් පරීක්ෂක නිලධාරීත් කියනවා නම් අපට පනතට අනුව නීතිමය පැත්තට ගොස් දිනා ගැනීමට හැකියාවක් නොමැති බවත් හැඟෙනවා නම් මට හිතෙන්නේ මේක අල්ලාගෙන ඉන්න එක තේරුමක් නැති බවය.කොච්චර සාකච්ඡා කළත් මේක 2022/2023 වර්ෂ වල මොකද වුණේ කියලා අපට සොයා ගන්න නොහැකිය.මෙය ලේඛනගත කිරීම් කරන්නේ මේ ආදායම් පරීක්ෂක නිලධාරීන් එතුමන්ලාගේ නිරීක්ෂණ අපට පිළිගන්න වෙනවා. දින මුද්‍රාව තබා මෙතුමන්ලා ලබා දුන් වාර්තා වලින් අපි තහවුරුවක් ලබාගනිමු.අපේ ආරක්ෂාවට මොකද අපි එම ලිපිවලට යටත්ව තමයි මේක ආණ්ඩුකාරතුමියට යවන්නේ. මෙහි සඳහන් වෙලා තිබෙනවා මෙය නිදහස් කර ඇත.ගෙවා නැත.මේක ලියන කෙනෙක් සිටිනවානේ අපි එයාට කියමු තහවුරුවක් කරන්න කියලා දිනේ යොදා අත්සන් කර හැඳුනුම්පත් අංකය යොදා එයා ඒ සම්බන්ධ වගකිය යුතු නිසා ඒ දින මුද්‍රාවත් යොදා අනුමැතියට යැව්වද තව මොනවා හරි එකතු වෙන්න ඕනේ.මම මේක නිකමට යෝජනා කළා නොවෙයි.මේ සම්බන්ධව සොයා බැලුවා ඔබතුමා ප්‍රකාශ කළ කාරණා පිළිබඳවත් මා සොයා බැලුවා. එතුමා ප්‍රකාශ කළ පරිදි දැන්වීම් පුවරු තිබෙනවා. කඩේ තියෙනවා නමුත් පුද්ගලයින් නැත.රටේ කලබලයක් පැවති කාලයක්නේ කොරෝනා ඇවිත් කඩවල් වහල ව්‍යාපාර වැටිලා එහෙම තිබුණ කාලයක් මේක. ඒවත් මේකට බලපාන්න ඇති. මම ඒකම කියලා කියන්නේ නැහැ. 2022/2023 දක්වා කාලයේ විගණනේදී ප්‍රකාශ කරනවා නම් මේක මෙහෙමයි කියලා ඒකයි මෙහෙම කියන්නේ.යනුවෙන් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

මේක පැහැදිලිවම කියනවානේ 2022/2023 වර්ෂ වල ප්‍රදර්ශනය වී තිබුණද කියන එක උපකල්පන වලින් එකක් 2024 වර්ෂය වන විට ඉවත් කරගත් දැන්වීමකුත් නැත.අදාළ ප්‍රදර්ශනකරුවන් හඳුනාගත නොහැකි වූ දැන්වීම් පුවරුවක් 2022/ 2023 ප්‍රදර්ශනය වුණා. 2024 ඉවත් කර නොමැත.2025 වර්ෂයේද මොකුත් නැත. 202/2023 වර්ෂ වල තමයි මේ හිඟය තියෙන්නේ. ඒක එක දිගටම ඉදිරියට එනවා. මේ සම්බන්ධව සභාවේ අනුමැතියක් ලැබුණේ නොමැති බවට මම යෝජනා කරන බවත් පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මේකේ පැහැදිලිව කියනවානේ අපි කවුරු මතද විශ්වාස කරන්නේ කියලා ආදායම් පරීක්ෂක මත විශ්වාස තියෙනවද ?අපි ගිහින් පරීක්ෂා කරනවාද ?නිලධාරීන් විශ්වාස කරන්න බැරි නම් ඒ නිලධාරීන්ට මේකේ බර දෙමු.නිලධාරීන් මේ සම්බන්ධ විධිමත් වාර්තාවක් ලබා දෙන ලෙස දන්වමු.මේක අය කරගන්න බැරි වුණේ මේ හින්දා දැන් මේකෙම තියෙනවා පහත සඳහන් දැන්වීම් පුවරු ගාස්තු සත්‍ය වශයෙන්ම ප්‍රදර්ශනය නොවූ එහෙත් රජයට මුදලක් වශයෙන් ලේඛනගත ඇති දැන්වීම් පුවරු ගාස්තු ලෙස මේ සඳහන් කරලා තියෙනවා. ඒකට අනුව කටයුතු කරමු. මම මේකට හරි පිළිතුරක් දෙන්න ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යවනවා. සභාවටත්,මටවත් මේ සම්බන්ධව තනි තීරණයකට යන්නට නොහැකි නිසා මේ ආදායම් පරීක්ෂක නිලධාරී මහත්මිය චන්ද්‍රිකා කුමාරි මහත්මිය තමා මේ ලේඛනය ලබා දෙන්නේ අපි එතුමියට කියමු මේකේ විධිමත් ආකාරයට දෙන්න කියලා නිල මුද්‍රාව / දින මුද්‍රාව තබා අත්සන් යොදා මේ තොරතුරු ලබා දෙන්න කියලා.අපි මේකට බෙදීමකට යන්න ඕනද? මම දන්නෙත් නැහැ මෙහි ඇතුලත් දෑ සත්‍ය ද අසත්‍යද කියලා. නමුත් කරුණු විමසා බැලීමේදී මට තේරුණා පැහැදිලිවම ඉදිරිපත් කරලා තියෙනවා දෝෂ සහිතව ලේඛනගත වෙලා කියලත් පිළිගන්නවා. විගණනේදීත් පිළිගන්නවා. ඒ නිසා තමයි කියන්නේ මේක ගරු ආණ්ඩුකාරතුමියට ඉදිරිපත් කරලා ඉවත් කරන්න කියලා. අපිට තියෙන ලොකුම පරීක්ෂණය තමා

විගණනය.විගණනයෙන් ද ප්‍රකාශ කරනවා නම් මෙය ඉවත් කිරීමට කටයුතු කරන්න කියලා තව මොකක්ද? මම හිතනවා මේ ආදායම් පරීක්ෂක තුමියගේ විධිමත් තහවුරුවක් මගින් මෙය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යවමු යැයි කියලා යෝජනා කරමු. මේක අපි ගරු ආණ්ඩුකාරතුමාට යවනවා ආදායම් පරීක්ෂකවරුන්ගේ වාර්තාව නිසි පරිදි ඔවුන්ගේ වගකීම් සහතිව ලිපියක් ලබාගෙන බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

නිල මුද්‍රාව / දින මුද්‍රාව ,අත්සන සහිතව ආදායම් පරීක්ෂක නිලධාරිගෙන් විධිමත් ආකාරයට වාර්තාවක් ලබාගෙන ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැති සඳහා ඉදිරිපත් කිරිමට තීරණය විය.

(vi) කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින ගැටලුකාරී තත්වයන් නිරාකරණය කර ගනිමින් දෛනික කටයුතු පවත්වාගෙන යාම සඳහා ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් සේවකයින් 6 දෙනෙකු බඳවා ගැනිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගොන්දෙනිකන්දේ කසල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අපට සේවක හිඟයක් පවතී.අපිට ගරු ආණ්ඩුකාරතුමියගෙන් කලින් අනුමැතියක් ලැබිලා තිබෙන බවත්,එම නිසා කොන්ත්‍රාත් පදනම් මත සේවකයින් හයක් බඳවා ගැනීමට ඒ පිළිබඳ යෝජනාවක් බව පැහැදිලි කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන හිටපු සේවකයින් ඉවත් කරලා තිබෙනවා.දැනට මාස තුනකට හතරකට ආසන්න කාලයක දී මට මතක හැටියට 2022/2023 බඳවා ගත්ත සේවකයින් හයක් වගේ ආසන්න ප්‍රමාණයක් හිටියා. ඒ පිරිසම නැවත බඳවා ගන්නවාද? නැතිනම් අලුතින් අය බඳවා ගන්නවාද? හිටපු පුද්ගලයින්ට අසාධාරණයක් වගේ තිබෙන නිසා ඒ කට්ටියම නැවත බඳවා ගැනීමට පුළුවන් නම් ඒක වටිනවා මොකද? ආණ්ඩුකාරතුමියගේ අනුමැතියකුත් තිබෙනවා පෙර සේවය කළ සේවකයින්ම බඳවා ගැනිමට මොකද නැවත රාජකාරියකට පුහුණු කිරීමට අවශ්‍ය වන්නේත් නැත. ඒ අය ඒ සම්බන්ධව දැනුමක් තිබෙන නිසා මම යෝජනා කරනවා හිටපු සේවකයින් නැවත සේවයට යොදා ගැනිම සුදුසු බවට යනුවෙන් ප්‍රකාශ කරන ලදී

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

හය දෙනෙක් ගන්න කොට මට හැඟෙන විදියට නම් හිටපු අය අසනීප වෙලා වයසට ගිහින් මෙහෙම නැත්නම් වෙනත් රැකියාවකට ගොස් ඉන්න පුළුවන් බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දැන් බඳවාගන්න දෙන්නත්,මෙහි සේවය කරලා ඉඳලා ගියපු දෙන්නේක්.එක්කෙනෙක් දැනට මාස කීපයකට පෙර මිය ගියා. ඒ නිසා පුරප්පාඩු තිබෙනවා. සැමට මරණය පොදුයි, හිටපු අයම තමයි මේකට ගන්න වෙන්නේ.ගැටලුවක් නැති බව සභාවෙන් අසන ලදි.එහිදී සභාවේ විරුද්ධත්යක් නොමැති බැවින් සේවකයින් හයදෙනෙක් ලබා ගැනිම සිදුකරන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් සේවකයින් 6 දෙනෙකු බඳවා ගැනිම අනුමත කිරිම තීරණය විය.

(vii) 2026 වර්ෂයට අදාලව ගැසට් පත්‍රයේ පල කිරිම සඳහා සංශෝධනය කල යුතු යැයි යෝජනා කරන ලද ගාස්තු සහ සියලුම බදු පැනවීම් සම්බන්ධව සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපේ ලිපි ලේඛන ගාස්තු සහ ගලි බවුසරය පිළිබඳ ගාස්තු සංශෝධනයට ඉදිරිපත් කළේ. සමහර ඒවායේ සේවා ගාස්තුවත් අපට ආවරණය නොවන අවස්ථා තිබෙනවා.ගලී බවුසර වගේ දේවල් ගත්තාම අපට ආසන්නව තිබෙන ප්‍රාදේශීය සභාවල අපට වඩා ගාස්තු අය කිරීම් වැඩියි.ඒවාත් සමඟ සලකා බලා ගාස්තු සංශෝධනයට ඉදිරිපත් කළ බව පවසන ලදි.මෙහි සංශෝධන තවත් අවශ්‍ය නම් යෝජනා කරන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

ගලි බවුසරයට ගෘහස්ථව = රු 6500.00 ක්ය එය රු 8600.00 දක්වාත්,

ව්‍යාපාරික නම් = රු 6500.00 ක්ය එය රු10,000.00 දක්වාත්,

**බල ප්‍රදේශයෙන් පිටත නම්,**

ගෘහස්ථව = රු 11,000.00 ක්ය එය රු12,000.00 දක්වාත්,

ව්‍යාපාරික නම් = රු 11,000.00 ක්ය එය රු15,000.00 දක්නාත්,

සංශෝධනය කිරීමට හා බැකෝ ට්‍රේලරයට අපි තීන්දුවක් ගත්තා මුල් පැය දෙක සඳහා රු10,000.00 ක්ද ඉදිරි පැය 50 දක්වා රු 4500.00 ගානේ අය කිරීමටත්, අනතුරුදායක ගස් සම්බන්ධ ඉල්ලුම්පත්‍ර දෙකක් ඇත.මන්ත්‍රීවරුන් විසින් සභාපතිතුමාට සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොමැති බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 වර්ෂයට අදාලව ගැසට් පත්‍රයේ පල කිරිම සඳහා සංශෝධනය කල යුතු යැයි යෝජනා කරන ලද ගාස්තු සහ සියලුම බදු පැනවීම් අනුමත කිරිම තීරණය විය.

(viii) මෙම සභාව සතු ලින්සා සුපර් සෙන්ටර් ආයතනය ඉදිරිපිට ඇති අඩි 20 ක් දිග පලල අඩි 12 ½ පමණ වන බිම් කොටස රථවාහන නවතා තැබිම සඳහා බදු දිම සම්බන්ධයෙන් චක්‍රලේක අංක ප.පා.කො.01/2023 හා 2023.05.01 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන්, වන විට එම පනතේ 16 සහ 18 වගන්තිවලට අදාල වන ප්‍රාදේශිය සභාවට අයත් දේපලක් බදුදීමේදී ඒය කවර කාල සිමාවක් සඳහා අවස්ථාවෝචිත පරිදි පළාතේ පළාත් පාලන විෂය භාර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඒය ඉදිරිපත් කල යුතුය. එහෙයින් ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

පැරණි ප්‍රාදේශීය සභා භූමියෙහි ඉතිරි වී ඇති කොටස් එළිපෙහෙළි කර යම් පුද්ගලයකුට බදු දීම සඳහා ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සකස් කළ යෝජනාව බව පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

අඩි 20 ක් දිග පළල අඩි 12 ½ පමණ ලෙස තමා සභාපතිතුමනි, ස්ථිර වෙලා තිබෙන්නේ. ප්‍රශ්නයක් තිබෙනවා සභාපතිතුමනි,දැනට ඒ සම්බන්ධව අධිකරණයේ නඩුවක් තිබෙනවා. එහෙම නඩුවක් තිබෙද්දී අපට තීන්දුවක් ගන්න බැරිවෙයි.හැබැයි සභාව සතු ඉඩමක් ලෙස තිබෙන්නේ හරි යන්නත් පුළුවන්. වාර්ෂික බද්ධකට දෙනවා නම් දෙන්න පුළුවන්.මම ඔබතුමාට පෙර අවස්ථාවකත් ඉදිරිපත් කළා ලොතරැයි අලෙවිහලක් දමා ගැනීමට කෙනෙකුට දෙන්න.නමුත් මම කීවා සභාපතිතුමාගේ අනුමැතියට තවම මම එම ලිපිය ඉදිරිපත් කළේ නැත කියලා.හැබැයි මෙතන තියෙන ප්‍රශ්නය තමා විශේෂයෙන් බදු දීමක් සම්බන්ධයෙන්, විශේෂයෙන්ම පිටස්තර පුද්ගලයකුට වාර්ෂික බද්ධක් නොමෙයි මේක වාර්ෂික බද්ධක් නම් ප්‍රශ්නයක් නැත.අවුරුද්දෙන් අවුරුද්දට වෙනස් කරමු. එතකොට මේකට අධිකරණයේ නඩුවක් තිබෙනවා.අපේ මේ ඉඩම් කොටස සම්බන්ධයෙන්,අපි මෙම ඉඩම් කොටස වෙන් කළේ නඩුවක් තිබෙන නිසායි.අර රාජපක්ෂ නෝනා මහත්මිය නීතිඥ මහත්මිය එයා නඩුවක් දැම්ම අපට විරුද්ධව ඒක ඇවිත් මේ දේපලට මෙහා පැත්තෙන් කැන්ඩි මුදලාලි එයා කියනවා මගේ තාප්පෙ කඩල හදලා දෙනවා නම් දෙන්නම් ඉඩම කියලා. එතකොට අපිට පුළුවන් අපේ සභාවට තිබෙන එම කොටසත් දමලා පාර පළල් කරන්න.රාජපක්ෂ නෝනා දෙන්නේ නැත්නම් තියෙන විදිහට මෙම පාර වාහනයක් නවත්තන්න පුළුවන් විදියට මෙම පාර හදාගන්නත් පුළුවන්. රාජපක්ෂ නෝනා දෙන්නේ නැත නමුත් කැන්ඩි මුදලාලි අඩි 12 ක ප්‍රමාණයක් අපට දෙන්න කැමතියි. එහෙම අරගෙන පාරේ තියෙන ප්‍රශ්නයේ විසඳාගන්න පුළුවන්. ඒ අනුව මේක බදු දුන්නොත් මේ පාර ගන්න අපට හැකිවෙන්නේ නැත.මේක සභාව සතු දේපලක් මේක අපි තියාගනිමු කියන යෝජනාව තමා මම කියන්නේ මොකද නඩු කටයුත්තකුත් පවතින නිසා තාම දින දිලා නැත්තේ. ඒ වගේම තමයි දිසානායක කඩේට එහා පැත්තේන් කඩලා ඉතුරු වෙලා තිබෙන කීර්ති මහල් ගොඩනැගිල්ලත් එක්ක කිරිඅප්පු කියන පුද්ගලයාගේ කඩේ සභාවට බදු දීල තිබෙන්නේ.ඒක අත්සන් කරගන්න ඕනේ සභාපතිතුමා මොකද හේතුව ඔය රාජපක්ෂ නෝනගේ ඉඩම් කෑල්ල අත්පත් කරගන්න බැරි වුණේ.වාහන නතර කරපු නිසා,වාහන නතර කරන්න තැනක් නෑ කියපු නිසා. දැන් පාර පළල් නිසා දැනට එන වාහන නතර කරලා යනවා.නමුත් පාර පාවිච්චි වෙන්නෙ නැත. එතකොට එහාට යාමට මෙහාට යාමට තීරු දෙකක් තිබෙනවා. හැබැයි ඒ තීරු දෙකෙන් එකක් වහගෙන වාහන ගහගෙන සිටිනවා. අපිත් මුලදී තීන්දු කළේ වාහන දාන්න තැනක්. දැලිවල තිලක වර්ධන මහත්තයාගේ එකත් අත්පත් කරගන්න හිටපු සභාපතිතුමා සිටින කාලයේ කටයුතු කළා. ඒකටත් නඩුවක් දැම්මා. දැන් නඩුව එහෙම්ම තිබෙනවා. ඒ වගේම තමා චෝක් එකේ කණුවක් දමනවා කියලා කීවා. ඒක එයාට ඕන නම් දමාගන්න කීවා. එයා නඩු දැම්මා අපට අයිති කොටසට පස්දමලා තිබෙනවා ඔබතුමා දැනුම් දීමක් කරලා තිබෙනවා පස් දාලා වහලා තිබෙනවා ඒක පිළිසකර කරගන්න පුළුවන්.කොහොම හරි මේ බිම් කොටස සභාව සතු බිම් කොටසකි.අධිකරණයේ නඩුවක් තිබෙනවා.මේ සම්බන්ධව නඩුවට අපිව සම්බන්ධයි.අපිට කථා කරලා ඉවත් කර ගැනිමට පුළුවන්.එහෙම ඉවත් කර ගත්තොත් අපේ මේ බිම් කොටස ප්‍රයෝජනයට ගන්න පුළුවන් බව පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මම හිතන්නේ ඔබතුමා කියන ආකාරයට යම් තත්ත්වයක් ඇත.මේය සභාගත කළ බිම් කොටසක්ය.සභාව සතු දේපළකි.එය බදු දීමට නෛතික ගැටලුවක් නැත.එතැනින් ඉස්සරහට නඩුව තිබෙනවා.නඩුවේ තීන්දුවක් තාම ආවේ නැති නිසා නඩු තීන්දුව ආවට පසුව ඒක බලන බවත්,ඒක නිකන් තියාගෙන ඉන්නේ එකේ තේරුමක් නැත. ඒතැන අපවිත්‍රයි ශුද්ධ කරගැනිමට ද නොහැකිය. ඒකට මුකුත් කරන්න නොහැකි නිසා එය පිළිසකර කර කවුරු හරි කෙනෙකුට බදු දුන්නොත් ඒක නගර අලංකරණයට හොඳයි. කවුරු හරි පාවිච්චි කරයි.අපිටත් යම් මුදලක් ලැබෙයි. ඒ අදහසින් තමයි මම මෙය ඉදිරිපත් කළ බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මේක ලින්සා එකට දෙන්න කියලා අවශ්‍ය නැත.ටෙන්ඩර් කරලා දෙමු.යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එහෙම එකක් මේකේ නැති බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

වාර්ෂික බදු පදනමකට යන එක හොඳ බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මොකද ඊළඟ අවුරුද්දේ සිට සභාවට ආදායම එකතු කරගන්න ඕනේ මොකද හේතුව තමයි ගරු මන්ත්‍රීතුමාලා/තුමියන්ලා දැන ගැනිමට අවශ්‍යයි. අයි.එෆ්.එම්.කොන්දේසිය අනුව පළාත් පාලන ආයතන වල වැටුප් සහ දීමනා ගෙවන එකෙන් 40% ක් අඩුකරලා තමා කාටත් ලැබෙන්නේ අපිත් සමග ඒවා ප්‍රතිපූර්ණය කරන්න වෙන්නේ මේ ආදායමේ උත්පාදන ක්‍රියාවලිය මගින් ඒ නිසා මෙම බිම් කොටස නිකන් තිබෙන බැවින් බදු දීම සුදුසු බවත්, මෙම කොටස නිකන් තිබ්මෙන් විගණනයටත් හසු වෙන්න පුළුවන් ඒ නිසා මෙය අපි ශුද්ධ පවිත්‍ර කර වාර්ෂික බදු පදනමකට ටෙන්ඩර් කරන්නට වෙන්නේ.ඊළඟට ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීම මේ යෝජනාව ගෙනාවේ එහේ නම් ඒකට කාගෙවත් විරුද්ධත්වයක් නොමැති බැවින් ක්‍රියාත්මක කරමු. යනුවෙන් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
වාර්ෂික බදු පදනමකට ටෙන්ඩර් කර ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ පූර්ණ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිමට තීරණය විය.

(ix) මෙම සභාව සතු පින්නවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා හිඟ බදු මුදල් වශයෙන් 2020.10.12 දින සිට 2021.12.31 දින දක්වා හිඟ කුලිය රු.214,000.00 ද 2022 හා 2023 වර්ෂ සඳහා බිම් බදු කුලිය වශයෙන් රු.32,000,00.00 මුදලක් වශයෙන් එකතුව රු.34,140,00.00 ක මුදලක් මෙම සභාවට අයවිය යුතුව ඇත.

එසේම 2024 වර්ෂයේ නව තක්සේරුව අනුව වාර්ෂිකව රු.17,500,00.00 මුදලක්ද 2025 වර්ෂයට නව තක්සේරුව අනුව වාර්ෂිකව රු.17,500,00.00 මුදලක්ද අයවිය යුතු හෙයින් 2025.12.31 දිනට සම්පූර්ණ හිග බදු මුදල රු.69,140,00.00 ක හිඟ මුදලක් මෙම සභාවට අයවිය යුතුව ඇත.

ඉහත හිඟ මුදල ගෙවා නිම කරන ලෙස පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත අවස්ථා කිහිපයකදීම දන්වා යැවුවද මෙම හිඟ බදු මුදල් ගෙවීමට කිසිදු අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් පළාත් පාලන කොමසාරිස් විසින් සන්තකය පවරා ගැනිමට කටයුතු සිදු කිරීමට තීරණය කර ඇත. ඒ සඳහා සභාවට සුදුසු තීරණයක් ගැනිමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපේ සභාව සතුව තිබෙනවා පින්නවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව පවත්වාගෙන යන ගොඩනැගිල්ල ඒකේ ඔවුන් විසින් අපිට හිඟ බදු විදිහට මේ වනවිට මිලියන 34කට ආසන්න මුදලක් අපට අය වෙන්න තිබෙනවා.එතකොට 2024 තක්සේරුව අනුව 2025.12.31 වන විට එය මිලියන 69,140,000.00 දක්වා හිඟ මුදලක් ආපහු වාර්තා වෙනවා. ඒක අපි කීහිප වතාවක්ම ඉල්ලීම් කළාට

ගෙවීම් පැහැර හැරලා තිබෙනවා.අපි කොමසාරිස්තුමාගෙන්ද අවස්ථා කිහිපයකදී උපදෙස් පැතුවා එතුමා පැවසුවේ මේක අපේ සන්තකයට පවරා ගන්නට කියලා ගෙවන්නේ නැති නිසා ඒකට අන්තිම උත්තරේ තමා ඉඩමයි ගොඩනැගිල්ලයි අපේ සන්තකයට පවරා ගැනිම බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඒක හොඳයි. මුදල කොහොමද අය කරන ගන්නේ යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගොඩනැගිල්ල තිබෙනවා.ව්‍යාපාරය තිබෙනවා.ආයුර්වේද මධ්‍යස්ථානය තිබෙනවා. ඒ ටික තමයි අපට හම්බවෙන්නේ. යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඒ අයට හිඟ මුදල ගෙවන්න කියලා ඉල්ලීමක් කරන ලෙස පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒක අපි පළාත් සභාවෙන් ඉල්ලීමක් කරමු. මේක දිගින් දිගට ගියපුවහම ලේඛනගත වෙනවා. ඉන්පසුව මේකට තව අවුරුදු පහක් ගියාම ඉතිහාසය කවුරුත් දන්නේ නැති බැවින් දැනට මේකේ සන්තකයට පවරාගෙන හිඟ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරමු.යනුවෙන් ප්‍රකාශයට පත් කළ පසු විරුද්ධත්වයත් නොමැති බැවින් එය එසේ සිදු කිරිමට තීරණය වන බව සභාවට ගරු සභාපතුතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය -**
අපගේ සන්තකයට පවරා ගෙන හිඟ මුදල පලාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කිරිමට කටයුතු කිරිමට තීරණය විය.

(x) 2025 වර්ෂයේ සිට සභා අරමුදල් යොදවා සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීමේදී ඊට අදාලව ව්‍යාපෘතියේ නම, අරමුදල් ප්‍රභවය, වටිනාකම ඇතුලත් කර නාම පුවරු සවි කිරීම සිදුකරන්නේද යන්න පිළිබඳව තීරණයක් ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේකෙන් කියන්නේ අපේ ව්‍යාපෘති සිදු කරනවානේ. ඒකට නාම පුවරු ඉදි කරනවාද? නැද්ද? කියන එක ඉතිහාසයේ එහෙම එකක් ඇවිත් තිබෙනවා. අපේ ඇස්තමේන්තුවලත් ඒක පුරුද්දට වාගේ දැම්ම සිදු කරනවා. ඉතින් ඒකට නාම පුවරු අවශ්‍ය නැති බව තමා කියන්නේ.එක අවශ්‍ය නැනේ ද? ඒකට කවුරුත් එකඟයි නේද?මෙයට රුපියල් දහ පහළොස් දහසක් යනවා. ඒකත් අපරාදෙනෙ හරිනේ යනුවෙන් පවසන ලදි .විරුද්ධත්වයක් නොමැති බව පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ව්‍යාපෘති සඳහා නාම පුවරු ඉදි නොකරන බවට අනුමත කිරීම තීරණය විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

xi සිට xvi දක්වා තිබෙන්නේ අපේ පළාත් සභාවෙන් අනුමත වුණ ව්‍යාපෘති. එම ව්‍යාපෘති සිදු කිරිමට අවසර ගැනීම සඳහා ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි, අපි දැනගන්නට කැමැතියි මේ පළාත් සභාවේ අනුමත කරන්නේ අපේ සභාවේ ආදායමට එකතු වෙන්ට තියන දඩ කුලී සහ මුද්දර ගාස්තු අපට අය විමට අපේ ලේඛනවල අපට අයවිය යුතුයි. මොකද අයවැය සකස් කරන විට ඒ මුදල් බලාගෙන තමා මේ අයවැය ලේඛන සකස් වන්නේ කියන්න කැමතියි සභාපතිතුමනි, මේ යෝජනා අනුමත කරලා එහෙන් එවනකොට අපිට ලැබෙන්නට තිබෙන මුදල සභාවට අයවිය යුතුය.මුදල මොකද අවුරුද්ද අවසානයේ අයවැයට ඉලක්ක කරගෙන එන්නේ එම දඩ මුදල් සහ මුද්දර මුදල් බලාගෙන එතකොට මේ යෝජනා එහෙන් අනුමත වෙලා එනකොට අපිට සභාව එන ආදායම් පැත්ත හිරවෙනවා. එතකොට සංවර්ධන යෝජනා ඔක්කොම පළාත් සභාවේ අනුමත කරලා එනවද ?මේකට ප්‍රතිපාදන සහ අරමුදල් ද එහෙම නැත්නම් අපිට පළාත් සභාවෙන් මෙහාට ලැබෙන මුදල් වලින් අඩු කරගෙන එන යෝජනාද කියන එක පැහැදිලි කරන්න ගරු සභාපතිතුමනි,යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේකේ අංක xi මිලියන 08 ක ඒක සඳහා මුදල් අමාත්‍යාංශයෙන් කෙලින්ම අනුමත කර ගත්ත මුදලක් පළාත් සභාව හරහා එන්නේ මේ මිලියන අට ,මුදල් අමාත්‍යාංශය හරහා තමා පළාත් සභාව ඇවිත් මේක එන්නේ.ආණ්ඩුකාර ක්‍රියාවලිය පිළිබඳ මට මුල ඉඳන් කියලා දෙන්න නොහැකිය.පළාත් සභාවට නෑ තමයි.එහෙත්ගොඩනැගිලි ටික තිබෙනවා.නිලධාරීන් සිටිනවා.ලේකම්වරු සිටිනවා. නැත්තේ මහජන නියෝජිතයෝ විතරයි.නමුත් පළාත් සභාව ක්‍රියාත්මකයි. මහජන නියෝජිතයෝ නෑ ඒ නිසා මේවා මෙහෙමයි. ආපු ක්‍රමවේදය. මම දන්නෑ මුදල් අමාත්‍යාංශයෙන් කෙලින්ම ප්‍රාදේශීය සභාවකට මුදල් එනවද කියලා මම අහලාත් නැත.දුන්නොත් අපි ගනිමු.එතකොට පළාත් සභාව හරහා තමා ඒ මුදල් සියල්ලම ලැබෙන්නේ.මේවා දුන්නා කියලා අපට පළාත් සභාව හරහා එන මුද්දර ගාස්තුවෙන් ඒවා අඩුවෙන්නේ නැති බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මම මේවාට අනුමැතිය ලබා දෙන්නේ නැති බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

රන්දෙණියේ සිට මොළගොඩ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. එතකොට මෙම මාර්ගය කොට්ඨාසයේ මාර්ගයක්ද? මම දැනගැනීමට කැමති මෙම මාර්ගය මොන මාර්ගයක්ද කියන කැකුළු පිටියේ මාර්ගයද? යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ යෝජනාවල මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. අපි සභාවට එන්න කලින් සංවර්ධන නිලධාරී හරහා ලබාගත්ත යෝජනා ටිකක් මේ ගිහින් තිබෙන්නේ. සභාවට දාලා තිබෙන්නේ සභාව හරහා මේවා කරන්නට තිබෙන්න නිසා. අනුමැතිය දෙන කට්ටිය දෙන්නේ,සභාව හරහා කරනවා නම් සභා අනුමැතිය ගන්න ඕනේ නෑ කියලා ඔබතුමාලා කියනවා නම් එහෙනම් ඔබතුමන්ලා යෝජනාවක්

සම්මත කරන්න සභාව හරහා කරන කිසිම යෝජනාවක් සභාව අනුමත කරන්න ඕනේ නැත යනුවෙන් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා

මාහින්තැන්න ප්‍රදේශයේ අතුරු මාර්ගය මේකේ කොටසක් තමයි කැකුළුපිටිය මාර්ගය මෙහි පොඩි කොටසක් ඉතාම අබලන් තිබෙන්නේ.මේ ප්‍රතිපාදන වලින්ම ඒකේ කොටස කරන්නට යෝජනා කළා. ඒ ඇරෙන්නට මේ මාර්ගයේ අබලන් කොටසක් කැකුළුපිටිය මාර්ගයේය. ඒ කොටස මෙතෙක් සංවර්ධන වී නොමැත. මාහින්තැන්න තමයි මේ සුසාන භූමියේ මාර්ගය බවත්,පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මන්ත්‍රීතුමන්ලා විවාදයකට යන්න එපා, මෙය කැකුළු පිටියේ මාර්ගය. මේකේ මොකක් හරි ගැටළුවක් තිබෙනවා නම් පහත ෆයිල් එක අධ්‍යයනය කරන්න එතකොට දැන් රෝම ඉලක්කම් xi සිට xv දක්වා ව්‍යාපෘති තියෙන්නේ. ඒකට අවශ්‍ය අනුමැතිය තමයි සභාවෙන් ඉල්ලන්නේ.යනුවෙන් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

පළාත් සභා මුදල් නම් මේවාට සභා අනුමැතිය ඉල්ලන්නේ මොකටද ?

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ඔබතුමන්ලා කියන්නේ පළාත් සභාවෙන් හරි මහා ආණ්ඩුවෙන් හරි ප්‍රාදේශීය සභාවේ සභා මුදල් නොවන ව්‍යාපෘතියක් කරන්නට තනි කැමැත්තට පුළුවන් කියලද කියන්නේ.එහෙම හොඳයිද ? ඒ නිසා තමා ඔයා අපේ තිබෙන දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය අවභාවිතා කරන්ට එපා. ඒක අපේ දුර්වලතාවයන් නොවෙයි. ඒ නිකන් හැල්ලුවට ගන්න එපා. දන්නේ නැතුව කරන්නට බැරි නිසා නොවෙයි කියන්නේ. ඒ හින්දා අපිට මේකට අවස්ථාව දෙන්න.මේවා හොරෙන් කරන්න තිබුණා. ඉතිහාසය වගේ අපි එහෙම කරන්නේ නැතිව සියල්ලම ලේඛනගත කරලා ඔයාලට දීලා සභාවෙන් කරුණු සියල්ලම අහන්න ඒක. ඒක නිසා අනවශ්‍ය ප්‍රශ්න අසන්නට එපා.මේ මිලියන අටක් දුන්නේ ඔයාලට දැනගන්නට පුද්ගලයින්ගේ හැකියාව මත අපට පාස් කරලා දුන්නේ අපේ ගමේ පාරක් හදලා දෙන්න.මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙක් ඒක වටින්නේ නැද්ද එතුමා අපි ගැන සලකලා ප්‍රාදේශීය සභාවල කරන්න කියලා යෝජනාවකුත් කරනවා. එතකොට ඒකෙ වටිනාකම අපිට තිබෙනවා. ඉතින් මේවා එන ක්‍රමවේද තමා පළාත් සභාව හරහා එන එක. ආවට පස්සේ මට යුතුකමක් තියෙනවා මන්ත්‍රීතුමන්ලා සහ තුමියල්ලා දැනුවත් කරන්න නැතිනම් මෙහෙම කරන්න උවමනාවක් නැත.මට තනියම කරන්ට පුළුවන් .ඇයි එහෙම කරන්නේ නැත්තේ ඒක අපේ තිබෙන දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය ඒක අවභාවිතා කරන්නට එපා. හැල්ලුවට ලක් කරන්ට එපා .විහිළුවක් නොවන බව පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

මෙච්චර වෙලා මේ කතා කළේ මේක ගිවිසුම් ගත වීමක් ගැන නොවෙයිනේ. අපේ අනුමැතිය ගැනීම සම්බන්ධවයි.අපේ සභාවේ ගිවිසුම් ගත වීමට ප්‍රශ්නයක් නැති බවත්,සභාවට යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්නේ. ඒක ඇත්ත නමුත් අපි මෙච්චර වෙලා තර්ක කරගෙන යන්නේ පළාත් සභා මුදල්ද? අපේ මුදල්ද? යන්න පිළිබඳවනේ. එතකොට පැහැදිලිව මේ පළාත් සභා මුදල් තමා. මේ පළාත් සභා මුදල් අපේ අදාළ ගිවිසුම් ගත වීමකට තමා මේ යන්න හදන්නේ යනුවෙන් පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

හරි ඒක,අපතේ ගියා කාලය ඔබතුමන්ලා ප්‍රකාශ කරන්න ඕනේ මොකක්ද කාරනේ කියලා.අපි මේ කතා කරන්නේ හුවමාරුවක් ගැන මේ හුවමාරුව ඉස්සර තිබුනේ පළාත් සභාවෙන් හරි පාර්ලිමේන්තුවෙන් හරි ඉඩම් අමාත්‍යාංශයෙන් හරි දැන් මේ මුදල් අමාත්‍යාංශයේ මුදල් වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සංවර්ධන කටයුතුවලදී තීන්දු තීරණ ගන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, දැන් මේ තීන්දු තීරණ ගත්තේ කොහොමද කියන එකනේ ප්‍රශ්න කරන්නේ. සභාවකට මුදල් එව්වොත්

සභාවෙන් තීන්දු තීරණ ගන්නවා. පළාත් සභාවට එව්වොත් පළාත් සභාවෙන් එවනවා ප්‍රාදේශීය ලේකම්තුමාට. දැන් මේ තමුන්නාන්සේලා බලයට ආවේ මේ පද්ධතිය වෙනස් කරන්නනේ .ඒකට දැන් අපි දගලන්න ඕනේ. මන්ත්‍රීවරු වශයෙන් අපිව දැනුවත් කරන්න ඕන. හැබැයි ප්‍රශ්න කරන්න අර වෙනස දන්නේ නැති බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වෙනස දන්නේ නැත්නම් කරුණාකර අහන්න ඔය ක්‍රියාවලිය තමා මෙච්චර කල් කළෙත් ඉදිරියට වෙන්නෙත් ඒකම තමයි. ඒවා අණපනත් චක්‍රලේඛ වලින් එයි. ඒ විදියට තමා ඇවිත් තියෙන්නේ. මේ සමීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ අදාල ගිවිසුම් ගත වීම සිදු වන්නේ.අපෙත් යම් කාර්ය භාර්යයක් තියෙනවානේ ඒකට අනුමැතිය ඉල්ලීමට ඒ නිසා අපි යම්කිසි වැරදි වැඩක් කරනවා නම් ඔබතුමන්ලාට අයිතියක් තියෙනවා විගණනයකට,විමර්ශනයකට යන්න සී අයිඩී යන්න එහෙම යන්න. අපි ඒවාට බය නැත.මොකද අපි මේවා උල්ලංඝනය කරන්නේ නැති නිසා.ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියල්ලා අංක xi සිට xv දක්වා යෝජනා වලට අනුමැතිය ලබාදීම සිදු කරනවාද? යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ප්‍රජාපාදක සංවිධාන මොනවද? ඒ වගේම අදාල කොට්ඨාශයට අදාළවද?එහෙම නැතිනම් ආසන්නයේම ඇති ප්‍රජාපාක සංවිධාන වලට හැකියාව තිබෙනව ද ?යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රජාපාදක සංවිධානය වෙන්න ඕන අදාළ කර්මාන්තයේ තිබෙන වසම. වසමේ සංවිධාන වලට නොහැකි නම් ළඟම වසම ගන්න පුළුවන්.ඒ විදිහට තමා මෙහි ක්‍රමවේදය තිබෙන්නේ. ඊට පස්සේ මෙහි තත්ත්වය,තාක්ෂණය බලනවා, හැකියාවත් බලලා තමයි සමිතිය ලබා දෙන්නේ.මේ සඳහා වෙනම පෝරම කට්ටලයක් තියෙනවා. එය ලබා දෙන්න වෙනවා. ඒ විදිහට තමයි මේ යන්නේ. ගියවර කළ ප්‍රජාපාදක සංවිධාන වලට වඩා දැන් පිටු තුනක් තිබෙනවා. අලුත් කියලා තිබෙනවා. ප්‍රසම්පාදන ක්‍රමවේදයකට යන්න ඕනේ. පනතේ 19 හි කියන්නේ මාර්ගෝපදේශ සංග්‍රහය බලන්න.ඒ සියල්ල තිබෙනවා නම් ලබා දෙන්න පුළුවන් බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රජාපාදක සංවිධානය අදාළ කොට්ඨාසයෙන් එකක් වෙනවා නම් හොඳයි කියා යෝජනා කරන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ වසමේ නැත්නම් වසමේ එහෙම එකක් නැති බවට ලිපියක් දෙන්න ඕනේ. ඊට පස්සේ පුළුවන් ඊළඟ වසමට යන්න ඒකෙත් නැත්නම් ඊළඟ වසමට යනවා. අංක එකොළහේ සිට පහළොව දක්වා අදාළ යෝජනාවලට අනුමැතිය දෙනවාද ? සභාවේ විරුද්ධත්වයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත වුණ බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

(xi) පළාත් පාලන ප්‍රතිපාදන යටතේ රඹුක්කන හඳගමුව නාගමුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම- රු.8,000,000.00 ව්‍යාපෘතිය භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 ට අදාලව කර්මාන්ත ඉටු කරවා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 අනුව කටයුතු කිරිම තීරණය විය.

(xii) පළාත්සභා කර්මාන්ත 2025 යටතේ අඹුවන්ගල වැව දක්වා මාර්ගය සංවර්ධනය කිරිම (LGR -2513701) රු.1600,000.00 කර්මාන්තය භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා මාර්ගෝපදේශ සංග්‍රහය -2024 යොමු අංක 3.1.9 ට අනුව මෙම කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානයක් වෙත පිරිනමා, ගිවිසුම් ගතව එම කාර්ය ඉටු කර ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් සිථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 අනුව කටයුතු කිරිම තීරණය විය.

(xiii) පළාත්සභා කර්මාන්ත 2025 යටතේ රන්දෙනිය සිට මොලගොඩ දක්වා මාර්ගයේ ආරම්භක ස්ථානයෙන් වමට මාර්ගය සංවර්ධනය කිරිම (LGR (RC )-2513705) රු.500,000.00 ක කර්මාන්තය භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා මාර්ගෝපදේශ සංග්‍රහය -2024 යොමු අංක 3.1.9 ට අනුව මෙම කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානයක් වෙත පිරිනමා, ගිවිසුම් ගතව අදාල කාර්ය ඉටු කර ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 අනුව කටයුතු කිරිම තීරණය විය.

(xiv) පළාත්සභා කර්මාන්ත 2025 යටතේ රඹුක්කන ප්‍රදේශිය සභාවේ කොම්පෝස්ට් අංගනයේ ආරක්ෂිත වැට හා ගේට්ටුව අලුත්වැඩියා කිරීම සංවර්ධනය කිරිම (SWS 2513701) රු.2,150,000.00 වන කර්මාන්තය භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයට කාර්ය ඉටු කර ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 අනුව කටයුතු කිරිම තීරණය විය.

(xv) පළාත් සභා කර්මාන්ත -2025 යටතේ රඹුක්කන හත්බාවත්තෙ කෙම්පිටිය කොටසේ සනීපාරක්ෂක පහසුකම් වැසිකිලි දියුණු කිරීම 12,25,000.00 ක් යටතේ කර්මාන්තය භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා මාර්ගෝපදේශ සංග්‍රහය 2024 යොමු අංක 3.1.9අනුව මෙම කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානයක් වෙත පිරිනමා ගිවිසුම්ගත එම කාර්යය ඉටු කර ගැනීම බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 අනුව කටයුතු කිරිම තීරණය විය.

(xvi) 2024 භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අදාළව යොමු අංක 3.1.9 අනුව රුපියල් මිලියන දෙක දක්වා වන සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රජා සහභාගීත්වය ලබාගත හැක. ඊට අදාළව සභාව විසින් පත්කරනු ලැබ ඇති ත්‍රී පුද්ගල කමිටු නිර්දේශය මත තෝරා ගනු ලබන ප්‍රජා පාදක සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනමා සංවර්ධන ව්‍යාපෘති ඉටුකර ගත හැක .ඒ අනුව මිලියන 2 දක්වා වන සංවර්ධන ව්‍යාපෘතියන්හි ලබා දෙන්නා වූ කමිටු නිර්දේශ පරීක්ෂා කර බලා අදාල ප්‍රජාපාදක සංවිධාන වෙත ගිවිසුම් ගත විම සඳහා වන අනුමැති ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව වෙත ඉදිරිපත් කිරීමත් ඒ මත පදනම්ව ගිවිසුම් ගතවීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අංක xvi මිලියන 2 ට අඩු සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රජා සහභාගිත්වය ලබාගත හැකිද යන්න අපේ චක්‍රලේඛයේ තියෙන්නේ මිලියන 2 ට අඩු සංවර්ධන ව්‍යාපෘති කමිටු නිර්දේශය සඳහා ප්‍රජාපාදක සංවිධාන ගිවිසුම් ගත වීමට සභාවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුවට ඉදිරිපත් කිරීම. ඒ මත පදනම්ව ගිවිසුම්ගත වීමට සුදුසු බව යෝජනා කරමි. ඒ කියන්නේ මීට කලින් කතා කරපු කාරණාව දැන් මේ කර්මාන්ත හයට ගිවිසුම්ගත වීමට මේ සභාවේ අනුමැතිය ගන්නවා නම් මාසයක් ඉන්න වෙනවා. එතකොට කර්මාන්ත කරන්න තිබෙන කාලය අඩුවෙනවා. ඒ නිසා සතිපතා රැස්වෙන මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ අනුමැතියට යටත්ව මේකට බලය දෙන්න තමයි මේ යෝජනාවෙන් කරන්නේ.කාලය ඉතිරි කරගන්න.මොකද තව මාස තුනයි තිබෙන්නේ කොන්ක්‍රීට් කළොත් එහෙම බිල ගෙවන්න මාසයක් මාසයක් විතර යනවා. එතකොට මෙතෙන්ට මාසයයි. බිල ගෙවන්න මාසයයි ගිවිසුම්ගත වෙන්නත් සතියක් දෙකක් යනවා. ඒ අදාළ ලිපි සකස් කරගෙන වැඩේ කරන්න තවත් සතියක් දෙකක් යනවා. ඒ නිසා ගතවන කාලයේ අවම කර ගැනීම තමයි එය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ.ඒ කාරක සභාවට බලය දෙන්න තමයි මේ යෝජනාව ඉදිරිපත් කළ බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

එතකොට මුදල් කාරක සභාව තමයි තීරණය කරන්නේ කාටද දෙන්නේ කියන එක යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා කාටද දෙන්නේ කියන එක තීරණය කරන්නේ, තීන්දු ගන්න කමිටුවක් සිටිනවා, ඒකේ මේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට 3.1.9 වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ සභාපති තමයි කමිටුවේ සභාපති.කාර්මික නිලධාරි වරුණි මහත්මියයි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සඳමාලී මහත්මියයි කමිටු සාමාජිකයින්ය.ඒ විදිහට තමයි මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අපිට දීලා තිබෙන්නේ.උපදේශවලින් පත්කළ කමිටුව,ඒ කමිටුව මගින් තමයි මේ පරීක්ෂණ කරන්නේ.හැකියා සහතිකය,මුදල් තත්ත්වය සියල්ල අධීක්ෂණය කරන්නේ. කමිටු නිර්දේශය,ගිවිසුම්ගත වෙන්නට නම් සභා අනුමැතියත් අවශ්‍යයි.සභාව පවත්වන්නේ මාසයකට සැරයක්ය.එතකොට අනුමැතිය ගන්න මාසයක් බලා ඉන්න වෙනවා. ඒ කාලේ අඩු කරගන්න තමයි කාරක සභාව දැම්මට හදන්නේ.සතියකට වරක් රැස්වෙන නිසා ඒ නිසා කමිටු තීරණයට බලය දෙමුයි කියලා යෝජනා කරන්නේ. මන්ත්‍රීතුමන්ලාට පැහැදිලි වුණාද? ඔබතුමන්ලාගේ අදහස මොකක්ද? විරුද්ධත්වයක් නොමැති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
මිලියන 2 දක්වා වන සංවර්ධන ව්‍යාපෘති සඳහා බලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට පැවරීම අනුමැතිය දීමට තීරණය විය.

(xvii) 2025.08.25 දින සිට 2025.09.29 දක්වා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ වියදම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.08.25 | 935 | සම්පත් ප්‍රින්ටින් | බැනරයක් සකස් කිරීම වෙනුවෙන් ගෙවීම | 3,065.00 |
| | 936 | ශීලා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 37,975.00 |
| | 937 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ඉල්ලීම | 654.00 |
| | 938 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ඉල්ලීම | 654.00 |
| | 939 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ඉල්ලීම | 2,082.50 |
| | 940 | වී.ආර් එන්. ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 6,302.33 |
| | 941 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ඉල්ලීම | 970.00 |
| | 942 | ඩබ්.එන්.සුරංජනි සෝමදාස | ගමන් වියදම් ඉල්ලීම | 679.00 |
| | 943 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම - (ජනවාරි මස) | 239.91 |
| | 944 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම - (ජුලි මස) | 4,833.83 |
| | 945 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම - (ජුනි මස) | 2,800.91 |
| | 946 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම - (මැයි මස) | 180.00 |
| | 947 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම - (මාර්තු මස) | 719.75 |
| | 948 | එච්.ආර්.යූ.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම - (පෙබරවාරි මස) | 299.89 |
| | 949 | ජල සම්පාදන මණ්ඩලය - කෑගල්ල | රඹුක්කන පොදු වැසිකිළියට අදාල ජල බිල්පතේ හිඟ මුදල් ගෙවීම | 27,543.99 |

| | | | | |
|---|---|---|---|---|
| | 950 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරීම | 30,000.00 |
| | 951 | විගණකාධිපති | 2024 වර්ෂයට අදාල මූල්‍ය විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලයට ගෙවීම | 351,592.80 |
| 2025.08.26 | 952 | ආර්.ජී.එස්. නිරෝෂන් | රජයේ නිවාඩු දින සේවය කිරීම හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අධීක්ෂණය වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම | 3,428.00 |
| | 953 | ආර්.ජී.එස්. නිරෝෂන් | රජයේ නිවාඩු දින සේවය කිරීම හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අධීක්ෂණය වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම | 13,712.00 |
| | 954 | ආර්.ජී.එස්. නිරෝෂන් | රජයේ නිවාඩු දින සේවය කිරීම හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අධීක්ෂණය වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම | 3,428.00 |
| | 955 | පී.එල්සී. කුමාර | Rw 9992 ට්‍රේලරයේ වම් පස රෝදයට පැච් දැමීම | 600.00 |
| | 956 | පී.එල්සී. කුමාර | ZA- 0191 බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස දකුණු රෝදයට පැච් දැමීම -(2002.07.14 දින) | 1,250.00 |
| | 957 | පී.එල්සී. කුමාර | ZA- 0191 බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස දකුණු රෝදයට පැච් දැමීම -(2002.07.08 දින) | 1,250.00 |
| | 958 | පී.එල්සී. කුමාර | ZA- 0191 බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස වම් රෝදයට පැච් දැමීම -(2025.07.03 දින) | 1,250.00 |
| | 959 | පී.එල්සී. කුමාර | ZA- 0191 බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස දකුණු රෝදයේ ටියුබයේ සහ රෝදයේ පැච් එකක් දැමීම -(2002.06.27 දින) | 2,000.00 |
| | 960 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් එලයිමන්ට් | Rw 9023 ට්‍රේලරයේ දකුණු පස රෝදයට පැච් දැමීම | 450.00 |
| | 961 | එස්.එම්.කේ.බී. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 3,570.00 |
| | 962 | පේපර් ලයින් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 75,070.00 |
| | 963 | ඒ.ආර්. යූ. මධුෂාණි | ගලි බවුසරය ලබා ගැනීම සඳහා තැන්පත් කළ මුදල් ආපසු ලබා ගෙවීම | 8,265.00 |
| | 964 | ආර්.ඒ. ඩී.එල්.ඩබ්. රණතුංග | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 911.33 |
| | 865 | බබ්.ජී.එච්.එස්.විජේසිංහ | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 1,537.77 |
| | 966 | ඩී.එම්.ඩබ්.ඩී.බී..දිසානායක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,736.44 |
| | 967 | රංජනී බේක් හවුස් | 2025.08.05 දින පවත්වන ලද මහ සභාව සඳහා සංග්‍රහ වියදම් දැරීම | 5,035.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 968 | C-com Equipment (pvt)Ltd | ZA-0108 බොබ් කැට් යන්ත්‍රයේ එන්ජින් ඔයිල් පිල්ට එක සහ ඔයිල් ප්‍රෙෂර් සෙන්සර් එක සපයා ගැනීම | 44,000.80 |
| | 969 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | 2025.07.01 සිට 2025.07.31 දක්වා කාර්යාල දුරකථන බිල්පත් ගෙවීම | 3,095.99 |
| | 970 | සුරමායා සෙරමික් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 7,290.00 |
| 2025.09.02 | 971 | සභාපති, ප්‍රාදේශිය සභාව, රඹුක්කන | 2025 අගෝස්තු මස මන්ත්‍රී සභික දීමනා ගෙවීම | 570,000.00 |
| 2025.09.03 | 972 | ඒ.ඒ. ඩී.සී. විජේරත්න | GG -2824 යතුරු පැදියේ එන්ජිම හා අනෙකුත් අලුත් වැඩියා කටයුතු සිදු කිරිම වෙනුවෙන් ගෙවීම | 96,975.00 |
| 2025.09.08 | 973 | භාෂිත ගැෆික් | මහ සභා වාර්තා මුද්‍රණය කිරිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 5,381.00 |
| | 974 | භාෂිත ගැෆික් | මන්ත්‍රී මණ්ඩලය වෙත නිල මුද්‍රා සැකසීම වෙනුවෙන් ගෙවීම | 46,775.00 |
| | 975 | භාෂිත ගැෆික් | බිල් පොත් 500 මුද්‍රණය කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 149,475.00 |
| 2025.09.09 | 976 | ආර්.ආර්.කන්ස්ට්‍රක්ෂන් | ආදාහනාගාර පෝරණුවේ අලුත් වැඩියා කටයුතු සිදු කිරීම | 158,505.05 |
| | 977 | සභාපති ප්‍රාදේශිය සභාව රඹුක්කන | GG -2824 යතුරු පැදියේ දුම් සහතික,ආදායම් බල පත්‍රය ලබා ගැනිම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම | 6,990.00 |
| | 978 | ඩබ්.ජී.එස්.ආර්. බණ්ඩාර | yu - 6935 ත්‍රී රෝද රථයේ තිරිංග පද්ධතිය අලුත් වැඩියා කිරීම | 12,780.00 |
| | 979 | එස්.එම්. ගාමිණි සමරකෝන් | ගමන් වියදම් ගෙවිම | 679.00 |
| | 980 | එච්.එස්.කේ. කුමාර | ගමන් වියදම් ගෙවිම | 679.00 |
| | 981 | පි.ජී. සධානා සමන් කුමාරි | ගමන් වියදම් ගෙවිම | 679.00 |
| | 982 | ජී.ජී. උපාලි රෝහණ | ගමන් වියදම් ගෙවිම | 679.00 |
| | 983 | එම්.ආර්.ඉන්දික සමන් කුමාර | ගමන් වියදම් ගෙවිම | 679.00 |
| | 984 | වී.ආර්.ඊ.එන්. වීර බණ්ඩාර | ගමන් වියදම් ගෙවිම | 679.00 |
| | 985 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මහතාගේ අගෝස්තු මස දිමනා ගෙවිම | 63,300.00 |
| | 986 | සභාපති ප්‍රාදේශිය සභාව රඹුක්කන | අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාල කම්කරු වැටුප් ගෙවිම- (2025 අගෝස්තු මස) | 89,040.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2025.09.10 | 987 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | වත්තේගම වෙළමැද මාර්ගය සංවර්ධනය කිරීම 10% රැදවුම් මුදල් ගෙවීම | 94,820.94 |
| | 988 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | රඹුක්කන අශෝක ක්‍රීඩා පිටි මණ්ඩපයේ අනාරක්ෂිත විවෘතය සඳහා ආරක්ෂිත දැලක් සවි කිරීම - 10% රැදවුම් මුදල් ගෙවීම | 6,464.11 |
| | 989 | කේ.ජී. නිමන්ත | විදුලි මනු කියවීමේ කුටියේ දොර පියන සහ වැසි ආවරණය සකස් කර සවි කිරීම වෙනුවෙන් ගෙවීම | 62,692.06 |
| | 990 | සභාපති ප්‍රාදේශිය සභාව රඹුක්කන | 2025 මැයි , ජුනි මස ගලි තැන්පතු ආදායමට ගැනීම | 449,600.00 |
| | 991 | ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරි සංගමය | රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරි සංගමය පවත්වන වාර්ෂික තරඟාවලියට අදාලව ගෙවීමට නියමිතව ඇති අදාල ගාස්තුව ගෙවීම | 20,000.00 |
| | 992 | එස්.ජේ.එස්. සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 993 | ආර්.ජී.එස්.නිරෝෂන් | අතිකාල දීමනා ගෙවීම | 10,284.00 |
| | 994 | ඩබ් නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,555.25 |
| | 995 | එම්.ජී.ඒ.කේ. මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 11,985.00 |
| | 996 | එන්.ජී. අජිත් ප්‍රියන්ත | අතිකාල දීමනා ගෙවීම | 7,453.28 |
| | 997 | ඩබ්.ජී. එල්.සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 1,722.87 |
| | 998 | එම්.එන්. පත්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,407.40 |
| | 999 | ජී.ආර්.වයි. සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 1,498.00 |
| | 1000 | වී.ඒ.එස්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 2,499.44 |
| | 1001 | එස්.එන්.නන්ද ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 3,256.85 |
| | 1002 | එච්.ඩබ්.ඒ.අයි.එල්.විර කෝන් | අතිකාල දීමනා ගෙවීම | 6,968.15 |
| | 1003 | එස්.ඩබ්.පී. ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 7,990.74 |
| | 1004 | වී.ආර්.එන්. ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 2,447.22 |
| | 1005 | ජී.ඒ.බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,331.48 |
| | 1006 | ජී.ජී.බී.ඒ.කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 8,875.93 |

| | | | | |
|---|---|---|---|---|
| | 1007 | ඩී.ඩබ්.ජී.ජ්. සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 6,222.22 |
| | 1008 | එච්.සී.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 18,458.50 |
| | 1009 | ඩබ්.ඩී.එස්.කේ. පියතිලක | අතිකාල දීමනා ගෙවීම | 1,535.00 |
| | 1010 | ඩබ්.ඩබ්.ඩී.වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 16,854.00 |
| | 1011 | එච්.ඒ.සී.එල්. පියසේන | අතිකාල දීමනා ගෙවීම | 16,319.00 |
| | 1012 | එස්.ඩබ්.සි. එස්.නන්දන | අතිකාල දීමනා ගෙවීම | 9,601.85 |
| | 1013 | ආර්.ජී.එස්.නිරෝෂන් | ගමන් වියදම් ගෙවීම | 3,520.00 |
| | 1014 | ආර්.ජී.එස්.නිරෝෂන් | ගමන් වියදම් ගෙවීම | 1,275.00 |
| | 1015 | ආර්.ජී.එස්.නිරෝෂන් | ගමන් වියදම් ගෙවීම | 970.00 |
| | 1016 | ආර්.ජී.එස්.නිරෝෂන් | ගමන් වියදම් ගෙවීම | 880.00 |
| | 1017 | පි.ජී.එස්. කුමාරි | ගමන් වියදම් ගෙවීම | 3,520.00 |
| | 1018 | බී.එන්.එන්. ජයකොඩි | ගමන් වියදම් ගෙවීම | 4,796.13 |
| | 1019 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 4,800.00 |
| | 1020 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 1,634.00 |
| | 1021 | පී.ඒ.එම්.උමයංගනී | ගමන් වියදම් ගෙවීම | 1,580.00 |
| | 1022 | ඊ.එස්.එස්.ආර්.ඩී.හංසනී බංඩාර | ගමන් වියදම් ගෙවීම | 1,534.00 |
| | 1023 | එච්. ආර්.ඩබ්.පී.සම්පත් කුමාරි | ගමන් වියදම් ගෙවීම | 3,520.00 |
| | 1024 | එල්.ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම (ජූලි මස) | 5,000.00 |
| | 1025 | එල්.ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම (අගෝස්තු මස) | 4,900.00 |
| | 1026 | තිළිණි නිරෝෂනී | ගමන් වියදම් ගෙවීම | 4,900.00 |
| | 1027 | ඩී.ජී.අයි. එන්.දසනායක | ගමන් වියදම් ගෙවීම | 4,900.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1028 | පී.ඩී.ඩබ්. චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම (ජූලි මස) | 4,200.00 |
| | 1029 | පී.ඩී.ඩබ්. චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම (අගෝස්තු මස) | 4,200.00 |
| | 1030 | එන්.ටි.ආර්.ප්‍රේමසිරි | ගමන් වියදම් ගෙවීම | 800.00 |
| | 1031 | ඩබ්. ඩබ්. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 4,800.00 |
| 2025.09.11 | 1032 | සභාපති ප්‍රාදේශීය සභාව රඹුක්කන | පළාත් පාලන සතියට සමගාමීව පැවැත්වෙන වැඩසටන් සඳහා වියදම් දැරීමට අත්තිකාරම් මුදල් ලබා ගැනිම | 100,000.00 |
| | 1033 | ලංකා බැංකුව ,රඹුක්කන | ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කිරීම | 75,500,000 .00 |
| | 1034 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරිම | 30,000.00 |
| | 1035 | එස්.බඩ්. නිලන්ති ධර්මසේන | එස්. ජනසිරි මයාගේ සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ මුදලින් 50% මුදල කලත්‍රයාට ගෙවීම | 259,162.13 |
| | 1036 | එස්.එස්. ඉරෝෂිකා ජනසිරි | එස්. ජනසිරි මයාගේ සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ මුදලින් 25% මුදල දියණියට ගෙවීම | 129,581.06 |
| | 1037 | එස්.එස්. වරෝෂිකා ජනසිරි | එස්. ජනසිරි මයාගේ සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ මුදලින් 25% මුදල දියණියට ගෙවීම | 129,581.06 |
| 2025.09.12 | 1038 | ජාතික ජල සම්පාදන මණ්ඩලය-කෑගල්ල | 2025 ජූලි සහ අගෝස්තු මාස වල පෙර පාසල් ,පොදු වෙළඳපල ආදාහනාගාරය, ක්‍රීඩාංගන, පින්නවල ජල කණුව,වැරැල්ලපත ජල කණුව,ප්‍රාදේශිය සභාව,පෞද්ගලික බස්නැවතුම්පල වල යන ස්ථාන වල ජල බිල්පත් ගෙවීම | 103,128.34 |
| | 1039 | ජාතික ජල සම්පාදන මණ්ඩලය-කුරුණෑගල | 2025.07.07 සිට 2025.08.07 දක්වා ඉඹුල්ගස්දෙනිය පුස්තකාල ජල බිල්පත ගෙවීම | 999.07 |
| | 1040 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | 2025 අගෝස්තු මස කාර්යාල දූරකථන බිල්පත් ගෙවීම | 10,961.36 |
| | 1041 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | කම්කරු ඩබ්. ආර්. සමන් කුමාර මයාගේ ත්‍රෛයි මාසික වාර ප්‍රවේශ පත්‍රය සඳහා මුදල් ගෙවීම | 11,100.00 |
| | 1042 | ලංකා විදුලි බල මණ්ලය | 2025 ජූලි ,අගෝස්තු මාස වලට අදාලව ආදාහනාගාරය,පෙර පාසල්,ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය,පරපේ,දැලිවල සායන,පොදු වෙළඳපල, පින්නවල පොදු වැසිකිලිය,හේවාදිවෙල ආයුර්වේදය, බතඹුරය | 46,318.25 |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රීඩාංගනය,යන ස්ථාන වල විදුලි බිල්පත් ගෙවීම | |
| | 1043 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025.අගෝස්තු මස ප්‍රාදේශිය සභාව කොම්පෝස්ට් අංගනයේ විදුලි බිල්පත් ගෙවීම | 71,875.40 |
| | 1044 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | 2025 ජූලි මස මසට අදාළව ධාවනය වු වාහන ,වල් කපන මැෂින් හා භුමිතෙල් සඳහා ගෙවීම | 688,873.50 |
| 2025.09.15 | 1045 | සභාපති ප්‍රාදේශිය සභාව රඹුක්කන | ZA -0191 JCB යන්ත්‍රයේ දුම් සහතිකය ආදායම් බලපත්‍රය,යෝග්‍යතා සහතිකය ලබා ගැනිමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම | 10,790.00 |
| | 1046 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කිරීම | 180,000,000.00 |
| 2025.09.18 | 1047 | director genaral of pension | පළාත් පලන විශ්‍රාම වැටුප් දායක බිල්පත් ගෙවීම | 30,555.37 |
| | 1048 | සභාපති ප්‍රාදේශිය සභාව රඹුක්කන | සැලසුම් කමිටු දීමනා ගෙවිම | 36,000.00 |
| | 1049 | st' anthony's Distributors (pvt)Ltd | වැල් කුඩ සැපයිම වෙනුවෙන් ගෙවීම | 14,280.00 |
| | 1050 | ඩබ්.එච්.ජී.ඒ. නවරත්න | Rx - 2006 දරණ ටේලරයේ අලුත් වැඩියාවක් කිරිම | 1,800.00 |
| | 1051 | නාමල් සර්විස් සෙන්ටර් | RD -4337 ට්‍රැක්ටර් ටේලරයේ පූර්ණ වාර සේවා සිදු කිරිම | 23,020.00 |
| | 1052 | එම්.පී. සුසන්ත කුමාර | 52-6699 කැබ් රථයේ අලුත් වැඩියාවක් කිරිම | 12,500.00 |
| | 1053 | සම්පත් එන්ටප්‍රයිසස් | සෞඛ්‍ය හා සනිපාරක්ෂක ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 45,775.98 |
| | 1054 | සම්පත් එන්ටප්‍රයිසස් | ටයිල් ක්ලීනර් ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 6,082.00 |
| | 1055 | සම්පත් ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස් | වෙළඳ බලපත්‍ර මුද්‍රණය කර සැපයිම වෙනුවෙන් ගෙවීම | 1,745.00 |
| | 1056 | ජී.කේ.ඩබ්. පුෂ්ප කුමාර | අදාහනාගාරය සඳහා ලාෆ් ගෑස් 37.5 Kg සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවීම | 105,395.00 |
| | 1057 | එස්.එම්.කේ.බී. සමරකෝන් | හදිසි ජල ගැටලුවක් සඳහා අවශ්‍ය පිළිසකර කිරීම් ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවිම | 430.00 |
| | 1058 | භාෂිත ගැෆික් | ප්‍රාදේශිය සභා රීති සහිත ගැසට් පත්‍රය මුද්‍රණය කිරිම වෙනුවෙන් ගෙවීම | 1,776.00 |
| | 1059 | භාෂිත ගැෆික් | මහ සභා වාර්තාවට අදාළ ඇමුණුම් මුද්‍රණය කිරිම වෙනුවෙන් ගෙවීම් කිරීම | 11,268.00 |
| | 1060 | ජගත් ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ | කොම්පෝස්ට් අංගනයේ කටයුතු සඳහා යොදාගත් ස්කැවේටර් යන්ත්‍රය සඳහා ගෙවීම් සිදු කිරිම | 52,775.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1061 | ජගත් ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ | කොම්පෝස්ට් අංගනයේ කසල හල්පිටියට ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගත් ටිපර් රථයට අදාල ගෙවීම් සිදු කිරීම | 69,575.00 |
| | 1062 | රංජනී බේක් හවුස් | 2005.09.02 දින පවත්වන ලද මහ සභාවේ සංග්‍රහ වියදම් සඳහා ගෙවීම | 4,975.00 |
| | 1063 | ඩබ්.පී.පී. සිරිමාන්න | ගලි තැන්පතු මුදල් ආපසු ගෙවීම | 7,795.00 |
| 2023.09.23 | 1064 | සභාපති ප්‍රාදේශීය සභාව රඹුක්කන | 2025 සැප්තැම්බර් මස ස්ථිර වැටුප් ගෙවීම | 7,405,849.07 |
| 2025.09.29 | 1065 | සභාපති ප්‍රාදේශිය සභාව රඹුක්කන | පළාත් පාලන ඡන්ද විමසීම සඳහා ලද ප්‍රතිපූර්ණ ගෙවීම් කඩිනම් කිරීම වෙනුවෙන් අදාල නිලධාරීන්ට ගෙවීම | 690.00 |
| | 1066 | ආර්.පී.එස්. නිරෝෂන් | නිවාඩු දින සේවය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 10,284.00 |
| | 1067 | ආර්.ආර්.සාලින්ද කුමාර | අතිකාල දීමනා ගෙවීම | 11,537.03 |
| | 1068 | ජේ.පී.ආර්.ඩී. ජයසුන්දර | අතිකාල දීමනා ගෙවීම | 5,498.76 |
| | 1069 | කේ.පී.ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 7,865.27 |
| | 1070 | කේ.ජී.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1071 | කේ.ජී.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1072 | කේ.ජී.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1073 | කේ.ජී.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1074 | කේ.ජී.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1075 | එච්.ආර්.ඩබ්. පී. සම්පත් කුමාර | ගමන් වියදම් ගෙවීම | 1,000.00 |
| | 1076 | එච්.ආර්. අයි.පී. එස්.කේ. ජී.මැණිකේ | ගමන් වියදම් ගෙවීම | 800.00 |
| | 1077 | ටී.එම්. එස්.ජී. රත්නායක | ගමන් වියදම් ගෙවීම | 4,225.43 |
| | 1078 | පී.ජී.එස්. කුමාරි | ගමන් වියදම් ගෙවීම | 1,000.00 |
| | 1079 | එස්.ජී.එන්.කේ. සේනාරත්න | ගමන් වියදම් ගෙවීම | 630.00 |
| | 1080 | ජාතික ජල සම්පාදන මණ්ඩලය -කෑගල්ල | 2025 අගෝස්තු ,සැප්තැම්බර් මාස වලට අදාල ජල බිල්පත් ගෙවීම | 13,525.49 |

| | | | | |
|---|---|---|---|---|
| | 1081 | ජාතික ජල සම්පාදන මණ්ඩලය-කුරුණෑගල | 2025 අගෝස්තු ,සැප්තැම්බර් මාස වලට අදාල ඉඹුල්ගස්දෙනිය පුස්තකාල ජල බිල්පත් ගෙවීම | 1,537.94 |
| | 1082 | එස්.සේනක ඉලංගන්තිලක | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 57,500.00 |
| | 1083 | තක්සේරු දෙපාර්තමේන්තුව | කෑගල්ල පාර කඩ කාමර තක්සේරු කිරීමට අදාළ තක්සේරු ගාස්තු ගෙවීම | 1,257.00 |
| | 1084 | තක්සේරු දෙපාර්තමේන්තුව | පොදු වෙළඳපල 11 අදියර කඩ කාමර තක්සේරු කිරීමට අදාළ තක්සේරු ගාස්තු ගෙවීම | 28,710.00 |
| | 1085 | තක්සේරු දෙපාර්තමේන්තුව | පොදු වෙළඳපල 1 අදියර කඩ කාමර තක්සේරු කිරීමට අදාළ තක්සේරු ගාස්තු ගෙවීම | 29,730.00 |
| | 1086 | තක්සේරු දෙපාර්තමේන්තුව | ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා පරිශ්‍රය තක්සේරු කිරීමට අදාළ තක්සේරු ගාස්තු ගෙවීම | 2,500.00 |
| | 1087 | තක්සේරු දෙපාර්තමේන්තුව | කිණිගොඩ කොරලේ ඉඩම් උකස් බැංකු ශාඛා පරිශ්‍රය තක්සේරු කිරීමට අදාළ තක්සේරු ගාස්තු ගෙවීම | 2,500.00 |
| | 1088 | එච්.ආර්.ඩී.ඒ. හේරත් | ගලි බවුසරය සඳහා තැන්පත් කළ මුදල් ආපසු ගෙවීම | 6,085.00 |
| | 1089 | ඩී.කේ.එම්.එස්. නිලුකා දසනායක | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ගාස්තු ආපසු ගෙවීම | 4,275.00 |
| | 1090 | සභාපති, ප්‍රාදේශීය සභාව ,රඹුක්කන | 2006-2010 පළාත් සභා ආදායම් ලෙස තැන්පත් ලේඛනයේ සඳහන් මේ දක්වා ආදායමට නොගත් තැන්පතු ආදායමට ගැනිම | 1,241,234.89 |
| | 1091 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | 2020 - 2021 ක්‍රීඩා පිටි ,ප්‍රජාශාලා ලබා නොගත් ඇප තැන්පතු ආදායමට ගැනිම | 41,000.00 |
| | 1092 | එම්.ඩී.පී. රාජපක්ෂ | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 1093 | ඩබ්.ආර්.එස්. වර්ෂමාන | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වියදම් ලේඛනය 2025.08.25 සිට 2025.09.25 දක්වා වියදම් ලේඛන ඉදිරිපත් කර තිබෙන්නේ.එහි ගැටුම් තිබේ නම් ඉදිරිපත් කරන්න ලෙස ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

956 සහ 957 මුද්‍රණ දෝෂයක් පවතී. එහි දිනය 2002.07.14 යනුවෙන් සටහන් වි ඇත.එය වෙනස් විය යුතුයි බවට යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලාට මෙහි වෙනත් ගැටළු නැති බැවින් ඒකමතිකව සහා සම්මත වීය.යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025.08.25 දින සිට 2025.09.29 දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරිම සුදුසු බවය තීරණය විය.

**(ඊ).02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. ජයවීර මැතිතුමා**

(i).ඉඹුල්ගස්දෙනිය පුස්තකාල භූමිය සතු විශාල ඉඩම් ප්‍රමාණයක් ඵලදායී ලෙස භාවිතයට ගෙන නොමැත .එහි ළමා උයන නවීන උපකරණ වලින් අලංකාර කර ආකර්ෂණීය ලෙස සකස් කළ යුතුය. දරුවන්ට හා දෙමව්පියන්ට නරඹන්නට,නවීන ආපනශාලාවක් හා පිරිසිදු කර ගැනීමේ පද්ධතියක්ද අවශ්‍ය වෙයි. මේ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඉදිකිරීම් සැලැස්මක් සකස් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. ජයවීර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉදිරිපස භූමියේ ළමා උයන ප්‍රතිසංස්කරණය කිරීමට විශාල මුදලක් වැය වෙන බවයි මට පැහැදිලි වෙන්නේ.ආසනයේ ගරු මන්ත්‍රීතුමා සමග සාකච්ඡා කළා එම සහෝදරයා ප්‍රකාශ කළේ මෙය නවීකරණය කර ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් හොඳ සැලැස්මක් සකස් කර තිබෙන බව ප්‍රකාශ කළා.ඒ සැලැස්ම අනුව වැඩ කටයුතු සිදු කිරීමට අපි සූදානම්ව සිටියහොත් පළාත් සභාවෙන් හෝ භාණ්ඩාගාරයෙන් අපට අවස්ථාවක් ලැබුණොත් යම් මුදල් ප්‍රමාණයක් ලබාගත්ත විගස ලබාදීමට පුළුවන්ය.එම නිසා වර්තමානයට ගැලපෙන සැලැස්මක් සකස් කර තබා ගැනිම සුදුසු බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

සභාපතිතුමනි,අපේ ජයවිර මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත් හොදය.හැබැයි ඉතින් නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර ගන්න අවශ්‍යතාවයකුත් නැත.මොකද අපේ ප්‍රාදේශීය සභාවට අයත් භූමියකි. විධායක ඉංජිනේරු ආයතනයෙන් හෝ පළාත් සභාවෙන් හෝ ඉන්ජිනේරු කෙනෙක් ගෙන්වාගෙන ඇස්තමේන්තු ටික සකස් කරගන්න පුළුවන්. අපට නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතියත් ගන්න අවශ්‍ය වන්නේ නැති බවයි,මං හිතන්නේ.ජයවීර මන්ත්‍රීතුගේ යෝජනාවට මමද එකඟත්වය ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

එතුමා කියන්නේ නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර හොඳ සැලැස්මක් සකස් කරමු කියලා. මොකද නාගරික සංවර්ධන අධිකාරියට හොඳ දැනුමක් තිබෙනවා. නගර සැලසුම් නිර්මාණය කිරිමට අපි ඒක අයගේ දැනුම හා තාක්ෂණය ලබා ගැනීමට යෝජනා කළේ,යැයි ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔව් ඒක හොඳ අදහසක්ය. වටේ පිටේ ඇති සම්පත් යොදාගෙන සාර්ථකව මෙය කරගෙන යමු.එහෙනම් මේ යෝජනාව කවුරුත් අනුමත කරනවා නේද යනුවෙන් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.එන්.සුරංගනී සෝමදාස මැතිතුමිය**

(i).කාන්තාවන් සවිබල ගැන්වීම යටතේ කාන්තාවන්ට ස්වයං රැකියා අවස්ථා සලසා දීම සහ අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා විශේෂ අවධානය යොමු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංගනී සෝමදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.එන්.සුරංගනී සෝමදාස මැතිතුමිය**

ගරු සභාවෙන් අවසරයි.මගේ යෝජනාව වන්නේ කාන්තාවන් සවි බල ගැන්වීම යටතේ කාන්තාවන්ට ස්වයං රැකියා අවස්ථා සලසා දීම සහ අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා විශේෂ අවධානය යොමු කිරීම.අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයෙන් මේ වන විටත් ජාතික මට්ටමින් වැඩපිළිවෙළ ක්‍රියාත්මක වෙනවා.ක්ලින් ශ්‍රී ලංකා, ඩිජිටල්කරණය, දිළිඳු පවුල් නගා සිටුවීම.සම්බන්ධ වැඩපිළිවෙළ වෙනුවෙන් ලංකාවෙන් 53% ක 54% ක වගේ කාන්තාවන් සිටිනවා. ඒ කාන්තාවන්ගෙන් සුළු ප්‍රමාණයක් තමා රටේ ආර්ථිකයට දායකත්වය ලබා දෙන්නේ බහුතරයක් කාන්තාවන්ගේ ශ්‍රමය නිවසේම අපතේ යනවා. එයට යෝජනාවක් හැටියට තමයි කාන්තාවන්ට ස්වයං රැකියා අවස්ථා ලබා දෙන ලෙසට යෝජනා කරන්නේ. මීට පෙරත් අවස්ථාවන් ලබා දීලා තිබෙනවා. ඒත් එය ඵලදායි කාර්යක් වෙලා නැති බව සඳහන් කරන ලදි.මැෂින්,අත්කම් නිර්මාණ කිරීමට උදව් කරලා තිබෙනවා. කෘෂිකර්මාන්තයෙන් උදව් කර තිබෙනවා. නමුත් ඉදිරි ගමනක් යාමට ඔවුන්ට අවස්ථාව සලසා දී නැත. ඒ වැඩසටහන් සඳහා නිලධාරි හතර පස් දෙනෙක් අපේ ගම්වල සිටනවා.ඒ අයගෙත් අවධානය යොමු කරගෙන ඔවුන්ගේ ද උපදෙස් ලබාගෙන ස්වයං රැකියා නිර්මාණයේ සිට අවසාන ප්‍රතිඵලය දක්වා එනම් වෙළඳපලට යාම දක්වාම අපි අත්වැලක් වෙමුයි කියා මා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්/ තුමියල්ලාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා ඔබ ප්‍රදේශයේ සින සියලුම කාන්තාවන් දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිනවා.බව සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

මේ යෝජනාව සම්බන්ධවයි.අස්වැසුම ලබාදෙන පවුල්වලට මේ වනවිට මල් වගාව ආදී නොයෙක් දේ සඳහා අස්වැසුම හරහා ලබා දී තිබෙනවා. මේ වන විටත් රජයේ ආධාර ලබා ගෙන කරගෙන යන අය අපේ ගම්වල පවුල් හතරක් පමණ සිටිනවා.අස්වැසුම යටතේ කාන්තාවන් සවිබල ගැන්වීම මේ වන විටත් කරගෙන යනවා.ඒ ගැන සතුටුයි. මේ යෝජනාවත් හොඳ බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

එතුමියගේ යෝජනාව සම්බන්ධව කාන්තාවක් හැටියට සතුටු වෙනවා.අපේ ප්‍රදේශයේත් අස්වැසුමෙන්, සමෘද්ධිලාභීන් හට ගිය මහින්ද චින්තනය යටතේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩසටහන යටතේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ වැඩසටහන් යටතේ කාන්තාවන්ට ගොඩක් දේවල් ලැබිලා තිබෙනවා. ඒ සඳහා උපකරණ ආදිය බොහොමයක් ලැබිලා තිබෙනවා. ගම් වල ගෘහණියන්ට එමඟින් ප්‍රතිලාභ ගැනීමට අවශ්‍යතාවය තිබුනට අවශ්‍ය දැනුම නොමැතිකම සහ වෙළඳපොළ කඩා වැටීම තුළ බොහෝ ස්වයං රැකියා අවස්ථා අඩපණ මට්ටමක පවතින්නේ. ඒනිසා ඒක කරගෙන යන්න නොහැකිය. කාන්තාවන්ට ස්වයං රැකියාවන් ඉදිරියට කරගෙන යාමට මූල්‍යම ප්‍රශ්න පවතිනවා.මෙම මූල්‍යම ශක්තියක් ලබා දෙනවා නම් ඒකටත් මේ අවස්ථාවේ බෙහෙවින් වටිනවා. ඔබතුමියගේ අදහස හොඳයි. වැඩසටහන හොඳයි. ඒ සඳහා අපිත් ඔබතුමියට අවශ්‍ය උදව් ලබාදෙන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේ වන විට රටේ පවතින ආර්ථිකයත්, ඒ වගේම රට බොහෝම පහළ මට්ටමක තිබෙන්නේ. ඒ වගේ අවස්ථාවක මෙතුමිය ගෙනාව යෝජනාව අපේ ගම්වල සිටින කාන්තාවන්ට විශේෂ අවස්ථාවක් වෙනවා.මේ වගේ ස්වයං රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් විශේෂයෙන්ම ස්වයං රැකියා කිරීමට මූලික ප්‍රාග්ධනයක් යොදා ගැනීමට නොහැකි වීමයි. විවිධ රජයන් මේ සඳහා විවිධ අවස්ථාවල උදව් උපකාර කරලා තිබෙනවා. ඒ වගේම කිසිදු රජයකින් නොකරපු විදිහේ යෝජනාවක් මේ වන විට ඔබ තමුන්නාන්සේලාගේ මැතිවරණ වේදිකාවේ කතා වූ ආකාරයට පොලී රහිත ඇප රහිත ණය මුදලක් ලබා දෙන විශේෂ බැංකු ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. ඒ වගේ වැඩසටහන් මගින් මේ කාන්තාවන් සවි බල ගැන්වීමට ස්වයං රැකියාවක් සඳහා මූලික ප්‍රාග්ධනය සපයා ගැනීම සඳහා ඉක්මනින්ම අවස්ථාව උදාකර දෙන්න කියලා ඔබතුමන්ලාගේ මැදිහත්වීම ඉහළ දේශපාලන අධිකාරිය දැනුවත් කර එය ලබා ගන්නා ලෙස මම යෝජනා කරන බව සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. ජයවීර මැතිතුමා**

මමත් මේ වගේ උනන්දුවක් තිබෙන වැඩසටහන් වලට ඉතා කැමතියි. අතීතයේ සිට එන එකක් තමා ආධාර සහ සහනාධාර හාල් පොත,මුද්දර ,ජන සවිය, සමෘද්ධිය, අස්වැසුම ළඟට එනකම්ම ඇවිත් තියෙන්නේ.හැබැයි මෙම මුදල් ලබාදීම සහනාධාර තත්වයක් බවට පමණක් පත් වන්නේ. මට මතකයි සමෘද්ධි වැඩසටහන ආරම්භ වෙනකොට මුදල් වැඩසටහනක් එක්ක තමයි ආරම්භ වුණේ. ඒක දැනටත් මම හිතන්නේ ඉතිරි කර ගත් මුදල් කෝටි ගාණක් තිබෙනවා. හැබැයි ඒ සහනාධාරලාභීන් තමන් සිටින මට්ටමින් ඉහළට යාමට අවශ්‍ය සම්බන්ධීකරණයක් සකස් වුණේ නැත.ඒක තමයි වුණ ප්‍රධානතම දේ මට දැනෙන විදිහට . මම මාධ්‍යයෙන් ගත්ත තොරතුරු අනුව 71 % ක් මෙවර අස්වැසුම සඳහා ඉල්ලීමට යෝජනා කරලා තිබෙනවා.මොකද අස්වැසුමෙන් හෝ ලබාදුන් සහනාධාර ඔවුන් ඒ සහනාධාර ලාභියා උඩට ගෙනියන්නට රජයේ ප්‍රතිපත්ති ඇතුළත් වුණේ නැත.අපි එදා ඉඳන් ගත්තහම මේ වනවිට ග්‍රාම සේවා වසමක මේවා සම්බන්ධීකරණය කිරීමට ග්‍රාම සේවා නිලධාරී ,සංවර්ධන නිලධාරීන් දෙදෙනෙක් නොයෙක් ආකාරයේ රාජ්‍ය නිලධාරීන් හතක් පමණ සිටිනවා. මාසෙට රුපියල් ලක්ෂ නමයක් පමණ වැටුප් ගෙවනවා. හැබැයි කෘෂිකර්ම සහකාර නිලධාරී, ග්‍රාමසේවක නිලධාරීතුමා ආදී විදිහට හැබැයි මේ කණ්ඩායම් එකට යාවීමක් සිදු වන්නේ නැත. ප්‍රජා සමිතිය යටතේ අදාළ වසමේ පවතින ගැටලු ගෙන ඒම සඳහා සැලසුම් සකස් කරලා තිබෙනවා.මෙහිදී අපි කරන වැඩේ තමයි ප්‍රාදේශීය වචනය ඇතුලේ තිබෙනවා ස්වේච්ඡා සමිති.ගමේ තිබෙන සමිති සංවිධාන එකට එකතු වෙලා සම්බන්ධීකරණයක් ගොඩනගා ගන්න ඕනේ. මේ වගේ යෝජනා සම්බන්ධ මම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කරන බවට සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය**

නදිරා සුරංගනී මන්ත්‍රිතුමිය ගෙනා යෝජනාවට මම ප්‍රථමයෙන්ම බෙහෙවින් ස්තුති වෙනවා. ගරු සභාපතිතුමනි, කිරිවත්දෙණිය කොට්ඨාශයේ පැවති සියලුම රජයන්ගේ නායකයින්ගේ මැදිහත්වීමෙන් බඩුබාහිරාදිය ලබා දී තිබෙනවා.ණය ආධාර ලබා ගෙන බිම් මල් නිෂ්පාදනය, කුකුල් කර්මාන්තය දැනට පවත්වාගෙන යනවා. මේ වන විට අඩුපාඩුවක් වෙලා තිබෙන්නේ වෙළඳපලයි. මේ යෝජනාවත් සමඟම වෙළඳපොළක් ලබාදීම සුදුසුයි. ගොඩක් මේ ණය අත්හැරදමලා තිබෙනවා.සභාපතිතුමාට පැමිණියහොත් බලාගන්න පුළුවන් මම ගිහින් පෙන්වන්නම් හොඳටම කරගෙන යනවා. මොකද අවශ්‍ය භාණ්ඩ ලබාදීලා තිබෙනවා. අතහැරලා දාලා තියෙන්නේ සභාපතිතුමා ඒ අයට අවශ්‍ය වෙළඳපොළක් නොමැති වීමයි. ඒ කියන්නේ පුරන් වෙලා තිබුන ඉඩම් පිටත් අරගෙන ඒ අය වගා කළා. ඒත් ඒ අයට අවශ්‍ය වෙළඳපොළ නැති වුණා. ඒ නිසා වෙළඳපොළ සකස් කරදීම සුදුසුයි.මෙතුමියගේ යෝජනාවත් ඉතා කාලෝචිතයි.යනුවෙන් සඳහන් කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපේ සභාවේ කාන්තාවෝ සිටින බව දැනුනා නේද? ඇත්තටම පැරණි ව්‍යාපෘතියක් ඇති කරගෙන යන්න මෙතුමිය වගකීමක් අරගෙන තිබෙනවා. මේ අනිත් මන්ත්‍රීතුමාලත් එකතු කරගෙන කාන්තාවන්ට ගෙනා යෝජනාව හොඳයි. මෙහි ව්‍යාපෘතිය සැකසීමත් ඔබතුමියට භාරයි. සභාවේ සිටින සියලුම කාන්තා මන්ත්‍රීතුමියන්ලාගේ වගකීමක් වෙනවා. කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩේට උදව් කරන්න. සංවිධානවල පවතින ගැටලු අපට ගෙන එන්න පුළුවන්.අපිට පුළුවන් හැටියට පිළිතුරු දෙමු. කාන්තාවන් සවි බල ගන්වමු.යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

(ii).වහව උපකාර්යාල භූමිය සහ ගොඩනැගිල්ල අලුත්වැඩියා කොට ආදායම් උත්පාදන ව්‍යාපෘතියකට අනුව සකස් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංගනී සෝමදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිරි කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්.එන්.සුරංගනී සෝමදාස මැතිතුමිය**

අධිවේගී මාර්ගය 2026.12.20 වන දා අනිවාර්යෙන්ම විවෘත කරනවා. එතකොට දීර්ඝ ගමනාන්තයකින් පසු අපේ ජනතාවට විවේක ගැනීමට ඉතා සුදුසු තැනක් ලෙස මම හිතනවා. ඒ වගේම තමයි විවේක සුවය කියන්නේ සනීපාරක්ෂක කටයුතු සඳහා කෑම බීම ගැනීමට පොඩි දරුවන්ට විවේකයක් ගැනීමට වාගේ විශාල පහසුකම් ප්‍රමාණයක් අපට සලසා දිය හැකි යැයි මම අදහස් කලේ. ඒ නිසා මෙම යෝජනාව උපයෝගී කරගෙන ඉදිරියේදී ආදායම් උත්පාදනය කිරීම සඳහා යොදා ගනී යැයි මම යෝජනා කරන බව සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙතුමිය ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත් වටිනවා. ඒ වගේම එම යෝජනාව ක්‍රියාවට නැංවීමේදී අපි ඉතාමත්ම පරෙස්සමින් කටයුතු කළ යුතුයි. මොකද කොට්ඨාශ වශයෙන් ගත්තොත් එහෙම රඹුක්කන

ආසනය තුළ රඹුක්කන නගර කොට්ඨාශ හැරුණ කොට දැනට පවතින වටිනාම කොට්ඨාශයක් තමයි පින්නවල කොට්ඨාශය.පින්නවල අලියානාථාගාරය සහ සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ඇති සත්ව උද්‍යානයත් සමඟ එහි වටිනාකම වැඩි වී ඇත. අපි වර්ෂ ගණනාවක් ඉදිරියට හිතලා ගත්ත තීරණ වල වැඩපිළිවෙල නිසා එහි වටිනාකම තවත් වැඩිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම මෙතුමිය සඳහන් කරන ආකාරයට මේ යෝජනාව සභාව සතු ඉඩම එම භූමිය අපට ඉදිරියේදී වටිනාකම අතින් ඉතාමත් ඉහළ තැනකට ගන්න පුළුවන් තැනක් අධිවේගී මාර්ගය පිවිසුමේ තිබෙන නිසා මේ මාර්ගයට මුහුණ දී පවතී. එතකොට අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනේ ආදායම් උත්පාදනය කරනවා කියලා සරල ක්‍රියාමාර්ග ගැන නොවේ. ඉදිරියේදී අධිවේගී මාර්ගයේ පිවිසුමත් සමග තියෙන වටිනාකම අපට ලබා ගැනීමට හැකිවන විදියේ විශේෂ වැඩසටහනක් සකස් කරගන්න ඕනේ.ළමා උද්‍යානයක් ගන්නවාට වඩා ආර්ථිකමය වටිනාකමක් ගත හැකි ලෙස වසර ගණනාවක් ඉදිරියට වටිනාකමක් එක් වන ලෙස සංවර්ධන ව්‍යාපෘතියක් මේ සඳහා යොමු කිරීම අපි අදහස් කළොත් හොඳයි .වෙළඳ සංකීර්ණයකට යාමටද පුළුවන්. විශේෂයෙන්ම කියන්න ඕනේ මේ යෝජනාවට අපි සරලව ගන්නේ නැතුව පුළුල්ව ගිහිල්ලා නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රදේශයේ ඇති රාජ්‍ය ආයතනය සමඟ සාකච්ඡා කර මේ සඳහා වටිනාකමක් ඇති සංවර්ධන ව්‍යාපෘතියක් මේ සඳහා යොමු කරමුයි. මා යෝජනා කරන බව සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. ජයවීර මැතිතුමා**

මෙතුමියගේ යෝජනාව කාලෝචිතයි.මොකද? ආදායම් මාර්ග උත්පාදනයටයි එතුමියයි යෝජනා කරලා තිබෙන්නේ.විශේෂයෙන්ම මතක් කරන්න ඕනේ.මෙම ස්ථානය දීලා තිබුණේ සභාපතිතුමනි, ආයුර්වේද මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සභාවට ලැබුණේ අපේ හිටපු මන්ත්‍රී කෙනෙක් වන තිලකරත්න මහතාගේ දෙමාපියෝ අද එතුමාවත් දෙමාපියන්වත් ජීවතුන් අතර නැත. නමුත් එම ආයුර්වේදයේ වහන එකට එම සමිති අකමැති වුනොත් අපිට ඒක ආපසු දෙන්න වෙනවා.සභාවේ පවතින නීති රීතිත් එක්ක මේකෙ ඉල්ලීම් කරන්න නම් කෙනෙක් නැත.නමුත් පසු අයිතිය පිළිබඳවයි මා කතා කළේ.මේකේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් තිබුණා.අපට අවශ්‍ය කරන ගෙවීම් නොකළ නිසා ඒක වැහුණා. දැන් ඒ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ තිබෙන්නේ අපේ කීර්තිරත්න විහාරස්ථානයේය.මෙය රජයේ ආයතනයක තිබෙන්න ඕනේ. ගෙවීම් කරනවාද කියලා නම් දන්නේ නැත.කොහොම වෙතත් වටිනාම ඉඩම් කොටසක් තමා මෙතුවා කීවා වගේ අධිවේගී මාර්ගයට පිවිසුම් මාර්ගයේ එනකොට හොඳ වටිනා ස්ථානයක් තමා එතැන තිබෙන්නේ.ආදායම් මාර්ගයක් උත්පාදනය කරන්න පුළුවන් වැඩක් සකස් කරගත්තොත් මම හිතන්නේ සභාවට ආදායමක් ලබාගත හැකි ස්ථානයකි.එහෙම ස්ථානයක්ද අද වැහිලා තියෙන්නේ. එතුමිය ප්‍රකාශ කරන්නේ ස්වයං රැකියා සම්බන්ධ කතන්දරෙත් එතැනට ගෙනාවා නම් හරි ස්වයං රැකියා සම්බන්ධව ඔබතුමන්ලාගේ වැඩපිළිවෙළක් තිබෙනවා. එතැනට ඒකට යොදාගන්න පුළුවන් අපි මන්ත්‍රීතුමා කීවා වගේ ආදායම උත්පාදනය කරන තැනක් නම් ඒක වෙනස් වෙන්නත් පුළුවන්, මම ඉතිහාසයයි මතක් කලේ පුද්ගලයෙකු විසින් ත්‍යාග කළ ස්ථානයකි .ඒක අපි දැනගෙන කටයුතු කරමු.යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොහොම ස්තූතියි! අපට ඉතිහාසයේ මතක් කර දුන්නට මන්ත්‍රීතුමනි, ඇත්තටම එම භූමිය අපට ත්‍යාග කරපු තැනක්. එහි වැඩ කටයුතු කරන කොට අපි මුලින් කීවා වගේ සොයා බලා සාකච්ඡා කර අදහස් අරගෙන වඩාත් හොඳ ව්‍යාපෘතියක් කරමු. අපේ අකැමැත්තක් නැත.එහෙනම් බොහොමත් ස්තූතියි.යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).04. ගරු උපසභාපති ඩී ඒ එස් කරුණාරත්න මැතිතුමා**

(i)පාසල් සහ ග්‍රාමීය ජනතාව ඉලක්ක කර ගනිමින් විෂ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව වැඩසටහන් සිදුකිරීම සුදුසු බව ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

තරුණ හා ළමුන් විෂ මත්ද්‍රව්‍ය වලට යොමු වෙලා තිබෙනවා.දෙමාපියන් අසරණ වෙලා සිටින්නේ.දේශන වැඩසටහන් නොව හිතට වදින වැඩසටහන් කිරිමට අවශ්‍යයි.ගීත,නාට්‍ය වැනි දේවල් කිරිම අවශ්‍යයි. 60% ක පමණ ප්‍රමාණයක් සිරගත වන්නේ මත්ද්‍රව්‍ය නිසා, අපි එකතු වී පාසල්,දහම් පාසල් වලට ගොස් වැඩසටහන් කරමු. දැන් පොඩි ළමයි පවා මත්ද්‍රව්‍යවලට යොමු වෙලා. මේ පිළිබඳ අපි යම්කිසි තක්සේරුවක හිටියා නම් මීටත් වඩා එහා ගියපු මේකේ පොඩි දුක් ගැලවිල්ලක් තිබෙනවා. මොකද මේ ළඟදි අවා කාන්තාවක් එයාගේ පුතා විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා රෑ ඇවිල්ලා මෙයා කීවහම ඕක නවත්තන්න කියලා එතකොට කියනවලු මම මැරෙනවා කියලා. මටත් මේ සභාවට ඇවිල්ලා කීවා. මන්ත්‍රීතුමා මේකට මොකක් හරි කරන්න කියලා. එතකොටත් මම මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබුණේ. මේ වගෙන් අන්ත අසරණ වෙලා ඉන්නේ. දෙමාපියෝ ගුරුවරු. ඒ සම්බන්ධව සභාවෙන් පොඩි මුදලකුත් වෙන්කරලා තිබෙනවා. ඒකත් අපිට ප්‍රයෝජනයට ගන්න පුළුවන් වෙයි. මේකට මේ දේශන වැඩසටහනක්ම නෙමෙයි, දරුවන් හා ගමේ අයට හිතට එන ආකල්පමය වෙනසක් හිතට එන වැඩසටහනක් නාට්‍යයකින්, ගීතයකින් වගේ නිර්මාණශීලීව සඳහන් කරලා අපි ඉදිරිපත් කරමුයි කියන එක තමා මම යෝජනා කරන්නේ. අපි හැමෝම කතා කරන්නේ හැමෝම යෝජනා කරන්නේ පාරවල් හදන්න, බල්බ් එක හදන්න කියන භෞතික සංවර්ධනය ගැන පමණයි. නමුත් අපි මේ ආකල්පමය වර්ධනය වෙන්න ඕනේ. අපේ රටේ අනාගතේ තමයි මේ නාස්ති වෙමින් යන්නේ අපිත් දකිනවා රූපවාහින ඉදිරියේ ඉඳ ගත්තහම දවසට මත්කුඩු වාගේ දේවල් අහුවෙලා ඉන්නවා. ඒ වගේම ලංකාව ගත්තහම සිරකරුවන්ගෙන් 60% මේ මත්ද්‍රව්‍යවලට වැරදිකරුවන්ය. වැඩි ප්‍රමාණයක් දරු දැරියෝ සිටිනවා. මම හිතනවා සභාවේ කවුරුත් මේ සම්බන්ධව විරුද්ධ වෙන එකක් නැති බව ,අපි එකතුවෙලා පාසල් වලට තම තමන්ගේ වසමේ මේ වගේ වැඩසටහනක් කරමු. පාසල් වලට ගිහින්, දහම් පාසල් වලට ගිහිල්ලා හොඳ ව්‍යාපෘතියක් වගේ අරගෙන අපි මේ වැඩේ කරමු. ඉහළින් අධිකරණයෙන් පොලිසියෙන් වගේ මේ සැපයුම් මාර්ග අවහිර වෙනවා. විශාල වශයෙන් නීතියේ රැහැණට අහුවෙනවා. එතකොට ඉහළින් සැපයුම අඩු වෙනකොට අපට පහළින් මෙම වැඩසටහන කරගෙන යන්න ඒ සඳහා ඔබතුමන්ලාගේ සහ සභාපතිතුමාගේ සහයෝගය මේ වෙනුවෙන් ලබා දෙන ලෙස සඳහන් කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. ජයවීර මැතිතුමා**

ඉතාම කාලෝචිත යෝජනාවක් .මේ පිළිබඳව අපි කාගේත් හිතේ තිබුණා. මම මේකට යමක් එකතු කරන්න කැමතියි.විශේෂයෙන්ම දරුවන්ට දරුවන්ගේ මානසික තත්වය හදාගන්න මේක හොඳ අවස්ථාවක්.විශේෂයෙන්ම ටියුෂන් පන්ති උපකාරක පන්ති ප්‍රධාන උපකාරක පන්තිවල ගුරුතුමන්ලා, පාසල්වල විදුහල්පතිවරුන් ඒ කොට්ඨාශයේ ප්‍රධාන පාසල් වල විදුහල්පතිවරුන් හා ස්වේච්ඡා සංවිධාන අවමංගල්‍ය සමිති වාගේ එමගින් නාට්‍ය මගින් ගීත මගින් එහෙමත් නැතිනම් වසර අවසානයේ ගොඩක් පාසල්වල විවිධත් ප්‍රසංග පැවැත්වෙනවා. ඒ වගේ අවස්ථාවක පොඩි වේලාවක්

අරගෙන පොඩි නාට්‍යයක් හදලා නැත්නම් උදේ ප්‍රධාන රැස්වීමේදී පොඩි නාට්‍ය සකස් කරලා ඉදිරිපත් කරන්න පුළුවන්කමක් ඇතිවුවොත් එම බලපෑම දිගින් දිගටම කරගන්න පුළුවන් වුනොත් එය ලොකු ජයග්‍රහනයක් වර්තමානයේ පත් වෙලා තියෙන තත්ත්වය එක්ක.ඒකට මම ගමේ තියෙන කාරක සභාවට යෝජනා කළා. ගමේ පවතින සංවිධානයක ඒකරාශී වෙලා මේ වගේ යෝජනාවක් ක්‍රියාත්මක කරනවා නම් ඒ ඉතා කාලෝචිත බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

සභාපතිතුමනි, මමත් මේ යෝජනාවට යමක් එකතු කරන්න කැමැතියි. 1947 ජාතික වැඩසටහන මගින් අපිට මේක පිළිබඳ විවිධ දැනුවත් කිරීම් සිද්ධ වෙනවා . නමුත් ඒවා ඒ වෙලාවට පමණක් සීමා වෙනවා. නීතිමය පදනම ගොඩක් අඩුයි. ඒ අඩුපාඩුව නිසා ඊළඟ පියවරට යාමට කාලයක් ගතවෙනවා. ඒ නිසා ඒක ගණන් ගන්නේ නැත.දවසකට ඇත්තටම බොහෝ මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අලෙවි වෙනවා. ගම්බද ප්‍රජාව වැඩි වශයෙන් මේකට යොමු වෙලා තියෙනවා. පුරුද්දක් වෙලා තියෙනවා. මේවා බොහෝ විට සමාජගත වෙන්නේ නැත. ඒ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා සිටින පුද්ගලයා ඉන් මුදා ගැනීමට කවුරුත් ඉදිරිපත් වෙන්නේ නැත.දේශපාලන අධිකාරිය හෝ ප්‍රදේශයේ සිටින කිසිවෙක් හෝ ඉතින් අපට ඒකට කෙනෙක් පත් කරගන්න පුළුවන්කමක් තියෙනවා.නම් අපි ඒ කෙනාට කියන්නේ එසේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා ඉන්න කෙනා අපට යොමු කරන්න .එතකොට ඔහුට ඉන් මිදෙන්න නැගිටින්න අවස්ථාව සලසා දෙන්න පුළුවන්. මම හිතන්නේ යම් පුද්ගලයකුගේ මානුෂික වැටීම මත තමයි මේ මත්ද්‍රව්‍ය ඇබ්බැහි වෙලා ඉන්නේ. ඔවුනට හරි මාර්ගය පෙන්වා දුන්නොත් ඒ පුද්ගලයාට ඉන් මිදෙන්න හැකියාව පවතී. මම ප්‍රකාශ කරන්නේ මේ අස්වැසුම හෝ සමෘද්ධි ආදිය දෙනවා නම් මේ වගේ පුද්ගලයින් තමා තෝරාගත යුත්තේ. ඉන්පසු අධීක්ෂණය කරන්න. එවිට එම පුද්ගලයා හරි මාර්ගයට ගත හැක ගම්වල යම් යම් පුද්ගලයින්ට ලේබල් ගහලා තියෙන්නේ. ඒ පුද්ගලයාගේ හැකියාව ගැන කිසිවෙක් කතා කරන්නේ නැත.අරක්කු බීලා නැති වෙලාවක එම පුද්ගලයා හා කතා කරන්නේ නැත. ගමේ හැමතැනම හං අඩු ගැහුවම තමා. ඒ ගැන කතා කරන්නේ හැබැයි ඔවුන්ගේ යථා තත්ත්වය හඳුනාගතහොත් ඔවුන් මත්ද්‍රව්‍ය වලින් ගොඩ ගත හැක 1947 ට දවසට බොහෝ දුරකථන ඇමතුම් ලැබෙනවා. ඒවා ප්‍රකාශයට පත් කරන්නවත් නොහැකි ඒවා. අපේම පුද්ගලයින් හරි තැනට යොමු කළොත් ඉතා වටිනවා. අපි අපි ඒ සඳහා පක්ෂ බේදයකින් තොරව සහයෝගය ලබා දෙමු මගේ යෝජනාව බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඉතාමත් ආලෝචිත යෝජනාවක්. උපසභාපතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මටත් යම් ප්‍රකාශයක් කරන්න කියලා පැවසුවාට. ඇත්තටම අද මාධ්‍ය දැක්කහම විලි ලැජ්ජා නැති සංස්කෘතියක් ගොඩනැගිලා තියෙන්නේ. කන්ටේනර් ගණන් මේ කුඩු අල්ල ගන්නේ? මේ ප්‍රශ්නය යනවා. එකිනෙකා එකිනෙකාට මඩ ප්‍රහාරවල් ගහමින් මගේ මේ අත්දැකීම එක කියන්නේ ඒ කාලේ මේ වගේ ව්‍යසනයක් තිබුණේ නැත.ක්‍රීඩා සමාජ කියලා ක්‍රීඩා සමාජ ඇති කරලා තිබුණා. එතකොට රඹුක්කන බාර් තිබුණේ නැත බාර් තිබුණේ කෑගල්ල බස් එකේ ගිහිල්ලා බෝතල් දෙකක් අරන් එනවා. එක්කෙනෙක් ඒක ක්‍රීඩා සමාජයට භාර දීලා ඒක බෙදලා තමයි දෙන්නේ. එහෙම තමයි අරක්කු වික්කේ. කසිප්පු කියන එක අපි පුංචි කාලේ අහලා තියෙනවා නමුත් අපි දැකලා නැත. අද නම් කියලා වැඩක් නැත. මහා පාරේ එනකොට ගොඩක් අය බුදි. හැන්දෑ වෙනකොට හොඳටම ගහලා නින්ද ගිහින් ඉන්නවා.ඉතින් අපි යතුරු පැදි නතර කරලා එතනැන බලලා" අනේ අපෝයි" නියලා හිතනවා. මොකද මේ ආයතන තියෙන වානේ මේවා අල්ලන දන්නවාද කරන වැඩේ. එක්කෙනෙක් ගිහින් දාහක් අරන් එනවා මෙහෙම ක්‍රමයක් තියෙනවා. පොලිසියෙන් ඕන නම් මාවත් අල්ලයි නඩුවක් දායි. බයිසිකලේ යනකොට නඩුවක් දමන්න එහෙමත් බෑ. ඉතින් වරදක් කරන්න ඕනනේ ලයිසන් තියෙනවා නම් ඉන්ෂුවරන්ස් තියෙනවා නම් තව මොනවද ආයේ? ඒත් ඉතින් කියන්න ඕන පොලිසිය මේක නතර

කරන්න කටයුතු කරන්නේ නැත. ඒගොල්ලෝ කසිප්පු විකුණන තැනට ගිහින් රුපියල් දාහක් අරන් යනවා. මම හිතන්නේ මේ බාර් වලිනුත් ඇවිල්ලාත් අරන් යන අයත් සිටිනවා. මේ ව්‍යසනය මේ රටේ කුඩා දරුවෝ එදා ලෝක ළමා දිනය දවසේ කසිප්පු අරන් ගිහින් පාසලේදී බීලා.පාසලේ විනය සම්බන්ධ ප්‍රශ්නයේදී සභාපතිතුමනි ගුරුවරුන්ට දරුවන්ට දඬුවම් කරන්න තමුන් වහන්සේලාගේ ආණ්ඩුවේ ඉඩ දෙන්නේ නැත. අපේ කාලේ නම් අපි ගුටි කාලා තියෙනවා ගුරුවරුන්ගෙන්. ඒ නිසා තමයි මෙහෙම හැදුනේ. මම අරක්කු බොනවා. ඇත්ත කියන්න ඕන නේ හැබැයි ඒ ජරා විදිහට බේබද්දෙක් විදියට කටයුතු කරන්නේ නැත.උත්සවයක්, මගුල් ගෙයක්, යාළුවො කට්ටියක් හමුවුණොත් අරක්කු ටිකක් බොනවා. හැබැයි ජරා විදියට ඒ කටයුතු කරන්නේ නැත.හැබැයි එහෙම කරන අයත් සිටිනවා ඒ නිසා අපේ බල ප්‍රදේශය තුළ අපේ දරුවන් හොඳ මාර්ගයට ගෙන යන්න කරන්න තියෙන්නේ මොකක්ද අපි ඒක කරන්න උත්සාහ කරමු. ඒ නිසා එතුමාගේ යෝජනාව බොහොම හොඳයි. රට හදන්න බැරි වුණොත් අපි අපේ අය හදාගනිමු. වැඩිහිටියොත් හැටියට පවුලේ වැඩිහිටියන් මේකට ඇබ්බැහි වෙලා සිටිනවා නම් පුතා අනිවාර්යයෙන් මේකට නැඹුරු වෙනවා. අපිට තියෙන්නේ වැඩිහිටි සමාජය හරි මාර්ගයට ගන්න. යමක් කරන්න. ඊළඟට ළමා සමාජයේ මං හිතන්නේ අපිට විශේෂ වගකීමක් තිබෙනවා. තරුණ වයසට පත්වෙච්ච දරුවෝ කොහොමද හැසිරෙන්නේ කොහොමද කටයුතු කරන්නේ කියලා. අපි කියන දේ අහන්නේ නැද්ද මට මතකයි සභාපතිතුමා මම ඇඹුල්අබේ. එම කොට්ඨාසයේ මම යතුරුපැදියේ යනකොට හැන්දෑවේ තුනට විතර ඇති. කුඩු ගහලා මොනවා ගහලද දන්නෑ මූණ නිකං කළු වෙලා මගෙන් ඇහුවා ඔබතුමාට බැයිද මට උදව්වක් කරන්න. මම හිනා වෙලා ඇහුවා ඇයි මොකක්ද කියලා .අපේ කොල්ලෙක් පොලිසියට අරන් ගියා බේරලා දෙන්න කියලා. මේ කුඩු ගහලා කුඩු විකුණන එකෙක්. දැන් මට පුළුවන්ද ඔය වැඩේ කරන්න මම තාත්තෙක්ද එහෙම කරොත්, මම කිව්වා ඒකට මාව අල්ලගන්න එපා. වෙන කෙනෙක් අල්ලගන්න කියලා මම ගියා. අමාද්‍යාප කටයුත්තක් සම්බන්ධයෙන් රඹුක්කන අශෝක මහා විද්‍යාලයේ දෙමව්පියෝ දරුවෝ එකතු වෙලා රැස්වීමක් සඳහා මට ආරාධනයක් ලැබුණා විදුහල්පතිතුමාගෙන් එතනට පැමිණෙන්න කියලා. ඉතින් මට කතා කරන්න අවස්ථාවක් දුන්නා මගේ පාසල මම ආදි ශිෂ්‍යයෙක්. පාසලේම ආදී ශිෂ්‍යයේ තමා විදුහල්පති ලෙසත් කටයුතු කරන්නේ. අපිට හරි හයියක් ඒ සලකපු සැලකිල්ලට. මම ඉතා ලස්සන කතාවක් කලා. ඊට පස්සේ ළමයින්ට ප්‍රශ්න අහන්න දුන්නා. ගැහැණු දරුවෙන් නැගිටලා මගෙන් අහනවා මන්ත්‍රීතුමා මේ මත්ද්‍රව්‍ය අලවියට විරුද්ධව ඔබතුමා මොකක්ද කරලා තියෙන්නේ? මම කිව්වා මම කවදාවත් මත්ද්‍රව්‍ය භාවිතා කරපු කෙනෙකුට උදව් කරලා නැත. හැබැයි මත්ද්‍රව්‍ය විකුණලා මන්ද්‍රව්‍ය බීල යම්කිසි පුද්ගලයෙකුට අනතුරක් කරදරයක් වුණා නම් පොලිසියද ඉස්පිරිතාලෙද කරන්න තියෙන උදව්ව මම කරලා තියෙනවා. වැරදි වැඩ කරනකොට මට මතකයි පස් ලොරියක් ඇල්ලුවා. මම පොලිසිය සමඟ බොහොම හිතවත්, මට කීවා පස් ලොරිය අල්ලුවා නිදහස් කරලා දෙන්න කියලා මම ගිහින් ඕඅයිසී මහතාට කතා කළා. එතුමා කිව්වා බෑ බෑ මේවා වැරදි වැඩ ඔයාලා මේවට මැදිහත් වෙන්න එපා කියලා. මේක හොර වැඩක් නෙමෙයිනේ. තමන්ගේ වත්තෙන් කපලා අයින් කරනවා මම එහෙම ඉන්නකොට අපේ ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩාංගණයට පහළ ඉඩමේ පස් කපලා ලොරියකට පටවනවා. යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා මාතෘකාවෙන් පිට ගොස් සිටින බව පවසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මත්ද්‍රව්‍ය පිළිබඳව කටයුතු කරන්න තියෙන තැන තමයි පොලිසිය .පොලිසියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව කතා කරන්න ඕන. සභාපතිතුමා.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා, අපි ඔය සම්බන්ධව දන්නවා. මෙතුමා යෝජනාවක් කළා ඒක හොඳයි. කියලා කතා කළ බව පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

එම යෝජනාව සම්බන්ධව කතා කරන්න එපා කියනවා නම් මම කතා නොකර ඉන්නම්. මෙතුමා තමයි කීවේ ඔබතුමාගේ අත්දැකීම් එක්ක මේ යෝජනාව සම්බන්ධව කතා කරන්න කියලා. කසිප්පු විකුණන එක අල්ලලා දුන්නම ඒක පාවා දෙනවා නම් ඒක මෙතන කතා කරලා තේරුමක් තියෙනවාද මත්ද්‍රව්‍ය, මත් විෂ ද්‍රව්‍ය විකුණන්නේ සාමාන්‍ය මිනිසුන් ඔවුන් අල්ලන්න ඉන්න මිනිස්සු දේශපාලනයත් එක්ක එකතුවෙලා කටයුතු කරනවා. මටත් වෙලා තිබෙන්නේ නිශ්ශබ්දව ඉන්න අපිට කතා කරන්න දෙන්නේ නැති බව පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව තරුණයෙක් විදිහට මමත් සන්තෝෂ වෙනවා. මොකද මේ ගැන අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕන. වර්තමානයේ උද්ගතව ඇති තත්ත්වයත් එක්ක. අපේ රඹුක්කන ආසනය තුළ පමණක් නොවේ මුළු රට පුරාම මෙම උවදුර තිබෙනවා. විශේෂයෙන්ම මේ තත්ත්වයේ උදාවෙන්න ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ තරගකාරී ජීවන රටාව, අධ්‍යාපන රටාව, ඉස්සර කාලේ අපි කුඩා කාලේ මට මතකයි අපි සෙල්ලම් කරන්න අවස්ථාව තිබ්බා. නමුත් වර්තමානයේ තරගකාරී පසුබිම සමඟ දරුවන්ට ක්‍රීඩාව සඳහා යොමු වෙන්න අවස්ථාවක් නැත. පාසල් යනවා අමතර පන්ති යනවා. ඒක තමා ජීවිතය වෙලා තියෙන්නේ. ඒත් එක්කම ඔවුන්ට මානසික නිදහස සඳහා යොමු වන්න ජංගම දුරකථනයට .ඒ වගේම එතැනින් එහාට ගිහින් මෙම විෂ මත්ද්‍රව්‍ය වලට යොමු වෙනවා. අපි මේ යෝජනාවට අදාලව කතා කළොත් අපි සභාවක් විදිහට මෙම උවදුරට ළමයි ගොදුරු වීම වැළැක්වීම සඳහා විශේෂයෙන්ම අපේ ආසනය පුරාම පිහිටා තිබෙනවා වොලිබෝල් ක්‍රීඩාංගන ඒවා බොහොමයක් මේ වන විටත් ක්‍රියාකාරි මට්ටමේ නැත.උදාහරණයක් ලෙස දැලිවල ක්‍රීඩාංගනයේ අපි ළමයි සමග ක්‍රීඩා කරනවා. අපේ ගමේ මන්ත්‍රීතුමා වුණත් ඒ ගැන දන්නවා. නමුත් වොලිබෝල් ක්‍රීඩාංගනය කැලෑ වැහිලා තියෙනවා. මේ පිලිසකර කරගැනීමට විශාල වෙහෙසක් දැරීමට සිද්ධ වෙනවා.මොකද මේ තියෙන ආර්ථික අපහසුතාත් සමග ඒ සඳහා යොමුවෙන්න බැරිවෙලා තියෙනවා. අපිට සභාවක් විදියට මේ වගේ ක්‍රීඩාංගන එළිපෙහෙළි කරලා ළමයි වැඩි වශයෙන් මේ සඳහා යොමු කරවන්න පුළුවන්නම් එමඟින් වටිනාකමක් එකතු වෙනවා. විශේෂයෙන්ම මෙතුමා සඳහන් කළ ආකාරයට පාසල් වලට ගිහින් මේ පිළිබඳව දැනුවත් කරන්න ඒ දැනුවත් කිරීම් වලදී දැනට පොලිසිය වැනි රාජ්‍ය ආයතන මගින් දැනුවත් කිරීම් සිද්ධ වෙනවා. නමුත් ඒ දැනුවත්වීම්වලින් ඔබ්බට ගිය දෙයක් කිසිම අවස්ථාවක සිද්ධ වෙලා නැත. අපි මේ දැනුවත් කිරීම් වලින් එහාට ගිහිල්ලා යෞවන සමාජ පිහිටුවලා ඒ යෞවන සමාජ ක්‍රීඩාවට සාහිත්‍ය වැනි අංග සඳහා ළමයින්ගේ අවධානය මේ බාහිර ක්‍රියාකාරකම් වලට යොමු කර ගැනීමට උත්සාහ කළොත් මේ ළමයින්ට මේ මත්ද්‍රව්‍ය සඳහා යොමුවීමට ඇති ඉඩකඩ ඇහිරෙනවා. අපි අත්දැකීමෙන් දන්නවා. මොකද මම කුඩා කාලයේ ඉඳන් ක්‍රීඩාවේ ඉඳලා තියෙනවා. ක්‍රීඩාවේ මුල සිට හිටපු අපි කවුරුත්ම ඇත්තෙන්ම මත්පැන් පානයටත් යොමුවෙලා නැත.තාමත් වයසින් මුහුකුරා ගියත් ක්‍රීඩාව කෙරෙහි තියෙන්නේ දැඩි කැමැත්තක් ඇල්මක් අපි සෙල්ලම් කරන කාලේ අපි කාටවත් අරක්කු බීලා සෙල්ලම් කිරීමට අවස්ථාව ලැබිලා නැත. දීලාත් නැත. එසේ කවුරු හෝ පැමිණියොත් ඔහු අපට උදව් උපකාර කරමින් ක්‍රීඩාව දෙස බලා සිටීමට පමණයි. අවස්ථාව උදාවුණේ. දැන් ක්‍රීඩා කරන තැනකට ආවොත් එක්කෝ දුරකථනයක් අරගෙන නැතිනම් අපෙන් ඈත් වෙලා ගිහින් නිදහස්ව කාරණයක්

හොයාගෙන මේ විෂ මත්ද්‍රව්‍ය ගෙන, දුරකථනය භාවිතා කර ක්‍රීඩාව නැරඹීමට ඇබ්බැහි වෙලා තියෙනවා. අපි සභාවක් විදිහට මේ යෝජනාව අනුමත කරන අතර මේ සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කරමු. අපි විපක්ෂයක් විදියට මේ සඳහා අපේ සම්පූර්ණ සහයෝගය මේ සඳහා ලබා දෙන්න බවට පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කලින් කතා කළ නිසා යළි අවස්ථාවක් දෙන්න හැකියාවක් නොමැති බව ප්‍රකාශ කලා අතර මේ යෝජනාව සම්බන්ධව ඇත්තෙන්ම අපි සැමගේම වගකීමක්. මේ යෝජනාව සම්බන්ධව සියලු වගකීම් බාරගෙන මන්ත්‍රිවරුන් හැටියට අපි සියලු දෙනාගේ සහයෝගය අරගෙන යෞවන සමාජ ක්‍රීඩා සමාජ ඒක රාශී කරගෙන මේකට අවශ්‍ය නාට්‍ය ද? කුමක්ද? යන්න තෝරාගෙන ක්‍රියාවට නැගීමට සභාවේ සහයෝගය ලැබෙන බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා**

රඹුක්කන ප්‍රාදේශීය සභාව වෙත භාරකාරීත්වය හිමි හිරිවඩුන්න ඇවිදින මන්තීරුව සඳහා පහත යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනානාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. භාරකාර කමිටුවක් පත් කිරීම.
ii. කසල බැහැර කිරීමට විධිමත් ක්‍රමයක් සැකසීම.
iii. සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් සකස් කිරීම.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා**

ඉහත යෝජනා සභාවට ඉදිරිපත් කරන බවට පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා අසනීප තත්ත්වයෙන් සිට නිසා උපසභාපතිතුමාට ඒ ගැන විස්තර කිරිමට අවස්ථාව ලබා දිම සුදුසු බව යෝජනා කළා.

❖ **ගරු උපසභාපති ඊ්.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සභාපතිතුමනි, මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.ඇවිදින මන් තීරුව මීට පෙර රජයයි යටතේ සකස් කරන ලද්දා මේ භාරකාරීත්වය හිමිකර දී තිබෙනවා ප්‍රාදේශීය සභාවට මේ භාවිතා කරන්නන්ගෙන් ගාස්තු අය කර ගැනිමට නොහැකිය.මොකද මෙමගින් ආදායම් උත්පාදනය කිරීම සඳහා අවසර ලබාදී නැත මේ භාවිතා කරන අය මෙන්ම සමාජය වෙනත් පුද්ගලයින්ද මෙම ස්ථානය අපවිත්‍ර කරන අවස්ථා දක්නට ලැබෙනවා. මෙතුමා මේ යෝජනා කරන්නේ මේ සම්බන්ධව භාරකාර කමිටුවක් ඒ කියන්නේ අපේ නිලධාරීන් එතැනට පත් කළහොත් ඒ සඳහා මුදලක් ගෙවන්න සිදු වෙනවා. ගමේ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන්නට කැමති කීප දෙනෙකුගෙන් භාරකාර කමිටුවක් පත් කරලා මෙතනට එන

සංචාරකයින්ගෙන් මෙතැන අපවිත්‍ර වන දේවල් සිද්ධ වෙනවාද ඒ පිළිබඳව සභාව දැනුවත් කිරීමට වාගේ වැඩ වැඩපිළිවෙලක් අපි එයාලට සකස්කර දීමට අවශ්‍ය බව පවසන ලදි.

ii).කසල බැහැර කිරීමට විධිමත් ක්‍රමයක් සැකසීම

මීට වසරකට පමණ පෙර මෙතන කුණු දැමීම අවශ්‍ය කූඩ ස්ථානගත කර තිබිලා තිබෙනවා. නමුත් ඒ සඳහා සභාවේ අනුමැතිය දීලා තිබුණේ නැත.ඒකට හේතුව ප්‍රධාන මාර්ගයේ සිට එතැනට යාමට අපහසු වීමයි. ඒ නිසා දැන් එතන කුණු ගොඩක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධව හොඳ ක්‍රමවේදයකට අපි යන්න ඕන පාරට කිට්ටුවෙන් එම කූඩ ස්ථාපිත කළොත් සේවක මහත්මීන්ට ඒවා ලබා ගැනීම පහසුවෙයි. ඒ වගේම ආදායම් උත්පාදනය කළ හැකි ස්ථානයක් බවට පත් කර ගැනීම සඳහා එහි අංග කීපයක් එකතු කරමු. වැසිකිළි පද්ධතියක්, ඒ වගේම විවේකීව ඉන්න කෑම කන්න වගේ ස්ථානයක් වගේ පහසුකම් ටිකකුත් එතන සලසා දුන්නොත් හොඳයි. ඒ සඳහා ව්‍යාපෘතියක් සකස් කරමු යන්න තමයි මෙතුමා යෝජනා කරන්නේ. මේ වගේ ව්‍යාපෘතියක් සකස් කිරීමට පෙර සභාවේ අනුමැතිය පමණක් නොවෙයි නාගරික සංවර්ධන අධිකාරිය ඒවගේම එතැන ව්‍යාපාර සිදුකරන ව්‍යාපාරිකයන් හා ආයතන සමඟ සම්බන්ධ වෙලා සාකච්ඡා කරලා මේ පිළිබඳ හොඳ යෝජනාවක් සකස් කරමු කියන එක තමයි මේ යෝජනාවෙන් අදහස් කරන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙතුමා සඳහන් කළ ආකාරයට මෙම ඇවිදින මන්තීරුව කිසිදු ආදායම් උත්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්නේ නැත. ඒ නිසා සභාව නඩත්තු කටයුතු සිදු කරන්නේ නැත කියන එක අපිට එල්ල වන චෝදනාවකි. නමුත් මේ ඇවිදින මන්තීරුවට ආදායම් උත්පාදනයක් නෑ කියලා එහි නඩත්තු කටයුතු සිදු කරන්නේ නෑ කියලා කියනවා නම් එය විහිළු සහගතයි. මොකද මෙම ව්‍යාපෘතිය සංචාරක ආකර්ෂණය ඒ වගේම පින්නවල සංචාරක පුරවරයට සමගාමීව තමා මේ කරලා තියෙන්නේ. 2023 සහ 2033 මට මතක විදිහට සංචාරක සැලැස්මක් තියෙනවා. ඊට සමගාමීව තමයි මෙය සකස් කරලා තියෙන්නේ. මොකද මෙම වහාපෘතිය සම්පූර්ණයෙන්ම අවසන් වෙලා නැත. මේ කියන කොටසේ මෙතුමන්ලා සඳහන් කරන ආකාරයට වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා අවකාශයකුත් නැත.අපි ඒ සඳහා වෙනම වැඩපිළිවෙළකුත් සකසා ගත යුතුයි. මොකද ඉදිරිපසින් තියෙනවා බිම් ප්‍රදේශයක් මම මේ යෝජනාවට සමානව යෝජනාවක් ගෙනත් තියෙනවා. එතනදි මම කියන්නම් අපි මොකක්ද කරන්න ඕනේ කියලා. ඒ පිළිබඳව සභාව තුළ සාකච්ඡා කරමු. විශේෂයෙන්ම මේ භාරකාර කමිටුවක් ගැන කතා කරනවා. එම භාරකාර කමිටුව එතනට එන සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සපයන කතාවකුත් කීවා. මොන අදහසින්ද එසේ කරන්නේ කියන එක ගැනම මට ගැටලුවක් පවතිනවා. භාරකාර කමිටුවක් පත් කරගෙන මෙහි ක්‍රියාකාරිත්වය රැගෙන එහි ආරක්ෂාව පිරිසිදු කිරීම වැනි කටයුතුවලට ස්වේච්ඡාවෙන් සම්බන්ධ වෙනවා නම් එය ඉතා අගය කොට සලකනවා. එතනින් ඔබ්බට ගොස් එහි පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ට සේවාවන් සැපයීමට කටයුතු කරනවා නම් අපි ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කළ යුතුයි. ඒ වගේම කුණුබැහැර කිරීම සඳහා අපේ කුණු බැහැර කිරීමේ කූඩ තිබෙනවා. සභාව සතු දේපළක් වුනානම් මෙහෙ ඉහළ කෙළවර තිබෙන දෙයක් වුණත් ලබා ගැනීම සිදු කළ යුතුයි. සභාවට අයිති දෙයක්නේ මෙම පින්නවල ඇවිදින මන්තීරුව ගත්තහම මෙහි ආදායම උත්පාදන අවස්ථාව අඩුයි. ඒ සඳහා විශේෂ උපක්‍රම යොදවමු. මගේ යෝජනාවේදී මම වැඩිදුරටත් මේ පිළිබඳව සඳහන් කරන බවට පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

විස්තර කිරිම පැහැදිලි නැත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාවට යෝජනා ගේනවා අපිත් භාරගන්නවා. මේක අපේ පාරක් නිසාත් නඩත්තු කිරීමේ හැකියාවක් පවතී.කලින් කතා කළ මත්ද්‍රව්‍ය සම්බන්ධව අකටයුතුකම් සිදුවන ස්ථානයක් තමා මෙතන මොකද ඒ මන්තිරුව නිසා පොඩි තෝතැන්නකු සෑදී තිබෙනවා. ඒ කාරණත් එක්ක තමයි මේ යෝජනා ටික එන්නේ. ඊට පසුව ව්‍යුහය හදලා මේකට ඉදිරිපත් කරලා අපි අනුමත කරලා අපි මේක කරමු. නැත්නම් ඇත්තටම මේ සභාව කොච්චර ලොකු උනත් කොච්චර මිනිසුන් හිටියත් නිසි ක්‍රමවේදයක් නැත්නම් ඒක සාර්ථක වෙන්නේ නැත. ප්‍රාදේශිය ලේකම් කාර්යාල තිබුණ කොට්ඨාශ රැසිවිමේදීත් මේ පිළිබඳව අපට චෝදනාවක් ආවා. අපි ඒක ඉදිකළ නිසා පාසල් ළමුන් හතරක් එහි ඉඳලා අල්ල ගත්තා කියලා. ඒක ඉතින් සභාවට කරන්න නොහැකිය.ඒකට ඉතින් පොලිසිය ජංගම සේවාවන් කරන්න ඕනේ. මොනව උනත් අපටත් එහි කොටසක් තිබෙනවා. කසල බැහැර කිරීම අපට පාලනය කරගන්න බැරිවෙලා තිබෙනවා. කසල කුඩ එතන ස්ථානගත කිරීමේ අපහසුවක් අපට තිබෙනවා. එම ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීතුමාට කීපදෙනෙක් යෝජනා කරලා තිබෙනවා. මෙන්න මේ ටික කරමුයි කියලා. ඒ ටික තමයි මේ සභාවට යෝජනාවක් හැටියට ගෙනත් තිබෙන්නේ. ඒ යෝජනාව පිළිඅරගෙන අදාල ක්‍රමවේදයක් හදමු. උපසභාපතිතුමාත් එකතු කරගෙන අපි එතුමාගෙන් ඉල්ලීමක් කරමු එහෙම හොඳයි නේද යනුවෙන් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්. පී.කේ. ධර්මසේන මැතිතුමා**

(i).පින්නවල හිරිවඩුන්න ඇව්දින මන්තිරුවේ වැඩ අවසන් කිරීම හා දැනට අවසන් කර ඇති හිරිවඩුන්න කොටසේ මා ඔය සමීපයේ කොටස යම් සාධාරණ මුදලක් අය කොට මහජනතාව සඳහා ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්. පී.කේ. ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමාගෙන් අපේ මන්ත්‍රී මණ්ඩලයෙන් ලේකම්තුමාගෙන් සහ කාර්ය මණ්ඩලයෙන් අවසරයි. එක ගරු සභාපතිතුමනි. කලින් අපි සාකච්ඡා කළ යෝජනාවේ ආදායම් උත්පාදනය නොවීම සම්බන්ධවයි කතා කළේ. මම මෙහිදී ආදායම් උත්පාදනය කිරීම සම්බන්ධව කතා කරනවා. නමුත් එහිදී පරස්පරතාවයක් ඇති වෙයි .නමුත් මම මේ පැහැදිලි කිරීම් කලහම ඔබතුමන්ලාට පැහැදිලි වෙයි මම යෝජනා කළේ කුමක් ගැනද කියා වේදිකාවක් වගේ කොටසක් මෙහි තිබෙනවා. ඒ කොටස කිසිදු අවසරයකින් තොරව පරිහරණය කරන්න නොහැකිය.ඒ කොටස සම්බන්ධයෙන් මගෙනුත් පෞද්ගලිකව ඉල්ලීම් කරලා තිබෙනවා. සභාවට කතා කරලා මෙතන ගන්න බැරිද කුඩා ළමුන්ගේ උපන්දින අවස්ථා වලදී විවිධ උත්සව අවස්ථාවලදී ගැනීමට ඉල්ලීම් කරනවා. මා ඔයට යාබදව ඉතා අලංකාර ස්ථානයක් තමයි එය. එම කොටස මුදල් ලබා නොගෙන හෝ ලබාගෙන මහජනයාට විවෘත කරන්න පුළුවන් නම් ඉතා අගෙයි. පසුගිය වකවානුවක මම වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා

ලේකම්තුමා සම්බන්ධ කරගෙන මෙම ස්ථානය ගැනීමට විමසීම් කළා. ඒ සම්බන්ධව නිසි වැඩපිළිවෙළක් නොමැති වීම නිසා එම අවස්ථාව අපට මගහැරුණා. එම ස්ථානයට විදුලි ආලෝකයක් ලබා ගෙන තිබෙනවා.එය නිසි ආකාරයකින් නඩත්තු කිරීමක් කරන්න පුළුවන්. මෙතුමන් ප්‍රකාශ කළ ආකාරයට යම් කමිටුවක් පත් කර එතැන පිරිසිදු කිරීම් කටයුතු ,ආරක්ෂා කටයුතු නිසියාකාරයෙන් සිදුවෙයි. එතකොට මෙම ස්ථානයට රුපියල් දාහක් සභාවට ගෙවා අනුමත කරගෙන විවිධ උත්සව සඳහා ලබාදීමට මෙම ස්ථානයෙන් ආදායම් උත්පාදනය කිරීමට අදහසක් පවතී නම් අපේ පද්මසිරි මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට මාස හයකට පෙර එතැනට ගිහිල්ලා එතැන සුද්ද පවිත්‍ර කරලා සාකච්ඡාවක් කළා කීවා. ආදායම් උත්පාදනය කිරීමට සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් බවට හරවන්න කියලා. නමුත් 2023 සිට මේක කිසියම් සංවර්ධන ව්‍යාපෘති සැලැස්මකට අනුව තමයි මේක ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ සැලැස්ම පිළිබඳ අවබෝධයක් ලබාගෙන ඒ සැලැස්මට අනුව ඉදිරි කටයුතු සූදානම් කර ගමු. එතන ඉදිරිපස තිබෙනවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිම් කොටසක්. එය අපේ සභාවට පවරාගන්න පුළුවන්නම් අපිට පුළුවන් එතන ආදායම් උත්පාදනය සඳහා වැඩපිළිවෙළක් සකසා ගන්න පද්මසිරි මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට නාන තටාකයක් නිර්මාණය කිරීමට තමයි අදහස් කරලා තිබෙන්නේ. නමුත් එතන පවතින ජල ප්‍රශ්නය නිසා එවැනි නිර්මාණයක් එතන කිරීම ගැටලු සහගතයි. නමුත් සංචාරකයින් සඳහාත් කුඩා ළමුන් සඳහාත් භූමිය උඩට උස්සලා ළමා උද්‍යානයක් එමෙන්ම විශේෂිත වූ අවන්හල් ක්‍රමයක් එතැන ස්ථාපිත කරන්න ප්‍රළුවන් නම් එමගින් ආදායමක් උපයාගැනීමට අවස්ථාව ලබා ගන්න පුළුවන්. ඒ වගේම ඇවිදින මන්තීරුව පින්නවල දක්වා ඉදිකිරීම් වැඩ කටයුතු සකසා ගන්නා ලෙස මම යෝජනා කරන බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපේ සමීර මන්ත්‍රීතුමා ගෙනාව යෝජනාවට මම අදහසක් ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් අපි නිර්වචනය කරගන්න ඕනේ ඇවිදින මන්තීරුව කියන්නේ මොකක්ද කියලා මම දන්න විදිහට නම් ඇවිදින මන්තීරුව කියන්නේ මිනිසුන්ගේ සෞඛ්‍ය තත්වය නවාලීමට තමයි ඇවිදින මන්තීරුව සාදා තිබෙන්නේ. අද මිනිසුන්ට ඇවිදින්නත් සල්ලි ඕන කියන එකයි මට තිබෙන ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාගේ ප්‍රශ්නයකට මම අහන්නේ අපි දකිනවා කොළඹ පැත්තේ ඇවිදින මන්තීරු තිබෙනවා. රැට තමයි තමන්ගේ සෞඛ්‍ය සම්පන්න බව සඳහා යොදා ගන්නේ. සභාවක් විදියට අපි කරන්න ඕනේ ඇවිදින මං තීරු හරියාකාරව නඩත්තු කරලා දෙන එක තමයි සභාවක් වෙලා ඇවිදින මිනිස්සුන්ගෙනුත් මුදල් අය කරන එක අපි කරන්න හොඳ නැත. අපිට කරන්න පුළුවන් යම්කිසි ක්‍රමවේදයකට එතැන සකස් කර දෙන එක තමයි. එම අදහසට මම විරුද්ධයි. අපි හැම වෙලාවෙම මුදල් මත්තේ යාමට සුදුසු නැත. අපි කරන්න ඕන වැඩේට නිසියාකාරව නිසි ලෙස කළමනාකරණය කිරීම හොඳයි. ඒ ඇවිදින මන්තීරු පරිහරණය කරන පුද්ගලයින් කසල බැහැල කරනවා නම් ඒක කරනවා තමයි. අපි ඒ කසල නිසියාකාරව බැහැර කිරීමට සභාවක් විදියට අවශ්‍ය කටයුතු සිදු කරමු. කරන්න ඕන දේ හරියට කළා නම් හරි යෝජනාවට විරුද්ධ වුණා නොමෙයි. අදහසක් ඉදිරිපත් කළේ ඇවිදින මන්තීරුව කියන එක අපි මුදල් අය කිරීමක් සිදු වුවහොත් එය ව්‍යාපාරයක් කරගන්න එක ගැන තමා අපි කතා කරන්නේ යනුවෙන් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

විස්තර කිරිම පැහැදිලි නැත.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මම මතක් කරන්න ඕන ඇවිදින මන්තීරු කියන්නේ සෞඛ්‍යයට හිතකර වැඩසටහනක්. හැබැයි මගේ දැනීමේ අනුව මට මතකයි රඹුක්කන අශෝක ක්‍රීඩාංගනේ අපි ඇවිදිනකොට රජයේ නිලධාරින් ඇවිත් අපෙන් ඇහුවා මන්තීරුවක් දාලා දෙන්න කියලා මං තීරුවක් දැම්මනම් අනෙක් කටයුතු කරන්න නොහැකිය.අපි විරුද්ධ වුණා සභාවක් විරුද්ධ වුණා. මන් තීරු දාන්න නොහැකිය. කොන්ක්‍රීට් දමලා

ගල් ඇතිරීම සිදු කරන නිසා, පින්නවල ඇවිදින මන්තීරුව තිබෙන්නේ පාර අයිනේ ටිකක් තියෙනවා අපේ ගමේ කෘෂිකර්මයට අයිති ඔය අයිනෙන් යනවා. ඒ resivetion කොටසේ තමයි දාලා තිබෙන්නේ. ඒ ටිකට අපේ සභාවට අයිති නැත. ඒ රාජය දේපළක්ය. සභාවට නොවෙයි. අයිති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටය. resivetion කොටස අයිති.අපට ආදායම් උපයා ගැනීමට නම් එය යොදාගන්න නොහැකිය. හැබැයි එතුමා අදහස් කරන්නේ හිස් ඉඩම් කොටසක් තිබෙනවානේ ඒක කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයිති. ඒ කොහොම වෙතත් ආදායම් උත්පාදන මාර්ගයකට යාමට ගියහොත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ අවිධිමත් භාවයක් උද්ගත වන්නට පුළුවන්. අපේ මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව මේ වැඩිදියුණු කිරීම මඟින් සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් බිහිකිරීමට සභාව මුල් වෙලා ඒ මන්තීරු සකස් කිරීමට පසුගිය කාලයේ සිදු වුනත් පසුව මග නතර වී ඇත. රජයේ ප්‍රශ්නයක් එක්ක.දැන් නැවත සකස් කරමින් පවතිනවා. මා ඔය අයිනෙන් උඩින් එක මන්තීරුවක් තිබෙනවා .අනෙක තිබෙනවා ප්‍රධාන මාර්ගය අයිනෙන් වැට අයිනෙන් අලිගාල ගාව ඉඳන් මේ මන්තීරුව හදාගෙන ආවා. දැන් සංවර්ධන කටයුතු එක්ක දැන් නතර වෙලා කොහොම වෙතත් මං තීරු ප්‍රශ්නයේදී අපි මැදිහත් නොවී සිටියොත් හොඳයි.අලුතින් වියදම් කරන්න දෙයක් නැති.මිනිසුන්ගේ සෞඛ්‍ය සම්පන්න කටයුතු සඳහා අපට හැකි විදිහයට අපි සහයෝගය ලබා දෙන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.පියරත්න මැතිතුමා**

මේ යෝජනාව අනුව සභාපතිතුමා අපි අපේ වපසරිය හඳුනාගන්න ගතයුතුයි. ඇවිදින මන්තීරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉඩමෙහි කොටසක් හා මා ඔය රක්ෂිතයේ කොටසක් පවති.පළමු අදියරයේදී මේක ඇවිදීමයි ව්‍යාපාරයි දෙකක් කරන්න ගියොත් සභාවට හොඳ නැත.මේ සකස් කිරීමේ අරමුණ වූයේ මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමයි. මේ නඩත්තු කිරීම සභාව සතු වුවත් මගින් මුදල් අය කිරීම සඳහා සෘජුව මැදිහත් වෙන්නේ සභාවට නොහැකිය.නමුත් ප්‍රදේශය විදේශීය සංචාරකයින් පැමිණෙන නිසා සභාව මැදිහත් වෙලා සංවර්ධන කටයුතු සිදුකිරීම හොඳයි. නමුත් මමත් මෙය ව්‍යාපාරයක් කරගෙන මුදල් අය කර ගැනීම සම්බන්ධව මම විරුද්ධත්වය බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමනි, ඒ යෝජනාවේ පැන නැගී ඇති ගැටලුව තමයි මේ ආදායම් උත්පාදනය කිරීම යන්න ඒත් එක්කම මෙතන ආරක්ෂාව සම්බන්ධවද ගැටලුවක් පවතී. කිඹුලන් ගැවසෙනවා නම් ඇවිදීමද ප්‍රශ්නයක් මොකද මම පැහැදිලිවම කීවා උත්සව අවස්ථාවන්වලට විශේෂ අවස්ථාවන්වලට තමයි එම ඉඩ ලබා දෙන්න කීවේ. මෙතැනදී අපි ආදායම් උත්පාදනය පසෙක දාලා මෙම ස්ථානය සඳහා අවසර ලබාදීමක් කිරීමට හැකි නම් ඉතා වටිනවා. මට එවැනි යෝජනා රාශියක් ඇවිත් තිබෙනවා මම ඒවා ලේකම්තුමත් සමග සාකච්ඡා කර තිබෙනවා. ඒත් එක්කම මේ ඇවිදින මන්තීරු සාර්ථකව නිම කර නැති නිසා එහි සුගතියකුත් අපි දකින්නේ නැත.ඉදිරි වැඩකටයුතු ඉක්මනින් කරගැනීමට අවශ්‍ය හැකිව පවතිනවා නම් ඒ වටිනවා. මෙම ව්‍යාපෘතිය ඇත්තටම දේශීය සංචාරකයින්ට වඩා විදේශ සංචාරකයින් ඉලක්ක කර නිර්මාණය කරන ලද්දක්ය. මෙය ආරම්භක අවස්ථාවටද අපි සහභාගී වී තිබෙනවා.මෙම යෝජනාවේ ආදායම් උත්පාදනය යන කරුණ ඉවත ලා අදාළ ස්ථානය විවෘත කිරීම අවශ්‍ය අවසරය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස යෝජනා කරන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ වගේ යෝජනාවක් ආවහම අපි සාධනීය වෙන්න ඕන මොකද පින්නවල කිච්චහම සංචාරක කලාපයක්. ජාතික ආදායමේ වැඩි කොටසක් සංචාරක ව්‍යාපාරයෙන් ලැබේ.මොකද මේ රට සංවර්ධනය වෙන්න සංචාරක අමාත්‍යාංශ නිසායි. රාජ්‍ය සම්බන්ධීකරණ කමිටුව දිස්ත්‍රික් සංවර්ධන කමිටුව සභාව අතර සාකච්ඡා නිරන්තරයෙන් පවතිනවා.මෙය සංවර්ධනය කිරීමට ඔබතුමා දුන් අදහස් අපට බැහැර කරන්න නොහැකිය. මුදල් අයකර හෝ නොකර මෙ ලබා දෙනවා ද යන්න පිළිබඳ අපි

සාකච්ඡා කළ යුතුය.මෙම කොටස විවෘත කරනවාද යන්න පිළිබඳ අපි සාකච්ඡා කළ යුතුයි සභාවේ පරිපාලනයට ගත් පසු මේ යෝජනා දෙක එකතු කරලා ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙලක් යොදා ගනිමු. කිසිදු රාජ්‍ය ආයතනයකට ඔය වගේ එකක් පරිපාලනය කරන්න නොහැකිය.ඒක කරන්න සභාවකට තමයි පුළුවන් එතකොට අපිට මුදල් අයකර ගන්න පුළුවන් කොහොම වුණත් පිරිසිදු කිරීම් අපි සිදු කරන්න වෙනවා ඒක අපේ රාජකාරිය වෙලා තිබෙන්නේ. අලි අනාථාගාරය ඉස්සරහ අපි පිරිසිදු කරන්න ඕනේ අපට මොකුත් නොලැබේ. ප්‍රාදේශීය සභාවක් හැටියට අපටද මඟහරින්න නොහැකිය. පරස්පර අදහස් දැක්වීමෙන් වැළකිලා හොඳ පැත්ත ගැන කතා කරමු. මෙම යෝජනා දෙක ඒකාබද්ධ කරලා සභාවට නැවත යෝජනා කරලා මන්තීරු ඉදිරිය කරගෙන යාම සුදුසුය. පොලිසියේ සම්බන්ධ වීමක්ද නොමැති නිසා අපි මැදිහත් වෙලා කටයුතු කරමු. මොකද මේක ආයතන කිහිපයක එකතුවක්. දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදීත් මේ ගැන කතා වුනා. නාගරික සංවර්ධන අධිකාරියෙන් තමයි සම්පූර්ණ ඉදිකිරීම් හා නිර්මාණය සිද්ධ කරන්නේ අපි එයාලට අපි අදහස් ඉදිරිපත් කරමු යනුවෙන් පවසන ලදි.

(ii).පදවිගම්පල මාදන මාර්ගය හා මාදන රන්දෙණිය මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්. පී.කේ. ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පදවි ගම්පල මාදන මාර්ගය විවිධ අවස්ථා වලදී සංවර්ධනය කලද වෙළ මැද කොටස නිසියාකාරය සංවර්ධනය වී නැත. පදවි ගම්පලත් මාදනත් යා කරමින් පවතින මාර්ගය තමා මෙය අධික වර්ෂාව පවතින කාලයේදී මෙම මාර්ගය භාවිතා කිරීම අපහසු බව ප්‍රදේශවාසීන් වාර්තා කර තිබේ.සභාව විසින් ජේ.සී.බී යන්ත්‍රයක් හෝ ස්කැවේටර් යන්ත්‍රයක් භාවිතා කර මෙම මාර්ගය මීට වසර දෙකකට තුනකට කලින් පිළිසකර කරන ලදී.සභාවක් හැටියට අපට පුළුවන්නම් මෙම මාර්ගය පිළිසකර කර දෙන්න ඒ ඉතා අගය කොට සලකමි.ඒ වගේම තමයි මාදන මාර්ගයේ ටික දුරක් යන විට පදවිගම්පල මාර්ගය හමුවේ.එම මාර්ගයේ පවුල් කිහිපයක් ජීවත් වේ. නමුත් 2022 වර්ෂයේදී රුපියල් ලක්ෂ දහයක මුදලක් සංවර්ධන කටයුතු සඳහා වෙන්කර ගත හැකි වුවද එම ව්‍යාපෘතිය සිදු කිරිම නොහැකි වුණා.ව්‍යාපෘතිය මෙම මාර්ගයේ දිග මීටර් 300 ක් පමණ වෙයි. කොන්ක්‍රීට් කිරීමට හා වෙනම දෙයක් හරි යොදා මෙම මාර්ගය පිළිසකර කරනවා නම් ඉතා හොඳයි.2026 වර්ෂයේ ක්‍රියාවට නැංවිය හැකි වේ යැයි සිතා මම මේ යෝජනාව සභාවට ඉදිරිපත් කළේ.මාර්ග සම්බන්ධව මොන යෝජනාව ඉදිරිපත් කළත් මම පෞද්ගලිකව දන්නවා ඒවා ක්‍රියාත්මක නොවන බව.මොකද අපි දැලිවෙල මාර්ගය ගැන කතා කළා අයවැයෙන් විශාල මුදලක් අපට වෙන්කරන්න නොහැකිය. කඩතොලු මකාගන්න වගේ දේකට යා හැකිය.දැලිවල කොට්ඨාශයට රුපියල් ලක්ෂ තුනක පමණ මුදලක් වෙන්වෙලා ක්‍රියාත්මක කරලා තිබෙනවා නමුත් අපේ ආසනය පුරාම විවිධ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ලක්ෂ විස්ස, ලක්ෂ දහය, ලක්ෂ 15 වැනි විශාල මුදල් වෙන් වී තිබෙනවා.මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනවා අපි ගෙනා යෝජනා නොවේ.ඔබතුමාලාගේ පාලන කාලයේ මහජනයාට දුන් යෝජනා ඒ නිසා ඒ යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලෙසත්,මෙම යෝජනා කළ මාර්ගය අපි දන්නා බැවින් එම මාර්ගය සංවර්ධන කරන බවට පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

*තීරණය -*

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

(iii).ප්‍රදේශයේ ක්‍රීඩා, සංගීත වැනි අංශ වලින් රඹුක්කන ආසනයට ජාතික හා ජාත්‍යන්තර කීර්තියක් ලබාදුන් අයවලුන් සඳහා ඇගයිමක් සිදුකිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්. පී.කේ. ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව පී.ජී.ආර්.කීත්සිරි සුමනරත්න මැතිතමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ආසනයේ චතුරංග ක්‍රීඩකයා පසුගිය ජාතික මහා කීඩා උළෙලේදී සබරගමු පළාතේ හොඳම කීඩකයා වශයෙන් තේරී පත්වුණා.ඔහුට දැන් වයස අවුරුදු හතළිස් හතක් පමණ වෙනවා තරුණ ක්‍රිඩකයින් සමග සෙල්ලම් කරලා ජාතික මට්ටමට යාමට තරම් ඔහු අපිට ඉතා ගෞරවයක් ලබා දුන්නා එතුමන්ට ගෞරවයක් වශයෙන් අපට පුළුවන්නම් එතුමාව අගයිමකට එකට ලක් කරන්න ඒ ඉතා වටිනවා.අපේ මාධ්‍යවේදීන් කිහිප දෙනෙකුත් සිටිනවා අවුරුදු ගණනාවක් තිස්සේ අපේ බල ප්‍රදේශයේ තොරතුරු වාර්තා කරමින්.මහජන දැනුවත් කිරීමක් හෝ ඔවුන්ගේ කාර්ය ඇගැයීමකට මෙතෙක් ලක්වෙලා නැත.ඒවගේම අපේ බල ප්‍රදේශයේ උගතුන් විශාල ප්‍රමාණයක් ද සිටිනවා.විශේෂයෙන්ම ජේ.බී.දිසානායක පුවක්මොටේ මගේ පාසලේ ආදී ශිෂ්‍යයෙක් අපේ බල ප්‍රදේශයටත් ලංකාවටත් ජාත්‍යන්තරයටත් පිළිගන්නා මහාචාර්යවරයෙක්.ඒවගේම සණස බැංකුවේ නිර්මාතෘවරයා වන කිරිවත්දෙණි මැතිතුමා.ඒ වගේම ජාත්‍යන්තරය නියෝජනය කළ ක්‍රීඩකයෝද සිටිනවා.පුහුණුකරුවෝ සිටිනවා.පොලිසියේ බන්ධනාගාරය වැනි ආයතන වල ප්‍රධාන කණ්ඩායමවල නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිටිනවා. කිසිම අවස්ථාවක ඇගේමකට ලක්වී නැත. අපට පුළුවන්නම් මේ පුද්ගලයින් ඇගයිමට ලක් කරන්න ඒක ඉතාමත් අගෙයි.හැකි ඉක්මනින්ම මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

විවිධ අවස්ථා කිහිපයකදීම ජාත්‍යන්තරයට ගිය විශේෂයෙන්ම ඇගයිමට ලක් කළ යුතු ඇවිදීමේ පුද්ගලයා වන වික්‍රමසිංහ මහතා ද මේ අවස්ථාවට සම්බන්ධ කිරීම සුදුසු බව මම යෝජනා කරනවා.මොකද ඔහු යාපනයේ සිට දෙවුන්දර තුඩුව දක්වා ඇවිදපු පුද්ගලයෙක්.ඔහුටද උපහාරයක් දක්වන ලෙස මම යෝජනා කරන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඇත්තෙන්ම මෙම යෝජනාව වටිනවා. කළ යුතු වැඩක්.ගැටළුවකට පවතින්නේ ඇගයිමට ලක් කළ යුතු පුද්ගලයින්ගේ නාම ලේඛනයක් සකස් කර ගැනීමයි. එය සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා එක් වී දෙසැම්බර් 31 ට ප්‍රථම උපහාර උළෙලකට යාමට අවශ්‍ය කටයුතු සූදානම් කර ගන්නා ලෙස දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී..මල්ලිකා මැතිතුමිය**

(i).පුවක් මොටේ වසමේ පුවක්මොටේ ආපදා කළමනාකරන මධ්‍යස්ථානය ඉදිරිපිට පස් කණ්ඩිය කපා ඉවත් කර එම සුසාන භූමිය ශුද්ධ කර ගැනීම සඳහා J.C.B.යන්ත්‍රය ලබා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී..මල්ලිකා මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ජී..මල්ලිකා මැතිතුමිය**

අපේ වසමට අදාල නිලධාරීන් රැදී සිටින්නේ ආපදා කළමනාකරන මධ්‍යස්ථායේය.එය තමා සේවා කාර්යාලය ලෙස පවත්වාගෙන යනු ලබන්නේ.එම ගොඩනැගිල්ලේ ඉදිරිපස ගල් සහ පස් කන්ඩියක් තිබෙනවා.එය ඉවත් කර දෙනවානම් ඉතා හොඳයි කියා මා යෝජනා කරනවා.ඒත් එක්කම පුවක්මොටේ සුසාන භූමිය මානවලින් වැසී ඇති අතර අලියකු ගියද පෙනෙන්නේ නැති තරම්ය.එම සුසාන භූමියද සුද්ද කර දෙනවා නම් හොඳයි කියා යෝජනා කරනවා.තවද යටගම සුසාන භූමිය ට අයිතිව තිබූ භූමි ප්‍රමාණය මේ වන විට අඩු වී තිබෙනවා. එහි විවිධ පුද්ගලයින් විසින් ගෙවල් හදාගෙන තිබෙන නිසා.දැනට ඉතිරි වී තිබෙන ප්‍රමාණයවත් සුද්ද කර මායිම් සකස් කිරීම සුදුසු යැයි යෝජනා කරන බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලිරෝහණ මැතිතුමා**

ජේ.සී.බී යන්ත්‍රය සුසාන භූමි සඳහා යොදා ගැනීම තහනම්. විශේෂ අධිකරණය අනුමැතියක් අවශ්‍ය වෙනවා ඒ සඳහා. එම නිසා ශ්‍රමදාන මට්ටමින් එළිපෙහෙළි කිරීම සුදුසු බව යෝජනා කරන බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ජී..මල්ලිකා මැතිතුමිය**

සභාපතිතුමා සුසාන භූමිය බැරි නම් ආපදා කළමනාකරන මධ්‍යස්ථානයේ ඉදිරිපස පස් කොටස ඉවත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින බව සඳහන් කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජේ.සී.බී යන්ත්‍රය ආපදාවට ලක්ව අලුත් වැඩිය කටයුතු සඳහා යොමු කර ඇත. ඒ සකස් කළ පසුව ඔබතුමියගේ යෝජනාව සලකා බලමු. සුසාන භූමි සඳහා ජේ.සී.බී යන්ත්‍ර දැමීම සිදු කළ නොහැකි. ඒ සඳහා උසාවි නියෝගයක් ලබාගත යුතු බව දන්වා සිටිමි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ආපදා කළමනාකරන මධ්‍යස්ථානයේ අලුත් වැඩියා කිරිම ක්‍රියාත්මක කිරිමට තීරණය විය. සුසාන භූමි සඳහා ජේ.සී.බී යන්ත්‍ර දැමීමට උසාවි නියෝගයක් ලබා ගත යුතුය.

**(ඊ).08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී .ආර්. නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

1. අප ප්‍රාදේශීය සභාවට (pc -30) එස් කැවේටර් යන්ත්‍රයක් සහ කියුබ් එක ටිපර් රථයක් මිලදී ගැනීම කාලෝචිත බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්. නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී .ආර්. නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

මෙම යෝජනාව වසර ගණනාවක් තිස්සේ සභාවට එන යෝජනාවක්. ඔබතුමාට නම් මේ සම්බන්ධව ගැටලු මතුවන්නට නැතුව ඇති. මොකද පසුගිය වසර දෙක තුනක ඉතිහාසයේ මෙම ප්‍රදේශයේ නාය යෑම්වලට ලක්වුණා. ඒ අවස්ථාවලදී කුඩා skavatar යන්ත්‍රයක් නැතිව, හිටපු සභාපතිතුමා, ලේකම්තුමා සැහෙන අපහසුතාවයකට මුහුණ දීමට සිදුවිය. එවිට scavator යන්ත්‍රය ලබාගැනීමට පුද්ගලික ආයතන වෙත යාමට සිදුවේ. එවිට පුද්ගලික ආයතන සඳහා විශාල මුදලක් අපට ලබාදීමට සිදුවිය. සභාවේ අරමුදලින් හෝ ෆිනෑන්ස් ආකාරයට හෝ මෙම ස්කේවේට යන්ත්‍රයක් හෝ ටිපර් රථයක් මිලට ගන්නවා නම් අපේ මුදලක් ඉතිරි කර ගැනීමට හැකිවේ. වාර්තා පරීක්ෂා කෙරෙන කොට සුසාන භූමි සුද්ද කිරීමට ආපදා අවස්ථාවලදී පස් ඉවත් කිරීමට සැහෙන මුදලක් පෞද්ගලික ආයතන වලට ලබා දී තිබෙනවා. අපේ මන්ත්‍රීවරු සිටිනවා පූර්ණ කාලීනව දේශපාලනයට කැපවෙලා. ඔවුන්ට රාජ්‍ය ආයතනයකින් ස්කැවේටර් යන්ත්‍රය හැසිරවීම සම්බන්ධව පුහුණුවීමක් ලබා දීලා, අවශ්‍ය අවස්ථාවලදී භාවිතා කිරීම මඟින් එය ආදර්ශයක් වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙය කාලෝචිත යෝජනාවකි. අපේ සභාව දිගින් දිගටම පෞද්ගලික ආයතන වලින් මෙම සේවාව ලබා ගන්නේ. ඒ සඳහා සැහෙන වියදමක් සභාවට දැරීමට සිදුවෙනවා. සභාවට මුදල් නොමැති බව කීමට නොහැකිය, පළාත් සභාවෙනුත් ප්‍රතිපාදන වෙන්වෙන නිසා. විපක්ෂ අපිටත් මේක ලොකු හයියක්. ඒ නිසා මේ යන්ත්‍ර දෙකම මිලට ගැනීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පවතින රජයෙන් ප්‍රාදේශීය සභාවල පවතින දුෂ්කරතාවයන් පිළිබඳ තොරතුරු විමසන ලදී. එහිදී මේ පිළිබඳව අපි කරුණු ඉදිරිපත් කර තිබේ. බොහෝ දුරට ඊළඟ වර්ෂයේදී මේ යන්ත්‍ර දෙකම නොමිලේ අපට ලැබීමට ඉඩ තිබේ. එසේ නොවුන හොත් මිලදී ගැනීමේ ක්‍රියාවලියකට යාම සුදුසු බව යෝජනා කළ අතර එය භාර ගන්නා බව පවසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී. ජී.ආර් .කිත්සිරි සුමනරත්න මැතිතුමා**

(i).පහළගම ගම් සභා පාරේ ඉතිරිව ඇති මීටර් 500 කොටස සකසා කොන්ක්‍රීට් අතුරා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **පී. ජී.ආර් .කිත්සිරි සුමනරත්න මැතිතුමා විසින්** යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී. ජී.ආර් .කිත්සිරි සුමනරත්න මැතිතුමා**

මෙහි මීටර 200 පමණ කොන්ක්‍රීට් කරන්න තිබේ. ඉතිරි මීටර් 300 කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට ඇත.එහෙත් එම ප්‍රමාණය තැනින් තැන කැඩී ඇත. ඒ ටිකත් එක්ක මුළු ප්‍රමාණය මීටර් 500 පමණ

ප්‍රදේශයක් තමයි කොන්ක්‍රීට් කිරීමට පවතින්නේ. එය ඉටු කර දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

හොඳයි මන්ත්‍රීතුමා, අපි තර්ක විතර්ක නොකර ඒ පිළිබඳව සොයාබලා කටයුතු කිරීමට මේ අවුරුදේ නොහැකි නම් ඊළඟ වර්ෂයේ යෝජනාවන්ට හරි දමා ඉටු කර දෙන්න අවශ්‍ය කටයුතු සලසා දෙන බවට ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී. ලයනල් සරත් කුමාර මැතිතුමා**

(i).යටිවල්දෙනිය වසමේ දුම්රියපොළ ප්‍රධාන මාර්ගයේ ලියන ගෙදර ළඟ කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **එච්.ජී. ලයනල් සරත් කුමාර මැතිතුමා විසින්** යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී. ලයනල් සරත් කුමාර මැතිතුමා**

යටිවල්දෙනිය වසමේ දුම්රියපොළ ප්‍රධාන මාර්ගය ඉතාම අබලන් මට්ටමක පවති. මාර්ගය කොන්ක්‍රීට් කර තිබුණට එම කොන්ක්‍රීට් කඩතොළු වි ඇත. මම යෝජනා කරන්නේ සම්පූර්ණයෙන්ම කොන්ක්‍රීට් යොදන්න කියලා නොවෙයි. මේ කඩතොලු ටික පිළිසකර කරලා දෙන ලෙසයි. මොකද මහජනයා අපට දෝෂාරෝපණය කරනවා මහා පරිමාණ ව්‍යාපෘති කරනවා,ගමකට යන්න පුළුවන් විදිහකට ගමට දෙයක් කරන්න ඕනේ. නැතිනම් අපි ගමට මොකක්ද කළේ අහනවා. යටිවල්දෙණිය කියන්නේ කන්ද බෑවුම් සහිත ප්‍රදේශයක්ය. වැසි කාලයට පාරවල් දිගේ වතුර යන,වතුරට යට වන වසමක් හදිසියේ ලෙඩෙක් වත් රැගෙන ත්‍රිවිල් රථයකටවත් යාම අපහසුය. ඔබතුමා ස්ථානය පරීක්ෂාවක් සිදුකර ඒ කාර්යය ඉටු කරවා දෙනවා නම් ඉතා හොඳයි. එම වසම මට අයත් නොවුනත් යන්න ප්‍රකාශ කරන ලදි.

(ii).යටිවල්දෙනිය වසමේ අම්බාව මාර්ගයේ ඉහල කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **එච්.ජී. ලයනල් සරත් කුමාර මැතිතුමා විසින්** යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **වී .ආර්. නන්දික බණ්ඩාරනායක** මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී. ලයනල් සරත් කුමාර මැතිතුමා**

අම්බාව මාර්ගය කියන්නෙත් ඒ වගේම තමයි. ඔබතුමා ගිහින් තියෙනවද දන්නෙත් නෑ මොකද ඒ tower එක ළඟින් උඩට ගියාම එම මාර්ගය භාවිතා කරන පුද්ගලයින්ට එම මාර්ගයේ පළල අඩි හයක් අඩි අටක් වගේ ප්‍රමාණයක් තිබෙන්නේ. එම ඉහල කොටස සංවර්ධනය වි නොමැත. ඔබතුමා ඒ ප්‍රදේශයට ගොස් ඒ පුද්ගලයින්ටත් සාධාරණයක් කරලා දෙනවා නම් හොඳයි කියලා හිතනවා. ඔවුන්ව අතහැර දමා ඇති තත්ත්වයක් තමයි පෙනෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර ඒ කොටස සංවර්ධනය කර දෙන මේ කාරුණිකව ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

යෝජනාවන් දෙකම එම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා.යටිවල්දෙණිය වසමේ එම මාර්ග දෙකම අපි දන්නවා. එහි පළමුවෙන්ම සඳහන් කළ දුම්රියපොළ ප්‍රධාන මාර්ගයට පසුගිය පළාත් සභා ප්‍රතිපාදන යටතේ ලක්ෂ විස්සක සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ ඇස්තමේන්තු සකස් කර අපි ඉදිරියට යවලා

තිබෙන්නේ. කාණු පද්ධතිය හා ඒ අදාල ස්ථානය ඇස්තමේන්තු සකස් කර යවලා තිබෙනවා. එය ක්‍රියාත්මක වෙයි කියා ප්‍රකාශ කර සිටිනවා.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේ මාර්ග දෙකෙහිම සංවර්ධන කටයුතු සිදුවෙනවා නම් ඉතාම වටිනවා.අපි බලාපොරොත්තු වන ආකාරය සංවර්ධනයක් මේ අවස්ථාවේ සිදු කරන්න බැරි වුනත් වලවල් ටික වහන්නවත් මොනයම් හෝ වැඩපිළිවෙළක් සකස් කරගන්න ඕනේ. විශේෂයෙන් අපේ සභා අරමුදලින් කරන්න පුළුවන් ලොකු වියදමක් නැතිව චිප් ගල් යොදලා එම වලවල් වහන්නයි. එය ඉතා සාර්ථක ක්‍රමයක්ය.උදාහරණයක් විදිහට කොටවැල්ල මාර්ගය එවැනි සංවර්ධන කටයුත්තක් සිදු කළා. අධිවේගී මාර්ගය පැමිණීමත් සමඟ එය නැවත කඩ තුළ වුණා. නමුත් යම්තාක් දුරකට සාර්ථක ලෙස තිබෙනවා. ඔබතුමන්ලා අවධානය යොමු කරමු. විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු ඉදිරිපත් කරන සියලුම මාර්ග සංවර්ධනය කිරීමට ඔබතුමන්ලාට නොහැකි බව අපි දන්නවා. නමුත් කඩතොළු වෙලා ඇති තැන් අපේ කාර්මික නිලධාරීන්ගේ උපදෙස් මත සකස් කර දෙනවා නම් බොහෝම වටිනවා යැයි මම යෝජනා කරන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී. ලයනල් සරත් කුමාර මැතිතුමා**

මගේ පළමු යෝජනාව තමයි සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා කියන්නේ. ඒ නිසා මගේ දෙවැනි යෝජනාවල මාර්ගය පිළිබඳ ඔබතුමා ස්ථානයේ පරීක්ෂාවක් කර බලන ලෙස ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ලයනල් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවල සඳහන් වෙනවා යටිවල්දෙණිය ප්‍රධාන දුම්රියපොළ පාර සම්බන්ධව මට එම ගමේ පන්සලේ හාමුදුරුවෝ ප්‍රකාශයක් කළා කඩිගමුව දුම්රියපොළ පාර සංවර්ධනය කිරීමට ආව අයට ආපහු යන්න කියලා. මෙහෙන් පණිවිඩයක් යැව්වද කියලා,දන්නවාද කියලා.මම කීවා දන්නෑ කියලා. සභාපතිතුමා ඔබතුමා දන්නවා ඇති ඇයි එහෙම ආපහු යැව්වේ කියලා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා එම කටයුතු දැන් බොහෝ දුරට සාර්ථකයි. අපිට එකඟ වුණා. එම කටයුතු කරනවා කියලා. ඒ සඳහා අනුමැතියක් ලබා දුන්නා. ඔබතුමා කොහෙන් ප්‍රශ්න අරන් ඇවිත් අහනවාද මම දන්නේ නැත. මම ඒ සඳහා අනුමැතිය ලබා දීලා තිබෙන්නේ, අඟල් පහක කොන්ක්‍රීට් එකක් දමන්න තිබෙන පළල සුද්ද කරලා ඒ වැඩේ වෙන බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.ටි.බි.තෙන්නකෝන් මැතිතුමා**

(i).මෙවර පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත්වූ සියලු මන්ත්‍රීවරුන් සඳහා 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත හා රීති සම්බන්ධව පුහුණු වැඩමුළුවක් පවත්වා ඒ සම්බන්ධ දැනුවත් කිරීමක් කර දෙන මෙන් පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා යැවීම සුදුසු බව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.ටි.බි.තෙන්නකෝන් මැතිතුමා** විසින් යෝජනා කළ අතර එම යෝජනාව ඒ.කේ.එම්.අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ගෙනාවේ මම අනූ එකේ පත්වෙලා ආවේ. අපි ආව වැඩපිළිවෙළක් තිබෙනවා. දැන් පළාත් සභාවේ මුදල් ගෙවනවා. මහා අඩුවෙන් සල්ලි එවනවා. ප්‍රාදේශීය සභා ප්‍රතිපාද වලින් මුදල් දෙනවා මේ සියල්ලම මෙතෙක් කල් සභාවට දාලා අනුමත වුණාට පසුව තමයි ඉදිරරියට කරගෙන ගියේ. දැන් මුදල් දමන්නේ කවුද කියලා අපි දන්නේ නැත.අපි අහනවා කවුද මේවා දුන්නේ කියලා මේක හොඳයි පනත සම්බන්ධව දැනුවත් බවක් ලබා ගන්න වැඩපිළිවෙළක් සකස් කරලා පළාත් පාලාන අමාත්‍යාංශයෙන් මම ඉල්ලීමක් කර යෝජනා කර තිබෙන්නේ. අපි සියලු දෙනාම දැනුවත් කරන ලෙස,එතකොට අපි සියලු දෙනාම මෙම වැඩපිළිවෙළක් සහයෝගය දැක්විමට පුළුවන්. අපිට ඇඟිල්ල දික් කරන්න නොහැකිය. වැරද්දක් පෙන්නුවා කියලා. දැන් මේ සභාපතිතුමා සමග ප්‍රශ්න ඇති කරගත්තේ ඇයි?. මුළු දිවයිනටම සාම විනිසුරු කියන එකයි මන්ත්‍රී නිසා ලැබෙන සාම විනිසුරු කියන එකේ වෙනසක් තිබෙනවා. මම මේ යෝජනාව ගෙනාවේ සියලුම මන්ත්‍රීමන්ලාටයි/තුමියන්ලාටයි. බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳයි හැබැයි අපි නවක මන්ත්‍රීවරු ලෙස පත්වෙලා පළාත් පාලන කොමසාරිස්වරයා යටතේ මේ වන විට පුහුණුවකට ලබා ගැනිම සඳහා යටියන්තොට ගිය බවපවසන ලදි.ඔබතුමන්ලා එතකොට පත්වෙලා හිටියේ නැත. මම හිතන්නේ ඔබතුමාට සමහර දේවල් කියලා තේරුම් ගැනීමේ ප්‍රශ්නයක් තියෙනවා. රඹුක්කන ගත කළ කාලය අනුව ඔබතුමා මුදල් එන්නේ කොහෙන් වුනත් පලාත් සභාවෙන් ආවත් අමාත්‍යාංශයෙන් ආවත් කොහෙන් ආවාත් සභාවට දාලා කියලා කතාවක් කීවනේ අපි යෝජනා සම්මත කරගන්න හදනකොට කියනවා මේ පළාත් සභාවෙන් ආපු මුදල් ඇයි ප්‍රාදේශීය සභාවට දාගෙන කතා කරන්නේ කියලා ඔබතුමා අහනවා. ඔබතුමා අපෙන් මුලින් අහපු ප්‍රශ්නයේ පොඩි ගැටලුවක් තියෙනවා. මම හිතන්නේ මේක වයස හන්දා වන දෙයක් කියලයි පළාත් සභාව ක්‍රියාත්මක වුණේ ආණ්ඩුකාරවරයා යටතේ මේ නිලධාරී යටතේ තමයි මේ ව්‍යාපෘති වලට මුදල් එන්නේ.මේවා අපි ආණ්ඩු පටන් ගෙන සභාවට අරගෙන දාපු යෝජනා නොවෙයි. ප්‍රාදේශීය සභාවක් නොතිබුන කාලයේ මන්ත්‍රී මණ්ඩලයක් නොහිටපු කාලයේ ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලයේ ගෙනා යෝජනා අරගෙන යවලා ඒවාට වෙන් වුණ මුදල් කාලයක් ගත වු පසුව සභාවට යෝජනාවක් කරලා ඒ සම්බන්ධව අදහස් දක්වන්න පුළුවන්.අපි පුහුණුවකට ගියා තවත් පුහුණුවකට යමු. ඒක හොඳයි. සභාවේ කාලය සම්බන්ධ ගැටළුවක් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා තෙන්නකෝන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ඇත්තටම ක්‍රියාත්මක වෙලා තිබුණා. නමුත් තෙන්නකෝන් මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රී එම පහුවෙලා තමයි පැමිණියේ. එතුමා ඇතුළු නවක මන්ත්‍රීවරු හතරක් සිටිනවා.ඔවුනටත් එම පුහුණුව අවශ්‍ය නිසා එම යෝජනාව ගෙන එන්නට ඇත්තේ. මෙතන ඉන්න ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීතුමා හැටියට මෙතුමා ව්‍යවස්ථාවන් ගැන හොඳටම දන්නවා. විවාදයක් නැත. නමුත් පසුගිය සභා වාරෙදි ඌ කරුණක් නිසා අපි උනත් දන්නේ සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ඉතා අල්ප ප්‍රමාණයක් දන්නේ. පුහුණුවක් පිළිබඳ කරන යෝජනාව අපි බැහැර නොකර ක්‍රියාත්මක කිරීම වටිනවා. ඒ යෝජනාවට සමගාමීව මම ප්‍රකාශ කරන්න කැමතියි නවක මන්ත්‍රීවරුන් ලෙස පත්ව සිටින මන්ත්‍රීවරු පක්ෂ හෝ විපක්ෂ හෝ වේවා මේ වෙනකන් අපේ සභාවේ සේවය කරන නිලධාරීන් හා සේවකයින් සම්බන්ධ හඳුනා ගැනීමේ අවස්ථාවක් කිසිම අවස්ථාවක සිදුවී නොමැත.එු නිසා මම යෝජනා කරනවා කාර්ය මණ්ඩය හා මන්ත්‍රී මණ්ඩලය අතර සුහද හමුවක් පැවැත් වීම සුදුසු බවට යෝජනා කරනවා. තේ පැන් සංග්‍රහයක් හා දිවා ආහාරයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොහෝම ස්තූතියි ඇත්තටම මන්ත්‍රී වැඩමුළුවක් පටන්ගත්ත වෙලේම පැවැත්වුවා. ඒ සඳහා බොහෝ දෙනෙක් සහභාගි වුණා. ටික දෙනෙක් සහභාගි වුණේ නෑ. ඔබතුමා පැමිණියේ ප්‍රමාද වෙලා. ඒ ගැන සලකා බලා කටයුතු කරමු. ඒ වගේම සමීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි පළාත් පාලන සතිය තුළ නිලධාරීන් හා මන්ත්‍රීවරුන් ගැටීමට අවස්ථාව උදාකර දුන්නා. ඒක සඳහා අලුත් අවස්ථාවක් උදාකර දීමට අපට කාලය නොමැති වෙයි. ඒක නවක මන්ත්‍රීවරු හෝ පරණ මන්ත්‍රීවරු හෝ වේවා ඇවිත් කතා කරන්න මම මේ වසමේ මන්ත්‍රීතුමා කාන්තා මන්ත්‍රීවරියන් ඇවිත් කතා කරලා ගිහින් තියෙනවා. ඉදිරියේදී අපි උත්සාහ කරමු. යනුවෙන් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එස්. ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

(i). දෙල්දෙණිය හප්පෙත්තාවෙල නාරම් මැඩිල්ල මාර්ගයේ ඇති කානුව සංවර්ධනය කිරීම සුදුසු බවට **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එස්. ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා** යෝජනා කළ අතර එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එස්. ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමනි මෙය මහජනතාවගේ ඉල්ලීමක් වන විට මම සභාවාර පහකට වාගේ සම්බන්ධ වී තිබෙනවා. යෝජනා දහයක් සම්මත වෙලා තිබෙනවා. ඒත් කිසිම ප්‍රතිපාදනයක් නැත. ගමේ මිනිසුන් අහනවා කෝ ගෙනාව යෝජනාව කියල ඔබතුමාගේ තීරණය තමයි තීරණය ලේකම්තුමත් සිටිනවා. අපිටත් අපේ ගම්වල මහජනතාවට යම්කිසි දෙයක් කරන්න යම් මුදලක් වෙන්කර දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම අපිට පසුගිය කාලය තුළ යම්කිසි ලිපි ද්‍රව්‍ය ප්‍රමාණයක් දුන්නා. නමුත් ඔබතුමන්ලා එම ලිපද්‍රව්‍ය නවත්වා තිබෙනවා. සභාපතිතුමනි මේ සම්බන්ධ ඔබට ප්‍රකාශ කරනවා හැර අපට වෙනත් කෙනෙකුට ප්‍රකාශ කිරීමෙන් ප්‍රයෝජනයක් නැති බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වරප්‍රසාද අහිමි කරගන්න කියලා මම කොයිම මොහොතකවත් ප්‍රකාශ කරලා නැත. හැබැයි මම පොඩි අත්හදා බැලීමකට ගියා. අපි හිතුවා මන්ත්‍රීවරයෙකුට ලිපි ශීර්ෂයක් ලැබුණහම එයින් වැදගත්කමක් එයි කියලා එය ලබා දුන්නේ නියමාකාරයකට අනුව එය සීමා කරලා නැත. ඔබතුමන් ඉල්ලීමක් කරන්න මෙතුමා ඉල්ලීමක් කරලා මටත් ඒ පිළිබඳ තොරතුරු ලැබී නැත. ඊළඟ සභා වාරයේදී යෝජනාවක් හැටියට ඉදිරිපත් කරලා කරුණු සොයා බලා කටයුතු කරමු.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).II.යථාපරිදි කල් දී නොමැති යෝජනා**

**(ඊ).II.01**

ප්‍රා/සභාවේ ආදාහනාගාරය වෙත 37.5 kg ලිට්රෝ ගෑස් සිලින්ඩර් 06 ක් kegalle Distributors (pvt)Ltd.වෙතින් ද,37.5 kg ලාෆ් ගෑස් සිලින්ඩර් 06 ක් A.K.W.පුෂ්ප කුමාර,ලීලා ස්ටෝර්ස්,රඹුක්කන වෙතින් ද වෙළඳපල පවත්නා මිල ගණන් යටතේ මිල දී ගැනිමට හා ඒ සඳහා ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
වෙළඳපල පවත්නා මිල ගණන් යටතේ මිල දී ගැනිමට හා ඒ සඳහා ගෙවීම් කිරිමට තීරණය විය.

**(ඊ).II.02**

සීසන්ස් වර්ල්ඩ්වයිඩ් පුද්ගලික සමාගම විසින් රඹුක්කන නගරය ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් සවි කර දිමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.මේ සඳහා අනුමැතිය ලබා දීමට හා CCTV කැමරා පද්ධතිය නගරය ආවරණය වන පරිදි සවි කිරිම යෝජනා සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.03**

නව ශ්‍රවණාගාරය සංකීර්ණයේ විදුලි සෝපානය සඳහා මිල ගණන් කැඳවීම ජාතික තරඟකාරි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය යටතේ සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මිල ගණන් කැඳවීම ජාතික තරඟකාරි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය යටතේ සිදු කිරිමට තීරණය විය.

**(ඊ).II.04**

නව ශ්‍රවණාගාරය සංකීර්ණයේ විදුලි සෝපානය සවි කිරිම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත නිලධාරින්ගේ නම් යෝජනා කරන අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.සභාපති - ඉංජී.ජී.එස්.අජිත් මයා } නියෝජ්‍ය ප්‍රධාන ලේකම්

2.කමිටු සාමාජික - ඉංජි.ඩබ්.එම්.කේ.ඊ.වීරසිංහ මයා ඉංජිනේරු සේවා
3. කමිටු සාමාජික - ඉංජි.කේ.ඩබ්.එම්.එස්.ටී.එස්.ආනන්ද මයා

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා ඉහත නිලධාරින්ගේ නම් සුදුසු බවට තීරණය විය.

**(ඊ).II.05**

ඩෙංගු හා බෝවන රෝග මර්ධනය කිරිම පිළිබඳ ප්‍රදර්ශනයක් පැවැත් වීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
2025.10.13 දින පරාක්‍රම ම විද්‍යාලයේදී මේ සඳහා අපේක්ෂිත වියදම් රු20,000 කි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
අපේක්ෂිත වියදම් වන රු20,000 ක මුදල ගෙවීමට තීරණය විය.

**(ඊ).II.06**

වෛද්‍යාධාර ලබාදීම

බී.සෝමාවති, වල් කොටුව වත්ත , රඹුක්කන.

එම්.සී.කමලාවතී, බෙලිගොඩපිටිය, රඹුක්කන.
.(අදාළ සහන පරීක්ෂාව සිදුකරන ලදී.ග්‍රාම නිලධාරි වාර්තාව ලැබී ඇත)

යන අයට බෙහෙත් ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
බී.සෝමාවති මියට හා එම්.සී.කමලාවතී මියට වෛද්‍යාධාර ලබාදීමට තීරණය විය.

**(ඊ).II.07**
තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම වෙනුවෙන් රු.30,000.00 ක මුදල පෝස්ට් මාස්ටර් ජෙනරාල් ගිණුම් අංක 027-1001-29027337 වෙත ගෙවීම සඳහා ගෙවිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත වීය.

තීරණය -
තැපැල් මුද්දර වටිනාකම වන රු.30,000.00 ක පෝස්ට් මාස්ටර් ජෙනරාල් වෙත ගෙවීම් කිරිමට තීරණය විය.

**(ඊ).II.08**
ගබ්බල ගම්වාසීන්ගේ ඉල්ලීම මත නාය යෑමට ලක් වූ ගබ්බල ගමමැද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.2,600,000.00 ක ඇස්තමේන්තුවක් මුදල් ප්‍රතිපාදන අනුමත කරගැනීම සඳහා 2025/07/01 දින ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. නමුත් මේ වන තෙක් ඒ සඳහා මුදල් ප්‍රතිපදන අනුමත වී නොමැති අතර, ඒ සඳහා සභාවේ අරමුදල් යෙදවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත වීය.

තීරණය -
රු.2,600,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.09**

සේනානායක මාවතෙන් ආරම්භව මොට්ටප්පුලිය වත්ත මාර්ගය ගිලා බැස ඇති ස්ථානයට පැති බැම්මක් ඉදිකිරීමේ ඇස්තමේන්තුව රු.1,160,000.00 වේ. ඒ සඳහා අනුමැතියක් ප්‍රජාපාදක සංවිධානයක් හරහා ඉටු කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත වීය.

තීරණය -
රු.1,160,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම හා ප්‍රජාපාදක සංවිධානයක් හරහා ඉටු කර ගැනීමට තීරණය විය.

**(ඊ).II.10**
රඹුක්කන සතිපොළ භූමියේ ඉදිකිරීමට යෝජිත සෙල්ලම් මිදුලෙහි වැටෙහි ඉතිරි කොටස ඉදිකිරීම ව්‍යාපෘතියෙහි කාර්මික නිලධාරී වාර්තාව මත අතරැඳි මුදල වන රු.48,322.68 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත වීය.

තීරණය -
රු.48,322.68 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

**(ඊ).II.11**

දිස්ත්‍රික් සංවර්ධන හා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන් - 2025 යටතේ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලද පහත සඳහන් කර්මාන්ත - 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය යටතේ ප්‍රජා පාදක සංවිධානයක් හරහා ගිවිසුම්ගතව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- ග්‍රාමීය මාර්ග -2025

1. කණුගොල්ල පහළ ගම මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට අබලන් වී ඇති කොටස් සංවර්ධනය කිරීම -රු1000,000.00
2. මංගලගම මොලගොඩ වලකඩයාව කන්ද පාර කෙළවර සංවර්ධනය කිරීම -රු1000,000.00
3. හේනේපොල වත්තේගම ගමමැද මාර්ගය සංවර්ධනය කිරීම -රු1000,000.00
4. කුරෙම්පොළ නිසලතැන්න මාර්ගය සංවර්ධනය කිරීම -රු1000,000.00
5. යෝධගම අයිවරි විලේජ් මාර්ගය සංවර්ධනය කිරීම -රු1000,000.00
6. මීදුම කොරහැත්ත ජයවර්ධන නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම -රු1000,000.00

- දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2025

1. රඹුක්කන කරුණාරත්න ගමමැද පාරේ මිහිඳු මාවත හන්දියේ සිට සේවා පියස දක්වා ඇති කාණු සැකසීම -රු700,000.00

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය යටතේ ප්‍රජා පාදක සංවිධානයක් හරහා ගිවිසුම්ගතව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).II.12**
සෙල්ලම් බඩු සඳහා පුස්තකාලයක් දැමීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -
සෙල්ලම් බඩු සඳහා පුස්තකාලයක් දැමීමට තීරණය විය.

**(ඊ).II.13**
සෙල්ලම් මීදුලේහි භූමිය අලංකාර කර ළමුන් සඳහා භාවිතයට සුදුසු පරිදි විවෘත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත වීය.

තීරණය -

සෙල්ලම් මීදුලේහි භූමිය අලංකාර කර ළමුන් සඳහා භාවිතයට විවෘත කිරිමට තීරණය විය.

**(ඊ).II.14**

කාණු පද්ධතිය පිරිසිදු කිරිම සඳහා ස්කැවේටර් යන්ත්‍රයක් යෙදවීම සම්බන්ධවයි.

- ඉන්ධන පිරවුම්හල අසලින් ආරම්භ වී සතිපොළ භූමියෙන් අවසන් වන කාණුව

දිසානායක මහතාගේ කඩය පිටුපසින් ආරම්භ වන හා පොළභූමියෙන් අවසන් වන කාණුව(වියදම් ඇස්තමේන්තුව -
රු62,800.00)

මේ සඳහා මිල ගණන් කැඳවා ඇති ස්කැවේටර් යන්ත්‍රය යෙදවීමට සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු62,800.00 වියදම් ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

(උ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 10 වරිපනම් බදු | 873,467.97 | 92,600.00 | - | - | 87,500.00 | 1,053,567.97 |
| 20 කුලී | - | 21,029.58 | 239,243.75 | 1,082,156.00 | - | 1,342,429.33 |
| 30 බලපත්‍ර සේවා | 98,414.00 | 627,117.06 | 5,030.00 | - | - | 730,561.06 |
| 40 සේවා සඳහා ගාස්තු | 29,987.38 | 807,645.00 | 237,161.96 | - | 5,285.00 | 1,080,079.34 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | - | - | - | 21,085.00 | 3,779.00 | 24,864.00 |
| 60 වෙනත් ආදායම් | 3,698,090.92 | 63,520.00 | 126,375.00 | - | 840 | 3,888,825.92 |
| 70 වෙනත් ආදායම් | 3,399,026.94 | 1,342,407.86 | 1,273,799.20 | 47,706.40 | 339,832.00 | 6,402,772.40 |
| පුනරාවර්තන ආදායම් එකතුව | 8,098,987.21 | 2,954,319.50 | 1,881,609.91 | 1,150,947.40 | 437,236.00 | 14,523,100.02 |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | - |
| 80 මූලණ ලැබීම් | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව | 8,098,987.21 | 2,954,319.50 | 1,881,609.91 | 1,150,947.40 | 437,236.00 | 14,523,100.02 |
| සේවක ණය | | | | | | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මහජන බැංකුව -සේවක ණය | 112,500.00 | | | | | 112,500.00 |
| ලංකා බැංකුව -සේවක ණය | 364,363.42 | | | | | 364,363.42 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 518,604.18 | | | | | 518,604.18 |
| සමුච්චිත අරමුදල | 1,241,234.89 | | | | | 1,241,234.89 |
| ශීර්ෂ ආදායම | 10,081.76 | | | | | 10,081.76 |
| අත්තිකාරම් | 39,704.64 | | | | | 39,704.64 |
| ආයෝජන ආපසු ලැබීම් | 252,805,875.39 | | | | | 252,805,875.39 |
| වෙනත් ලැබීම් | 7,000.00 | | | | | 7,000.00 |
| මුළු එකතුව | 263,198,351.49 | 2,954,319.50 | 1,881,609.91 | 1,150,947.40 | 437,236.00 | 269,622,464.30 |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 4,512,372.90 | 1,842,410.30 | 1,672,077.91 | 59,633.00 | 487,838.60 | 8,574,332.71 |
| 02 ගමන් වියදම් | 50,369.00 | 9,596.13 | 12,015.43 | - | 4,748.00 | 76,728.56 |
| 03 සැපයුම් හා උපකරණ | 106,146.00 | 410,225.00 | 119,677.50 | - | - | 636,048.50 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 191,987.06 | 183,350.05 | - | - | - | 375,337.11 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 263,263.60 | 146,061.40 | - | 117,612.12 | 16,005.73 | 542,942.85 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | - | - | - |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 11,100.00 | - | - | - | - | 11,100.00 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 44,845.57 | | - | 57,800.00 | | 102,645.57 |
| පුනරාවර්තන වියදම් එකතුව | | | | - | - | - |
| 09 ප්‍රාග්ධන වැය | | | | - | - | - |
| 10 ණය ආපසු ගෙවීම් | | | | - | - | - |
| ප්‍රාග්ධන වැය එකතුව | 5,180,084.13 | 2,591,642.88 | 1,803,770.84 | 235,045.12 | 508,592.33 | 10,319,135.30 |
| පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව | | | | | | |
| සේවක ණය | | | | | | |
| මහජන බැංකුව | - | | | | | - |
| ලංකා බැංකුව | 588,690.00 | | | | | 588,690.00 |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 1,834,613.25 | | | | | 1,834,613.25 |
| විවිධ ණය හිමියෝ | 94,820.94 | | | | | 94,820.94 |
| ගබඩා ණය හිමියෝ | 388,482.98 | | | | | 388,482.98 |
| අත්තිකාරම් | 125,628.79 | | | | | 125,628.79 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | 255,500,000.00 | | | | | 255,500,000.00 |
| වෙනත් ගෙවීම් | 449,600.00 | | | | | 449,600.00 |
| **මුළු එකතුව** | **258,981,835.96** | **0** | **0** | **0** | **0** | **269,300,971.26** |

අවසානය

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 3.00 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.